**වසර 2500 පසු**
**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.**

# සත්‍ය ධර්මය අවදි විය

(දාහතරවන වෙළුම)

# සිතුවිල්ල මම නොවෙයි

(ආන්දෝලනාත්මක හෙළිකිරීමක්)

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදයේ ප්‍රකාශනයකි.

සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.

# ආන්දෝලනාත්මක හෙළිකිරීමක්

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ
විමසීම් Email: buddothpado@gmail.com
Tel +94 703 518 747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ

පරිගණක මුද්‍රණ සැකසුම **වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය **K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2 884701

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com / www.buddothpado.lk

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

1. Buddothpado -
https://youtube.com/@buddothpado

2. Buddothpado Aryanwahanse -
https://youtube.com/@buddothpadaaryanwahanse

3. Buddothpado Unity -
https://youtube.com/@BuddothpadoUnity

4. Buddothpado English -
https://youtube.com/@weeejj

5. Buddothpado Tamil -
https://youtube.com/@buddothpadotamil

6. Buddothpado Zoom Discussion -
https://youtube.com/@Zoom-up2ik

7. Buddothpado Night Discussion -
https://youtube.com/@BuddothpadoNightDiscussi-zj2bk

8. Buddothpado English Zoom Discussion -
https://youtube.com/@BuddothpadoEnglishZoom

9. Buddothpado Radio Damma Discussion -
https://youtube.com/@BuddothpadoRDD

10. Buddothpado TV Damma Desana -
https://youtube.com/@BuddothpadoTVdammaDesana

# නිවන් මඟ යායුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්විදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිලිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ) සත්‍යඤාණ අවබෝධය
2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)

   2.1 කෘත්‍යඤාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම

   2.2 කෘතක්ඤාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

1. **පූර්ව භාග ප්‍රතිපදාව (සත්‍යඤාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කල්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී**

   බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඤාණය = සත්‍යඤ්ඤාණය)

   - සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
   - සිත මායාවක් බව අවබෝධකරගැනීම සිත යනු අරමුණම බව දැනගැනීම
   - අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
   - ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම අරමුණම ආත්මය බව දැකීම
   - ශූන්‍යතා අවබෝධය
   - ත්‍රිවිද්‍ය දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඤාණය, චුතූපපාත ඤාණය, ආසවක්‍ෂයඤාණය)
     (සිත = අරමුණ = ආත්මය)

   1.1 කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසාදැන ගැනීම

   1.2 නැවත නැවත සද්ධර්මශ්‍රවනය

   1.3 යෝනිසෝමනසිකාරය

   1.4 ධම්මානුධම්ම ප්‍රතිපදාව
   **ශ්‍රාවකයා උට්ඨාන වීරියෙන් කලයුතු දෙයින් වැඩි ප්‍ර තිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.**

**බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල් කැටයක පමණ දෙයකි.**

- සක්කාය දිට්ඨි ප්‍රහානය මෙතැනදී සිදුවේ.
- ශ්‍රාවකයා ආර්‍ය භූමියට පිවිසේ.

2. අපරභාග ප්‍රතිපදාව

2.1. **කෘත්‍යඥාණය** - අසාදැනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම - (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

2.1.1. **අරමුණෙහි සත්‍ය දැකීම**; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම(යථාභූත ඥාණය = යෝනිසෝ මනසිකාරය)

2.1.2. **අරමුණෙහි සත්‍ය දැක මිදීම**
අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම
ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම
සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

2.1.3. **ත්‍රි විද්‍ය ප්‍රායෝගිකව අත්දැකීම** (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූපපාත ඥාණය, ආසවක්‍ඛය ඥාණය)

2.2. **කෘතක්ඥාණය (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොභාදහමේ අනාවරනයක් පමනි. ඥාණයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැඟලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති**

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශූන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිර්ජීවෝ ශූන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජක්ඛ බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක්

නැති තැන චේතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශූන්‍යත, අප්ප්‍රනිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤානස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කලයාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මේ උතුම් සත්කාරය සඳහා අර්ථයෙන්, ධර්මයෙන්
සියළුම ආකාරයෙන් උදව් උපකාර කළා වූ
සියළුම දනන් හට, මෙම ධර්ම දානය තුළින්
ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය
මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම
ඒ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ කරගෙන සංසාර දුකින් මිදී
නිවනින් ම සැනසීම ලබන්නට
හේතු වේවා !

# පිදුම



"මහා චතුරක නිදිගත්
ගමක් ගසා ගෙන යන්නා සේ,
මරුවා පස්කම් නැමැති
මල්ම රැස් කරණ
එහිම ඇලුණු සිත් ඇති
මිනිසා ඇද ගෙන යයි
මිනිසා වසඟ කර ගනී.
"අඥබාල මිනිසුන් අතර
බුද්ධ ශ්‍රාවකයා නුවණින් බබළයි"
ඔබ සැමත් සත්‍යයට අවදිව
සිහියෙන් නුවණින් නිවැරදිව සිතේ
මායාව අවබෝධ කොට, සංසාර
සාගරය තරණය කර
සදා අමරණීය වන්න
"බුද්ධෝත්පාදයෙන් විවර වූ"
ශ්‍රී සද්ධර්ම නිවනටම
උපනිශ්‍රය වේවා" !!!

# පටුන


| | | |
|---|---|---|
| 01 | ඔබමයි මා, මමමයි ඔබ | 13 - 46 |
| 02 | නුවණින් විමසන්නාට ලෝකය මායාවක් | 47 - 66 |
| 03 | ඔබේ හීන ලෝකය, ඔබේ ගති පුරුදුයි | 67 - 94 |

# 01

# ඔබමයි මා, මමමයි ඔබ

**උපාසිකාව :** ආර්යයන් වහන්ස, ඒ මොහොතෙ පොඩි සියුම් තිගැස්මක් තිබුණා. ඒ තිගැස්මත් එක්ක මට සිහියට ලක්වුනේ ඇත්තටම අපේ මේ ඇහෙන් තෝරාගත් දේවල් බලන්න එතරම් පෙලඹීමක් නැති වුණාත් ඇහැට කොච්චර ආදරෙයි ද කියලා. ඇහැට කොච්චර කැමති ද එහෙම නැත්නම් ඇහැ රැක ගන්නවද කියන එක. දැන් ඊළඟ මොහොතෙ මගේ ඇස් අන්ධ වෙනව නම් ඒකට මම සූදානම් ද කියන එක. ඕනිම ආයතනයක් ඊළඟ මොහොතෙ නැති වෙලා යනව කියන එක දැනගත්තම ඒකට මම සූදානම් ද කියන එක ගැන අදහසක් ආවා. ඒ එක්කම ආර්යයන් වහන්ස මට ආයෙත් අහන්න අවශ්‍යතාවයක් ඇති වුණා මේ ආරෝපණය කියන එක දැන් අපිට බිත්තිය මල පුතා එහෙම කියල ආවෙ නැතත් අපිට නිකං රූප සටහන විතරක් වුණාත් එතනත් පොඩි ආරෝපණයක් තියෙනව නේද කියල. පොඩි හරි ආරෝපණයක් නැත්නං අපිට ඒකට නන්දියක් ඇති වෙන්නෙ නෑ නේද?

**ආර්යන් වහන්සේ :** ඔව්, ඒක ඇත්ත. ඒ කියන්නෙ මෙතන මේ මුළු කතාවම වේගෙට සකස් වෙන එකක්නෙ. ස්පාක් වේගෙ කියන්නෙ, ප්‍රසාද වේගෙ කියන්නෙ ඇත්තටම කම්පන වේගයක්. කම්පන වේගයක් තමයි අපි කිව්වේ සුදු කොළේ තිතක් තියල ඒක එහාට මෙහාට කරන උපමාවෙන් අපි කිව්වෙ මේක කම්පනයක් කියලා. කම්පනය කියන එක බුදුන් වහන්සේත් පෙන්නනවා මේක "උප්පාද වය ධම්මිනෝ" කියන එක. උප්පාද වය ධම්මිනෝ කියන්නෙ පවතින එකක් නෙවෙයි. එතකොට ඒක බුදුන් වහන්සේ "පලෝක ධම්මං" කියන කොටත් අපට පැහැදිලි වෙනවා බුදුන් වහන්සේ මොකක්ද මේ කියන්න උත්සහ කරන්නේ. ඇස

බිඳෙන සුලු යයි ලෝකයයි කියන එක. නැත්තං "සලායතන ලෝකෝ ලෝකෝ" කියන එක. මේ ආයතනවලට මැවෙන ලෝකයක්. ඒ කියන්නෙ මේ රුප්පනයට මැවෙන ලෝකයක්. "රුප්පන්තිකෝ ආයුසෝ රූපං වදේති" මේකෙ හැම පැත්තෙන්ම පේනව ස්පාක් කියන වචනය. නූතන දරුවෙකුට මේක තේරෙනවා. ස්පාක් වෙන වේගයක්, කම්පන වේගයක් තරංග, කොන්ටම් හැම එකකින් ම මේක මේ විග්‍රහයට ළඟයි. එතකොට මේක හොඳටම තේරෙනවා.

දැන් අපි ගත්තොත් කම්පන වේගයක් කම්පනය කරන කොට බලයක් ඇති වෙන එකයි මේකෙ තියෙන්නෙ. මේකෙ සම්පූර්ණයෙන්ම ඒක පේනවා. මොකද අපිට නිතර නිතර එකම, දැන් ප්‍රොජෙක්ටරයක එක දිගට දිගට පිංතූර ගොඩක් යනකොට චිත්‍රපටිය පේනවා වගේ. එහෙම නැත්නම් එකම සිංදුව නැවත නැවත අහන කොට ඒක නිකං ප්‍රතිකම්පනය වෙනව වගේ. මේ මුළු කතාවම තියෙන්නෙ කම්පන ස්වභාවයක් මතයි. එතකොට ඒකම තමයි සංඛාරා සංකතං කියන්නෙ සකස් වෙනවා කියන එක සංඛාරා කියන එක. එතකොට වේගෙට සකස් වෙනවා. ස්පාක් වෙන වේගෙට ආලෝක කිරණ වැටෙන්නෙ. එතකොට මේ වේගෙය මත තව දෙයක් සිද්ධ වෙනවා. වේගෙට එනව ආරෝපණ බලයකුත්. මේක තමයි අපි කිවුවේ ස්ඵටිකයක්, ඝනයක්, පෘථිවියක්, පෘථිවිය කොහොමද හැදෙන්නෙ. අර 'බිග් බෑන්' කියන තියරි එක බැලුවත් අපිට පේනවා. වේගයක් කම්පනයක්, වේගෙ මත කැරකීමක් දූවිල්ලක්, ඩාක් මැටස් කියන අංශු ස්වභාවයක් අර විශ්වයම එකම ස්වභාවයට කැරකිල කැරකිල ස්ඵටිකයක්, ඝනයක් පෘථිවියක් හැදෙන ආකාරය. අන්න ඒ වගේ වේගෙට දැන් අපි දූවිල්ලක් දිහා බලාන ඉන්න කොට දූවිල්ල කැරකිල කැරකිල කැරකිල ඝනීභවනය වෙලා අර ඝන ස්වභාවයක් හැදෙනවා. ඒ ඝන ස්වභාවය හැදෙන්නෙ වේගයක් නිසා.

ආකර්ෂණ බලයක් නිසයි අංශු එකතු වෙන්නෙ. අන්න ඒ ආකර්ෂණ බලය අපි දැන් ගත්තොත් මේකෙ තියෙන චිත්තා රෝපණය අපි ගුරුත්වාකර්ෂණය කියල උත්තර ධ්‍රැවය දක්ෂිණ ධ්‍රැවය කියල ආකර්ෂණ බලයකින් මෙතන ශක්තියක් ජෙනරේට් වෙන ආකාරය හැම දේකම තියෙනවා. දැන් මේකම තියෙනවා අපි කතා කරන චිත්තාරෝපණයේ.

මේ සිත කියන එකත් සෙන්සස්වල ස්පාක් වෙන වේගෙට තියෙනව කියල දැනෙන ස්වභාවයක්. ඒකෙ තියෙනව වගේ දැනෙන ස්වභාවය එන්නෙ ආරෝපණ බලයක් නිසා. එතකොට ඔබතුමිය කියපු එක හරි. පේන දේත් ඇහෙන දේත් දැනෙන හැම තැනකම තියෙනව දැනෙන 'නන්දි' ස්වභාවයක්. ඒක හරි. ඒ ප්‍රශ්නය නිවැරදියි. ඇත්තටම ඒක ගැඹුරු තැනකින් ස්පර්ශ කරන කෙනෙකුට විතරයි ඕක හසුවෙන්නෙ. බොහොම වටිනව ඒ ප්‍රශ්නය. මේ වගේ ගැඹුරු තැනින් සාකච්ඡා කරනවා නම් ගොඩක් අයට මේක වටිනවා. ඔබ තුමියට තවත් තියෙනව ද ඒ වගේ දැනගන්න කාරණා. ගොඩක් ගැඹුරට ගිය කෙනෙකුට තමා මේ වගේ ප්‍රශ්න එන්නේ. ඒක හරි. සියුම් තැන පේනවා. පේනකොට මේක ධර්මයට ගළපාගන්න එක විතරයි ගොඩක් වටිනවා මේ දහම් කතිකාවත.

**උපාසිකාව :** එහෙමයි ආර්යයන් වහන්ස. ඊයෙ පෙරේදා සූම් මීටින් එක අහගෙන ඉන්න කොට මට පෙනිච්ච එක්ක තමයි මේ දැන් අර එක අම්මා කෙනෙක් කතා කරා හරිම කලබලෙන් බොහොම සංවේදීව. මට ඒ වෙලාවෙත් හිතිච්ච දෙයක් තමයි මේක සංවේදි වෙලා යන්න පුළුවන් ගමනක් නෙවෙයි කියලා. එහෙම නැත්නම් සිතුවිලිවලින් යන්න පුළුවන් ගමනකුත් නෙවෙයි මේක. ඒක හින්ද කලබල වෙන්න එපා කියන එක මට මතක් කරන්න හිතුණා.

**ආර්යයන් වහන්සේ :** ඔව්, ඒක ඇත්ත. ඒක හරි. මේක ඇවිල්ල නුවණටයි හසුවෙන්නෙ. මේ ධර්මය මහා ප්‍රඥාවටයි හසුවෙන්නෙ. නුවණ කියන්නෙ කලබලයක් නෙවෙයි. නුවණ කියන්නේ **මහා තීක්ෂණ නුවණක්, තීක්ෂණ නුවණක් කියන්නෙ අපේ මේක 'ධම්ම චක්ඛුසටයි' හසුවෙන්නෙ. ඇත්තටම ඒකෙ තියෙන්නෙ බ්‍රහ්ම ස්වභාවයක්. 'ඛන්ති' පරමං තපෝ කියන ක්‍රමයට තියෙන්නෙ. ඒ කියන්නෙ මෙතන තියෙන්නෙ ඇත්තටම අපි කියන්නෙ කලබල නොවුණ නිශ්චල ස්වභාවය ප්‍රභාශ්වර ස්වභාවය තමයි බ්‍රහ්ම ස්වභාවය කියල.** ඒ තරම් සියුම් ස්වභාවයක් ග්‍රහණය කරන කොට අපිට අර විසුරුණු ස්වභාවය තැන්පත් වෙන්න ඕනි. දැන් අපි කතා කරනවනෙ සමථය වචන කොට විතක්ක විචාර ප්‍රීතිසුඛ ඒකාග්‍රතා කියල මේ සිත තැන්පත් වන ආකාරය. එතකොට ඒකෙත් තියෙන්නෙ මේ වේගෙට සකස් වන කම්පන ස්වභාවය ඇත්තටම වේගය නිවන

ස්වභාවයක් තමයි ඔය විතක්ක විචාර සංසිඳුන ප්‍රීතිසුඛ ඒකාග්‍රතාව කියන්නෙ. ඔය ස්වභාවයටම තමයි ඇත්තට ම සෙන්සස්වලින් එන ස්පාක්වලින් චිත්ත ස්වභාවය දෙයක් කියල හැදිලා ඒකෙන් තමයි අපිට කලබලය ඇති කරන්නෙ. සිතුවිලි ස්වභාවයෙනුත් ඒ කියන්නෙ මනෝ ස්වභාවයෙනුත් තියෙනව කලබලයක්. එතකොට ඒ ස්වභාවය නිවෙන්නෙත් අර මේකෙ තියෙන්නෙ අනුසෝතය නෙවෙයි පටිසෝතය කියන ස්වභාවය. අනුසෝතය වේගය මත සකස් වන එකක්. පටිසෝතය හැම තිස්සෙම අර වේගය අඩු වෙන තැනයි සකස් වෙන්නෙ. ඒකත් හරි. ඒ අදහස හරි.

ඇත්තටම කලබල වෙන් නැතුව බොහොම තැන්පත්ව බොහොම හිමින් මේ කියන සියුම් කාරණා මෙනෙහි කරනවා නම් ඒක අවබෝධ වන ප්‍රවණතාව වැඩියි. ඒ ගැඹුරු ඥානය අවදි වෙනවා. ගැඹුරු ඥානයට හසුවෙනවා. මෙතන ආත්මයක් නැති බව. සත්වයෙක් පුද්ගලයෙක් නැති බව, දෙයක් නැති බව ඒ ස්වභාවයට හසු වෙනවා. එහෙම හසුවුණොත් ඒවා ඒකට තියෙන හරය නැතිවෙනවා. වටිනාකම නැති වෙනවා. එතනම තමයි ඡන්දරාගය දුරුවෙන ස්වභාවය. එතනම තමයි අපේ රාග ද්වේශ මෝහ කෙලෙස් ගින්න නිවෙන ස්වභාවය. ඇත්තට ම කෙලෙස් ගින්න තියෙන්නෙ අර කලබලයක් නිසයි වේගය නිසයි. ඇත්තටම කෙලෙස් ගින්න තියෙන්නෙ අර කලබලය නිවෙන තැන වේගය අඩුවෙන තැනම තමයි ඒ කියපු කාරණාව හරියටම හරි. ඒක ධර්මතාවය තුළ අපිට දකින්න ලැබෙන දෙයක්. මේ කම්පන ස්වභාවය අකම්පිත ස්වභාවයක් කරා තමයි නිවනෙදි අපිට දැනෙන්නෙ. එතකොට රාග ද්වේශ මෝහ කෙලෙස් සන්සිදෙනවා කියන්නෙ එවැනි ස්වභාවයක්ම තමයි. අද ගැඹුරු දහම් කාරණා ටිකක් මතුවෙනවා. හැමෝටම වටිනවා ඒ අදහස්. හොඳයි තවත් ඒ වගේ තියෙනවද ගැඹුරු තැනින් අහන්න කාරණා.

***උපාසිකාව :*** ආර්යන් වහන්ස, මට මතක් කරන හිතුණා, දැන් මෙතන ඉන්නෙ මග වඩන කට්ටියක්නෙ. එතකොට මේ මග වඩන කට්ටියට කියන්න මේ විඤ්ඤාණ මායාවට නම් අහුවෙන්න එපා කියල. මොකද, සමහර වෙලාවට විඤ්ඤාණ මායාව දෙනව දැන් ඔන්න තේරුණා කියලා. තේරුණා කියල කියන්නෙත් විඤ්ඤාණ මායාවම නම් ඒක

විශ්වාස කරන්නත් එපා. අනිත් එක ඒක තේරුමක් නෑ කියල කියන්නෙත් විඤ්ඤාණ මායාව නම් ඒකත් විශ්වාස කරන්න එපා. මේක අහගෙන යන්න. අහගෙන යනකොට හැබැයි ප්‍රතිකම්පනයට කොහොමත් අපි අර අම්මා තාත්තා මල ඔක්කොම ඉගෙන ගත්තා වගේම පාට ඉගෙන ගත්තා වගේම තමයි මේකත්. මේකත් ප්‍රතිකම්පනයක් විදිහට අපට කියන්න පුළුවන් වෙනවා. නමුත් ඇත්තට ම කණ්ණාඩියේ කවුරුත් නෑ කියන ඒ දැනීම එහෙම නැත්නම් ඒ සිහිය කියන එක මේ විඤ්ඤාණ මායාව දෙන සිතුවිලිවලින් ගන්න පුළුවන් එකක් නෙවෙයි. ඒ හින්ද ඒ සිතුවිලිවලින් කිවුවට ආ මට තේරුණා කියල ඒක ඔස්සේ යන්නත් එපා. තේරුණේ නෑ කිවුවට ඒක ඔස්සේ යන්නත් එපා.

**ආර්යයන් වහන්සේ :** ඒක හරි ඒක හරි විඤ්ඤාණ මායාව හැම තිස්සෙම අපිට දෙන්නෙ සිතුවිල්ලක් හදලා. සිතුවිල්ලෙන් හදලා දෙනකොට එයා දෙන්නෙ අර ශබ්ද වර්ණ වලින්ම අර නාම රූපවලින් ම එන එකක්. එතකොට නාම රූප හැම තිස්සෙම දෙන්නෙ මෙතන සෙන්සස් සිස්ටම් එකත් තියෙන්නෙ. හැම තිස්සෙම සංඥාවක් කියන්නෙ ස්පාක් එකක්. **ස්පාක් එකෙන් දෙන්නෙ මේක මේකයි, මේක මේකයි... ඔන්න ඔය විදිහට සෙන්සස්වලින් දෙන්නෙ අර හැම තිස්සෙම සංඥාවක් දෙන්නෙ. ඒ සංඥාව ගොඩක් වෙලාවට මිරිගුවක් වෙනවා. යථාර්ථය නම් දෙයක් නෑ. හැබැයි විඤ්ඤාණය හැම තිස්සෙම දෙයක් දෙනවා. නිවනත් දෙයක් කරල දෙනවා. එතකොට තේරුණා කියලත් දෙනවා. තේරුණේ නෑ කියල දේකුත් දෙනවා. හැබැයි මේකෙ කතාව තියෙන්නෙ විඤ්ඤාණයෙන් දෙයක් දුන්නට මේක පරිවර්තනය වෙන්නෙ දෙයක් නැති දෙයක් අවබෝධ කර ගන්න එක.** දෙයක් නැති දෙයක් අවබෝධ කරගන්න හැම තිස්සෙම විඤ්ඤාණය ඒකත් දෙයක් කරලයි දෙන්නෙ. මෙන්න මේ නිසා තමයි බොහොම පරිස්සම් වෙන්න ඕනි. විඤ්ඤාණය නිවන් දැක්කයි කියලත් දෙනවා. විඤ්ඤාණයෙන් මේක තමයි නිවන කියලත් දෙනවා. මේක තමයි අලමරියඤාණදර්ශනය කියලත් දෙනවා. මේ දැන් මොකුත් නෑනෙ දැන් නිවන් දැක්කනෙ, මේ තියෙන්නෙ ශූන්‍යතාවය. ඔක්කොම දෙනවා. හැබැයි ඔක්කොම විඤ්ඤාණ මායාව.

ඔබ හිතල ගන්න හැම දේම විඤ්ඤාණ මායාව. "සබ්බ පාපස්ස අකරණං" කියන තැනටයි වැටෙන්නෙ. හැබැයි මේ "කුසලස්ස උප

සම්පදා" කියන්නේ විඤ්ඤාණ මායාවක් නෙවෙයි ඕක සිහියට හසුවෙන්නෙ. සිහියට හසුවෙනවා මේ දෙයක් නොවන ස්වභාවය. ඔබ හිතලා දෙයක් නෑ කියලා දැනුනොත් ඒකත් විඤ්ඤාණ මායාව. හැබැයි ඔබ හිතන්නෙත් නැති මොහොතක ඔබට දැනුනොත් එවැනි ස්වභාවයක් අත් දකිනව නම් ඒ තමයි සැබෑම මිදීමේ අත්දැකීම. මේක හිතල ලබන්න බෑ. ඔබ හිතලා ලබන්න හදන හැම මොහොතෙම ඔබට ලැබෙන්නෙ දෙයක්. රැවටෙන්න එපා කිවුවෙ විශේෂයෙන් ම අලමරියඤාණ දර්ශනයට. බොහෝ අය අපට කියනවා මේ තියනවා හැබැයි ඒකෙන් මිදුණ ස්වභාවයක් අපිත් අත්දැක්කා කියලා. ඔබ මේ දේශනා අහනවා. එතකොට ඔබ දන්නවා, මේ හැම දෙයින්ම මිදුන ස්වභාවයක් අත්දකිනවා කියලා. හැබැයි මේක ඔබ හිතනවා, හිතන කොට ඔබට එහෙම එකක් මැවෙනවා ඔබ හිතනවා ඒක තමයි ඒක කියලා. නෑ ඒක නෙවෙයි ඒක.

මේ අලමරියඤාණ දර්ශනය අති ගැඹුරුයි මේක සවිතක්ක ස්වභාවයෙන්, විතක්ක ස්වභාවය කොහොමත් බාහිර ඇත්ත වෙලා. සවිතක්ක ස්වභාවය එහෙම දෙයක් නෑ කියල හිතන එක මතුවෙලා. හැබැයි අවිතක්ක ස්වභාවය කියන්නෙ එහෙම හිතන්නෙත් නැතුව මතුවෙන ස්වභාවයක් ඒ අත්දැකීම වෙනස්ම අත්දැකීමක්. ඒක ඔබට ලැබුණ දවසටයි දැනෙන්නේ ඔබ හීනෙන් අවදි වුණා වගේ කියලා. එතකොට ඔබත් නෑ. මේකෙ තියෙන විශේෂත්වය තමයි ඔබට ඔබ නැති වෙන තැනක් එනවා. ශූන්‍යතාවය තුළ ඔබ ඉන්නවා නම් එතනත් තියෙන්නෙ විඤ්ඤාණ මායාවක්. ඔබ ඔය අලමරියඤාන දර්ශනය දකින කෙනෙක් ඉන්නව නම් එතනත් තියෙන්නෙ විඤ්ඤාණ මායාවක්. හැබැයි ඔබ නැති වෙන තැනක් එනවා. ඔබට ඒක සිහියට හසු වෙනවා. අන්න ඒ ඤානයට හසුවෙනව ඔබට ඔබ නැති වෙන ස්වභාවයක්. ඒ අත්දැකීම අති විශිෂ්ටයි. ඔබ එවැනි අභ්‍යන්තර පරිවර්තනයකට ලක් වුනොත් ඔබට දැනේවි සැබෑම අවදියට ඔබ පත් වූ බව. ඒ තමයි ක්‍ෂණ සම්පත්තිය බුද්ධක්‍ෂණය ඒක අති ගැඹුරුයි. අවබෝධයකින් තොරව එක අත්දැකීමේ හැකියාව අපිට නම් දැනෙන්නෙ නෑ. තවත් එවැනි ගැඹුරු තැනකින් ප්‍රශ්න අහන්න තියෙනවද? මෙතැන වැදගත් වෙන්නෙ තමන්ට දැනෙන දේ අවංකව කතා කිරීමයි. එතනයි නිර්මල බුදුදහම හමුවෙන්නෙ.

**උපාසිකාව :** එහෙමයි, ආර්යයන් වහන්ස. අර මාර්ගයයි ඵලයයි පටලවගන්න එක. මාර්ගයේ සිටින කෙනෙකුට දුක හිතෙන්න පුළුවන් අනිත් අය කතා කරන දේ අහගෙන ඉඳලා ආ... නෑ එහෙනම් ඒක නෑනෙ දැන්. එහෙම නෑනෙ කියලා. නමුත් මේක අහන හැමෝම ඉන්නෙ මාර්ගයක. ඒක හින්ද කිසිම දුක් වෙන්නවත් කලබල වෙන්නවත් දෙයක් නෑ. මොකද මාර්ගයක් නැත්තං මෙතන ඉන්නෙ නෑනෙ. නිකං අහගෙන හිටියට මේක තේරෙන්නෙත් මාර්ගයේ ඉන්න හින්ද තමයි. කවුරු හරි මේක අහගෙන ඉන්නෙ. මාර්ගයක ඉන්නව කියන්නෙ එතන සව්චාර තියෙනවා. ඒ කියන්නෙ හිතනවා. හිතල හැම තිස්සෙම පොඩි ගවේෂණයක ඉන්නෙ. ඒ කියන්නෙ මගේ ආත්ම සංඥාව කොතනද තිබ්බෙ කියල. නමුත් එතන අර පොඩි ප්‍රශ්නයකට තියෙන්නෙ මෙතන ආත්ම දෘෂ්ටිය හරියට ටච් උනේ නැත්නම් ආත්ම සංඥාව හොයල වැඩක් නැති වෙනවා. එතකොට පොඩි පසුබෑමක් එතනව කාට හරි මොකද එයා මුල ඉඳලම ආත්ම සංඥාව හොයනවා. ඒ කියන්නෙ මාර්ගයේ වැඩ කරන්න හදනවා. නමුත් තාම ඒ දෘෂ්ටිය තියාගෙන. එහෙම දේවල් හොඳට අඳුරගන්න බැරි ප්‍රශ්නයක් එනවා. මොකද එක දිගටම බණ අහනකොට ඔක්කොම තේරුණා වගේ හිතෙනවා. තේරුණා වගේ හිතුණ හින්ද මාර්ගයට එවෙනවා. නමුත් අර පොඩි පොඩි පසුබෑම් එනවා. ඒ පසුබෑම් ආවට බය වෙන්න ඕනි නෑ. කවුරු හරි මේක තේරුම් ගන්න උත්සාහ ගන්නව කියන්නෙම මහ විශිෂ්ට දෙයක්. හොඳටම පෘතග්ජන කෙනෙකුට මේක අහගෙන ඉන්නවත් බෑ. එහෙම සංයමයක් ඇති වෙන්නෙ නෑ.

**ආර්යයන් වහන්සේ :** ඔව් ඒක හරි. මෙතන කලබල වෙන්නෙ ගොඩක් වෙලාවට මාර්ගයේ ගමන් කරන යෝගාවචරයන් අජේන් අහනවා නිබ්බිදාව ගැන. ඇත්තටම නිබ්බිදාව කියන්නෙ කලකිරීම නෙවෙයි. අපි ඔය වචන නිර්වචනය කරන්නෙ ඔය විදිහට කලකිරීම කියල තමයි. නමුත් මේකේ තියෙනවා චූන් වෙන එකක් අනුසෝතය තුළ නන්දිය කියන එක. "යාරූපෙ නන්දි - තදුපාදානං භවෝ" කියන කොට දෙයක් වගේ දැනෙන්නෙ හැම තිස්සේම අර **අභිසංකරණය කියන්නෙ ස්පාක් වෙන වේගෙට හැම තිස්සෙම දෙනවා නිරූපණයක්. අර වේගයක් තුළ සකස් වෙනවා කියන්නෙ හැම තිස්සෙම ඒක පැවැත්මක් පෙන්නනවා. තියෙනවා. තියෙනවා කියලා. ඒ විතරක් නෙවෙයි වෙනසකුත්**

**ඒ කියන්නෙ විපරිනාමෙකුත් පෙන්නනවා. "සික්කා එකා උප්පජ්ජති - සික්කා එකා නිරුජ්ජති" ඒ කියන්නෙ ඒක ස්පාක් එකක් වෙලා අවසන් වෙනකොට ඒ ස්පාක් එකත් වෙනස් වෙලා කියන ස්වරූපයක් බුදුන් වහන්සේ පෙන්නනවා.** ඒකම අභිසංකරණය කියල පෙන්නනවා. ඒක තමයි ප්‍රාණවත් ගතිය මේ පණ තියෙන ගතිය කියලත් පෙන්නනවා. දැන් දවල්ට කාපු එක රෑට කන්න බැරි ඔය නිසයි. ඔය නිසයි එකම ඇඳුම ආය ආය අඳින්න බැරි. ඔය නිසයි එකම දේ නැවත බලන කොට එපා වෙන්නෙ. ඒ නිසා වෙනසක් හොයනවා. මේ අපේ සෙන්සස්වලයි ඕක තියෙන්නෙ. මේ ප්‍රසාදවල මේ ස්පාක් එකේ තියෙන්නේ. දැන් නිවන මග යන කෙනාටත් ඕක වෙනවා. දැන් නිවන් මග යන කෙනා එක දිගටම දෙයක් කරන කොට නෑ නෑ මේක හරියන්නෙ නෑ. වෙන එකක් ඕනි. මේ බණ හරියන්නෙ නෑ වෙන බණක් ඕනි කියල ඔන්න ඔය වගේ විඤ්ඤාණ මායාවෙන් දෙනව පුදුමාකාර මායාවක් මවල දෙනවා හිතා ගන්න බැරි වෙන්න. ඇත්තටම කිවුවොත් මේක තමයි බුදුන් වහන්සේ පෙන්නන 'පටිසංඛාඥානය' ඇත්තටම  මේක රැවටෙන තැනක්.

කල්‍යාණ මිත්‍රයාගේ පණිවිඩය මේක ආත්මයක් නැති අනාත්ම ධර්මයක් බව හරියටම දෙනවා. කල්‍යාණ මිත්‍රයා ප්‍රත්‍යක්ෂ ඥානයෙන්නේ මේක දේශනා කරන්නෙ. මේ බුදුන් වහන්සේ තමන්ට ප්‍රත්‍යක්ෂ දේ හෙළි කරන්නෙ. අපි වුණත් මේ ප්‍රත්‍යක්ෂ ධර්මයක් ලෝකෙට දේශනා කරන්නෙ. අපේ අභ්‍යන්තර පරිවර්තනයයි ලෝකෙට හෙළි කරන්නෙ. එතකොට අපි දන්නවා මෙතන මොකක්ද වෙන්නෙ කියලා. මේ ධර්මය ප්‍රත්‍යක්ෂයක් නැතුව ඔය සූත්‍රයක් බැලුවයි කියල දේශනා කරන්න බෑ. මේක සූත්‍රයේ තියෙන දේ. අභ්‍යන්තරයෙන් ඒ ස්වභාවය අත් දැකල ඒ අත්දැකීමක් ඇතුව ඒක ප්‍රායෝගික වෙලා ඒ තුළ නිට්ටාවක් ඇති වෙලා තමයි එයා තව කෙනෙකුට ප්‍රත්‍යක්ෂයක් ඕන මේ හෙළි කරන්න ඕනි. එහෙම නැත්නම් මේක විශ්වාසයක් ඇදහිල්ලක් වෙනවනෙ. ඒ කියන දේවල් හරියන්නෙ නෑ. කවදාවත් මේ ධර්මය දේශනා කරන්න බෑ ඔය හිතලුවට හිතල. බණ කියල කොපි කරල බණ කියල එහෙම නැත්නම් ඔය පොතක් බලල බණ කියල එහෙම හරියන්නෙ නෑ. බුදුන් වහන්සේ මේක 'මහෝපදේශනා' සූත්‍රයේ දේශනා කරනවා ඇහුවත් පිළිගන්න එපා, දැක්කත් පිළිගන්න

එපා කිවුවත් පිළිගන්න එපා, 'මාපිටකසම්ප්‍රදායේ' පොතේ තියෙනව කිව්වත් පිළිගන්න එපා. මොකක්ද මේ කියන්නේ **ධර්මයට විනයට ගලපන්න. මොකක්ද මේ ධර්මය කියන්නෙ දෙයක් නැති වෙන්න ඕන. දෙයක් තියෙන්න බෑ ආත්මයක් තියෙන්න බෑ. ඔය කියන බණක ආත්ම දෘෂ්ටියක් ආත්ම සංඥාවක් මතු වෙන්න බෑ. ඒකයි ධර්මයට ගලපනවා කියන්නේ. විනයට ගලපන්නෙ කොහොමද? රාග ද්වේශ මෝහ විනයට ගැළපෙන්න ඕනි. එතකොට මෙතන ඉලිප්පීමක්, නිකං තව චූන් වෙන ගතියක් තියෙන්න බෑ. එතකොට මෙතන දෙයක් තියෙන්නත් බෑ.** පරම සත්‍යයක් මේ කියන්නෙ. මේ මාර්ගයේ යන යෝගාවචරයෙක් විශාල රැකවරණයක් ලබනවා මේ වචන එක්කලා. එතුමිය දියුණු මට්ටමින් කටයුතු කරන් නැත්තං මේ ප්‍රශ්න අහන්න බෑ. මේක බොරු කරල අහන්න බෑ. අභ්‍යන්තරයේ මාර්ගයේ යන කෙනෙක් තමයි දන්නෙ නිබ්බිදාව මොකක්ද කියලා.

නිබ්බිදාව කියන්නෙ චූන් වෙන ගතියයි නැති වෙන්නෙ. **ඔබට තියෙනවා පෘතග්ජන භූමිය තුළ ඔය කාලා බීලා සැප විඳින ගතිය. දිව පිනවනවා, ඇස පිනවනවා, කය පිනවනවා, නාසය පිනවනවා, කණ පිනවනවා. මොනවද ඔබ කරන්නෙ. කොහෙද ඔබ ඉන්නෙ. ඔය සෙන්සන් ටික පිනවන එක ඔබද? ඔය දිව පිනවන එක ඔබද? දිව ඔබ ද? ආත්ම දෘෂ්ටිය නැති වෙනව කියන්නෙ ඔබ කියන සිතුවිල්ලයි නැති වෙන්නෙ.** අන්නාසි කියන්නෙ ශබ්ද වර්ණ ශබ්ද වර්ණ පුළුවන් ද කන්න. ඔබ කන්නෙ චිත්තයක්. චිත්තයක් කන්න පුළුවන්ද? කවදාවත් බෑ ඔබ හිතන් ඉන්නෙ අන්නාසි කෑවා කියලා. ඔබ හිතන් ඉන්නෙ පිච්ච මලේ සුවඳ ආවා කියල ඔබ හිතන් ඉන්නේ පිච්ච මලේ සුවඳ ආවා කියලා. ඔබ හිතන් ඉන්නෙ කපුටාගේ ශබ්දෙ කියලා. ඇමරිකානු ජාතිකයෙකුට පිච්ච මල නැත්තෙ ඇයි? ඔයාට කපුටෙක් නැත්තෙ ඇයි? හරියට ප්‍රායෝගික වෙලා හොඳට මේ දේවල් ගිලා බැසලා බැලුවොත් කට උත්තරක් නැති වෙනවා. ඔබ හිතල තියෙන්නෙ, ඔබ කාලා තියෙන්නෙ ඔබ සුවඳ දකින්නෙ ශබ්දෙකයි වර්ණයකයි. ඔබ සුවඳ දකින්නෙ චිත්තෙක. ඔබට අන්නාසි කියන ශබ්ද වර්ණ කන්න බෑ කිවුවෙ ඒ නිසයි. ඔබට රසක් දැනෙනවා. ඒක කොහොම ද අන්නාසි වුණේ. එතකොට පයිනැපල් කිවුවොත් ඒ අන්නාසි ද? නෑ. එතකොට මේ හදාගත්ත දේවල්.

බලන්න අර හිත හැදුන හැටි මොන්ටිසෝරි යනකොට, අපි ඒකයි කිවුවෙ පෙර සිත් කඳ පිළිවෙත් හැදෙන හැටි දැක්කොත් මේ මොහොතෙ එතනත් එනවා ෂොක් එකක්. ඒ ෂොක් එක තමයි සංඥාව. මේකෙ පෙර මතකය කියල එකකුත් නෑ. මේකෙ තියෙන්නෙ සංඥාව කියන්න ස්පාක් එක. මේක ඇතුළෙ මහා ගැඹුරු පර්යායක් තියෙනවා. මේකෙ ආත්මයක් නෑ මේක සිස්ටම් එකක්. ප්‍රොසෙස් එකක්. ඇත්තටම මෙතන සත්ත්ව පුද්ගල දෘෂ්ටියක් නෑ. මෙතන තියෙන්නෙ ශබ්ද වර්ණ දෙක ඔබට අන්නාසි කන්න බෑ කිව්වා වගේ ඔබ කණ්ණාඩියෙන් දැකපු ඔබේ රූපෙත් තියෙනව කියල ඔබ හිතන චිත්තයක් තියෙනවා. කමල් හරි නිමල් හරි අමරාවතී හරි සුමනාවතී හරි මොකක් හරි ශබ්ද වර්ණ කොහෙද තියෙන්නෙ. ඔබ කොහෙද ඉන්නෙ. ඔය දිව ඔබද? හිතට බඩගිනියි කිවුවට හිතට බත් කන්න බෑ. හිත බත් කනවද? හිත බඩගිනියි කිවුවට හිත බත් කාලා නෑ. හිත වතුර තිබහයි කිවුවට හිත වතුර බීලා නෑ. හිත වතුර මොනවද? හිත ඇවිදිනවා කිවුවට හිතට ඇවිදින්නත් බෑ. මේ සිස්ටම් එකට ගැට ගහන තවත් ශබ්ද වර්ණ දෙකක් තමයි. චිත්තය ගැටගහනව කියන්නෙ. මේකයි "චිත්තේන නීයති ලෝකෝ - චිත්තේන පරිකස්සති" කිවුවෙ. මේකයි සළායතන ලෝකෝ ලෝකෝ කිවුවෙ.

අපිට කවදාවත් මේ විඥ්ඥාණ මායාවෙන් එහාට ගිය දෙයක් අත්දකින්න බෑ. ඔබේ ඇස් අන්ධ නම් ඔබට කෝ වර්ණ. ඔබේ කණ් බීරි නම් ඔබට කෝ ශබ්ද. පිළිකාවක් හැදුනොත් ඔබට ඔය රස දැනෙනවද? බලන්න ඔය සිහි නැතිවෙන බෙහෙතක් අරගෙන හිරිවට්ටන බෙහෙතක් ගහලා දත් ගලවන කොට බලන්න ඔබට දැනෙනවද හංකඩේට උණුසුම සීතල තද ගතිය. කිසි දෙයක් දැනෙන් නෑ. ඔබගේ සෙන්සස් පහ වැඩ කරන්නෙ නැත්නම් ඔබට ලෝකයක් නෑ. ඔබ අන්ධයි ඔබ බීරියි ඔබට ඔය රස දැනෙන් නෑ ඔබට ඔය ගඳ දැනෙන් නෑ. ඔබට ඔය උණුසුම සීතල දැනෙන්නෙත් නෑ. එහෙනම් ඔබ කෝ. ඔබට ඔබත් නැති වෙනවා. මෙන්න මේ නිසා ඔබ හොඳින් දකින්න ධර්මතාවය. මේ ලෝකේ "ධම්මං විනා නත්ථි පිතාච මාතා" කිවුවෙ ඒකයි. **නිස්සත්තෝ නිජ්ජීවෝ ශුනෙහ්" කිවුවෙ ඔය එළියෙ තියෙන දේවල් නෙවෙයි මේ ඔබගේ ම සිත ඔබට මවලා දෙන මායාව. දෙයක් නැති තැන දෙයක් මවන එක. හොඳට**

**බලන්න මේ නිබ්බිදාව කියන්නෙ මේ ධර්මය අවබෝධ වුණොත් ඔබට මතු වෙන්නෙ නෑ මේ ආයතන පිනවීමේ අවශ්‍යතාවක්. මේකෙ මූලික අදියරේ තමයි නිබ්බිදාව තියෙන්නෙ. ඒ කියන්නෙ යෝගාවචර භූමියේ. ඒ කියන්නෙ සවිතක්ක භූමියේ. මේක අවිතක්ක භූමියේ නෑ.**

ඒ කියන්නෙ තව ටිකක් දියුණු වෙනකොට ඔබට නිබ්බිදාව නැති වෙලා යනවා. ඔබ පුදුම සැහැල්ලු සුවයකට එනවා. මහා ශාන්ත සුවයකට එනවා. ඔබ සදාතනික සුවයක් ලබනවා. ඔබට මරණයක් නෑ. මර බියක් නෑ. උපතක් නෑ. විපතක් නෑ. සදාතනික සුවයක් අවසානයේ ඔබ අත් දකිනවා. හැබැයි ඔබ මේ මග හරි එනකොට ඔබට නිබ්බිදාවක් එනවා. ඔය කඩුල්ල පනින්නම ඕනි. ඔය නිබ්බිදාව පනින්නම ඕනි. ඔබ හිතනවා මේ මාර්ගය වැරදිල ඇති. අරක වැරදිල ඇති. මේක වැරදිල ඇති. ඔය පටිසංබා ඥානය හොඳට අඳුනා ගන්න. ඔබ රැවටෙන තැන සමහර විට ඔබ ආර්යන් වහන්සේවත් අවිශ්වාස කරයි මේ මග වැරදියි කියල ඔබ හිතයි. ඔබටමයි වරදින්නෙ. එයයි ආර්ය උපවාදයට යනවා කියන්නෙ. ඔබ සියලු දෙනාම මේක පරිස්සමින් දකින්න ඕනි තැනක්. මේ ආර්යන් වහන්සේ ප්‍රත්‍යක්ෂ ධර්මයක් ලෝකෙට හෙළි කරන්නෙ මේක අභ්‍යන්තර පරිවර්තනයකින් ලෝකෙට දෙන්නෙ, ඔබටත් එය දැනෙයි. ඔබට එදාට දැනෙවි. ඔය නිබ්බිදාවට රැවටිලා ආර්යයන් වහන්සේලාට මොකුත් කියන්න යන්න එපා. මේ යුගයේ කල්‍යාණ මිත්‍රයෙක් හොයා ගන්න එක ලේසි නෑ. ඔබට ඒ අත්දැකීම් ලැබෙයි. මේ අති දුර්ලභ අවස්ථාවක් ඔබ අත් දකිනවා. මේ මහා සසර ඕඝයේ නිමාව ඔබ අත් දකිනවා. මේක පුදුමාකාර දහම් පරියායක්, මේක ඇතුළෙ ඔබට හමුවෙනවා. දෘෂ්ටි ගත කෙනා නැවත සකස් වෙන හැටිත් දෘෂ්ටියෙන් මිදුනා කෙනා සකස් නොවන හැටිත් පෙන්වන මේ දේශනා කවදා හෝ ඔබට නිවන් මග විවර කර දෙනවා.

මේ බුද්ධෝත්පාද දේශනා අධ්‍යයනය කරන හැමෝම නිවනින් ම සැනසීම ලබනවා. ඒකනං ඒකාන්තයි. පුද්ගල සරණ යන්න එපා. අපි දේශනා කරන දේ ඔබත් අත් දැකල බලන්න ඔබ අත්හදා බලන්න. ඔබ උත්සාහවත් වෙන්න ඔබට යමක් දැනෙනව නම් විතරක් භාර ගන්න.

ඔබට ඒ අභ්‍යන්තර පරිවර්තනය දැනුණොත් එය ප්‍රත්‍යක්‍ෂ නම් විතරක් භාර ගන්න. මෙතන පුද්ගල කතාවක් නෑ. දහම අවබෝධ උනාට හැමෝම එකයි. ඔබටත් ඒ අත්දැකීම් ඇති. ඔබටත් නිබ්බිදාවක් ඇති වෙලා ඇති. ඔබ මේක දකින්න ඕනි ධර්මයේ දියුණු අවස්ථාවක් කියන එක. එහෙම උනොත් තමා ඔබට ඒ කඩුල්ල පනින්න හැකියාව තියෙන්නෙ. මේක ඔබ ගලපාගන්න ඕනි. හොඳින් දේශනා අහන්න. හොඳයි. මේ මග යන හැමෝටම අත්දැකීම් තියෙනව එක එක මට්ටම්වලින්. ඕනිම කෙනෙකුට තමන් අත්දකින දේ සම්බන්ධව ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න පුළුවන්.

(ඉහත සාකච්ඡාව මෙතැනින් අවසන්)

**උපාසිකාව :** අවසරයි අර්යයන් වහන්ස, මේ මාර්ගයේ යන කොට බොහොම සියුම් තැන් අපට ස්පර්ශ කරන්න පුළුවන් වෙනවා. පසුගිය දවස්වල මම මාව ගවේෂනය කරගන්න පටන් ගත්තා. ඇත්තටම මම සිහියට ආපු දෙයක් තමයි අපි ගෙවල්වල කියනවනෙ කිවුල් දිය නඟිනවා කියලා. ඒ වගේ ආර්යයන් වහන්ස ඉදලා හිටලා අපි අපිවම චෙක් කර ගන්නවා. ඒ කියන්නෙ කිවුල් දිය නඟින වෙලාවල් තියෙනව ආර්යයන් වහන්ස එතකොට අපි දන්නවා මේක නඟින්නෙ මේ නිසයි කියලා. ඒ වගේ බිම කිවුල් දිය හැම තිස්සෙම එන්නෙ නෑනෙ. නඟින වෙලාවක් තියෙනවා. එතකොට හරි සියුම්ව අපි මේක අධ්‍යයනය කරන්න ඕනි ආර්යයන් වහන්ස. අපි අපවම ගවේෂණය කිරීමක් මම හිතන්නෙ ඒක තමයි ආර්ය පරීක්‍ෂණය කියල ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** එහෙමයි. ඒකෙන් අදහස් කරපු දේ ඔබ තුමියම තව ටිකක් කියන්න. ඔබ තුමිය ඒකෙන් විශේෂ දෙයක් කියන්න අදහස් කරනවා.

**උපාසිකාව :** මම ඒකෙන් අදහස් කරන්නෙ ආර්යයන් වහන්ස ඇත්තටම අපි හිතනවනෙ අපි ඉන්නෙ නිබ්බිදාවෙ කියලා.නමුත් එතනදි අපට මහා සියුම් තැන් එනවා ආර්යයන් වහන්ස අපිව ම ආපහු ගවේශණය වෙනවා. ඒ කියන්නෙ මේ කිවුල් දිය නඟිනවා කියන්නෙ ආර්යන් වහන්ස හිතල කරන දෙයක් වත් වතුර දාලා කරන දෙයක්වත්

නෙවෙයිනෙ. කිවුල් දිය නඟිනවා කියන්නෙ ඉබේ සිද්ධ වෙන දෙයක්. ඉබේම ඉතාම සියුම් සියුම් තැන්වල දී අපට හිතාගන්න බැරි වෙලාවෙදි අපේ මේ කෙලෙස් හිමීට මමත්වය කියන එක නැගෙන බවක් දැනෙනවා. එතකොට ආයෙ අපි ඒක දකිනවනෙ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඒ උපමාව හරි. ඔබතුමිය අදහස් කරන්නෙ මේ නිබ්බිදාවත් හරියට කිවුල් දිය නගිනවා වගේ හරි සියුම් කතාවක් මෙතන තියෙන බව. ඔබ තුමිය හරි. අපි කැමතියි ඔබතුමියට තවත් අත්දැකීම් තියෙනව නම් මේ මාර්ගය තුළ කතා කරන්න පුළුවන්. ඔබතුමියට කතා කරන්න දෙයක් ඇති මේ සියුම් තැන්වල. මේකෙ අවසානය ලේසි නෑ. ඔබතුමියට කතා කරන්න දෙයක් ඇති මේ සියුම් තැන්වල. මේකෙ අවසානය ලේසි නෑ. ඔබතුමිය ගැඹුරු තැනින් ස්පර්ශ කරනව නම් ඔබ තුමියට අත්දැකීම් ලැබෙනවා. අපි කතා කරන්න පිරිසක් ඕනි. මොකද ගොඩක් අයට අත්දැකීම් නෑ. අපි විසින්ම පිරිස දියුණු කරලා අපිටම අවශ්‍ය වෙලා තියෙනවා කතිකාවක් ගොඩ නගන්න.

**උපාසිකාව :** එහෙමයි ආර්යයන් වහන්ස. අපිටත් කතා කරන්න කෙනෙක් අවශ්‍යයයි කියන තැනදී, අපිට හැම තිස්සෙම ඔබ වහන්සේට කරදර කරන්න බෑ. අපිට හිටිය නම් හොඳයි ආර්යයන් වහන්සේ. අපේ මේ අත්දැකීමනෙ අපි මේ කතා කරන්නෙ. මේ මාර්ගයේ යන කොට අපිට සියුම් තැන් අපිට හමුවෙනවා ආර්යයන් වහන්ස. සමහර තැන්වල අපි හිතනවා මෙතන මොකුත් නෑ කියලා. නෑ. එතනත් මොනව හරි දෙයක් දැනෙනවා අපිට. ඒ දැනෙන තැන්වල දී අපි ඒක ලිහාගෙන ලිහාගෙන යන්න ඕනිනෙ ආර්යයන් වහන්ස. ඇත්තට ම ආර්යයන් වහන්ස අපිට ඒක දැනෙන්නට ඕනි. ඒක අපේ අවබෝධය තුළින්ම දැනෙන්න ඕනි. ඇත්තටම අර කිවුව වගේ කඳුළු හලන්නවත් සංවේදි වෙන්නවත් ඒකියන්නෙ වචනයකට සංවේදි වුණා කියන්නෙ ආර්යයන් වහන්ස එතන මම ඉන්නවා කියන එකනෙ. කඳුළු වැටෙනවා කියන්නෙ තමන් ඉන්නවා. තමන්ට ඒක දැනෙනවා. ඒ දැනීම තමයි මම කියන්නෙ. ඇත්තටම මේක හරියටම අවබෝධ කරගෙන යනකොට ආර්යයන් වහන්ස අපිට ඒ වගේ තැන්වල දී කඳුළු එන්නෙ නෑ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** හයියක් තමයි එන්නෙ. දැන් උදාහරණයක් කියනවා නම් දැන් අපිට අද තියෙන අත්දැකීම ම හොඳ උදාහරණයක් එකපාරටම අන්තිමට 10.00ට තමයි අපිට කිවුවෙ මේ ලින්ක් එක එන්නෙ නෑ කියලා ඊට පස්සෙ අපි කිවුවා හරි කමක් නෑ අපි ලින්ක් එකක් හදල දාමු කියලා. ඒකට අපි කිසිම කණගාටුවක් පසුතැවීමක්, ඒ නොකර හිටියත් කමක් නෑ. නමුත් කරන්න පුලුවන් දෙයක් තියෙනව නම් කරමු. එච්චරයි. එතකොට හරි පුදුම සරලයි. අපි හිනාවෙලා තමයි කතා කරේ. කිසිම කණගාටුවක්, පසුතැවීමක්, දුක් වීමක් අපි ළඟ නෑ. හරි පුදුම කතාවක් නේද? මොන දේ වුණත් අපිට තියෙන්නේ හරි කිසි ප්‍රශ්නයක් නෑ. කරන්න පුළුවන් දෙයක් තියෙනවා නම් කරා. ළමයෙක් අසනීප වුණාම බෙහෙත් ටික දෙනව වගේ වැඩක්. අඬ අඬා හිටියට වැඩක් නෑනෙ. බෙහෙත් ටික දීලා කරන්න ඕනි යුතුකම් ටික කරනවා නම් හරි නේද? එහෙම නේද වෙන්න ඕනි. මේ ධර්මය අවබෝධ වුණාම පුදුමාකාර හයියක් එනවා එදිනෙදා ජීවිතයට. අපි කියන්න කැමතියි බුදුන් වහන්සේ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා කියල සිවුවනක් පිරිස පෙන්නලා තියෙන කොට ඔබ හිතන්න එපා ඔබට බෑ කියලා. ඔබ හිතන්න එපා මම ගිහිකෙනෙක් මට මේක බෑ මට පුළුවන් ද මේ මාර්ගඵල ලබන්න. මට පුළුවන් ද මේ සෝවාන් වෙන්න. මට පුළුවන්ද අනාගාමී වෙන්න ඕව වැඩක් නෑ. ඒවා නිකං වචන ටිකක් විතරයි.

ඔබ මේ ලෝකෙ සත්‍ය දකින්න. ඇයි අන්ධයෙක් වගේ ඉන්නෙ. ලෝකේ ඇත්තක් නැද්ද? ඔය පේන දේ ඇත්තද? ඇත්තටම ඔබට මරණයක් තියෙනවද? එතකොට මෙතන කෙනෙක් ඉන්නවද? ඇයි ඔබ ඉපදුනේ? ඇයි ඔබ අඬන්නෙ? ඇයි ඔබ හිනාවෙන්නෙ? ඇයි ඔබ දුක් වෙන්නෙ? එතකොට මේ ප්‍රශ්නවලට උත්තර නැද්ද? බුදුන් වහන්සේගේ කාලෙත් තිබුණා අදත් ඒක එහෙමයි. සෑම මනුෂ්‍යයෙකුටම තියෙනවා මර බියක්. වයසක අම්මල දිහා බලන කොට අඬන කොට දුක්වෙන වෙන එක දකින කොට අපිට හිතෙනවා අනේ අම්මෙ මොනවට අඬන්නද? එන්න පොඩ්ඩක් කියල දෙන්න කියල, කියල දෙන්න හිතෙනවා. මේකෙ ලොකු අමුතු දේවල් නෑ. මේක හරිම සුන්දර දහමක්. බුදුන් වහන්සේ මේ ලෝකෙට එළි කරන්නෙ ඇත්තක්. ප්‍රායෝගික දෙයක් මේක කොහෙවත්

අමුතු කතාවක් නෙවෙයි. **මේ ගිය ආත්මෙ ලබන ආත්මෙ කියල දාගෙන. බුදුන් වහන්සේ එහෙම තුන් කාලෙක දහමක් දේශනා කරල නෑ. මේ දැන් අත්දකින එකක් කියන්නෙ. බුදුන් වහන්සේ ප්‍රත්‍යක්ෂ දහමක් දේශනා කරන්නෙ. සාන්දිට්ඨික ධර්මයක් දේශනා කරන්නෙ. මේක අකාලික දහමක්. මේක මේ මොහොතෙ දකිනවා. මේ මොහොතෙම දෙයක් නැති බව දැනෙනවා.** පුදුම සත්‍යයක් මෙතන තියෙනවා. ඇත්තටම මේක ආශ්චර්යයක්. මෙතන පුද්ගල කතාවක් නෙවෙයි තියෙන්නෙ. ඔබ තුමිය උනත් කවුරු උනත් දහම අවබෝධ කළාට පස්සේ කෙනෙක් නැති බව අවබෝධ වෙනවා. එතකොට අඬන්නෙ මොකටද? කවුරු නැති වුණාට ද? බුදුන් වහන්සේගෙන් මාරයා ඇහුවා, ඔබට සතුටුද මහණ? මොනවා ලැබුණාට ද? ඔබට දුක ද මහණ? මොනවා නැති වුනාට ද? මෙතන ලැබුණු දේකුත් නෑ. නැතිවුණ දේකුත් නෑ. හිටපු කෙනෙකුත් නෑ. නැති වුණා නම් නැති වුනේ මාරය ඉන්නවා කියල හිතපු සිතුවිල්ල විතරයි. තියෙනවා කියල හිතපු හිතුවිල්ල විතරයි. මාරය නැති වුණා නම් නැති වුණේ ඕකනෙ උත්තරේ.

**උපාසිකාව :** ආර්යයන් වහන්ස, මේක හරිම සරලයි. ඒ කියන්නෙ අපි බලාපොරොත්තුත් එක්ක ගියාම තමයි දුක දැනෙන්නෙ. අපි බලාපොරොත්තුවක්, ප්‍රාර්ථනාවක් මුකුත් නැති වුණාම එතන ස්වභාවය හරි වෙනස් ආර්යයන් වහන්ස. එතකොට ඇත්තටම පුදුම සරල බවක් සැහැල්ලුවක් තමයි හිතට දැනෙන්නෙ. ඒ කියන්නෙ ඒක හැමෝටම ඒක දැනෙනවා. ගෙදර ඉන්න අනිත් අයටත් ඒක දැනෙනවා ඒ සැහැල්ලුව.

**ආර්යයන් වහන්සේ :** ඇත්තටම මේක අති සුන්දර කතාවක්. මේ දහම දේශනා කරන එකත් අති සුන්දර කතාවක්. සුන්දර කතාවක් කියන්නෙ, ඇත්තටම එක එක රටවල්වලින් අපිට කතා කරනවා. ඒ රටවල්වල ඉන්න අයට ප්‍රශ්න තියෙනවා. සමහර වෙලාවට කියන්න කෙනෙක් නැති තරම්. තනියමනෙ ඉන්නෙ. සයිප්‍රස්වල වයසක අම්මා කෙනෙක් බලාගන්න කෙනෙක් කතා කරනවා. එයා තනියම ඉන්නෙ කතා කරන්න කෙනෙක් නෑ. සිංහල දන්න කවුරුත් නෑ. ෆෝන් එකට කතා කරලා ආර්යයන් වහන්ස, ආර්යයන් වහන්සේට කතා කරන්න පුළුවන්ද? ඔව් කියන්න මොකක්ද කියල කිවුවම, ආර්යයන් වහන්ස,

මට දරා ගන්න බෑ මට ළමයි මතක් වෙනවා. ගෙදර මතක් වෙනවා. මට යන්නත් බෑ. මම කිවුවා අපි බලමුකො පොඩ්ඩක්. බණ අහනවද කියලා. බණ පොඩ්ඩක් කියන්නම් එතකොට ඔය ප්‍රශ්න ඔක්කොම විසදෙයි කියලා ඇත්තටම හරි පුදුමයි. මේ දහම පුදුමාකාර විදිහට ගින්න සම්පූර්ණයෙන් නිවෙනවා සිසිල් කරනවා. ධර්මය දේශනා කරාම එතුමිය පුදුම සතුටින් ඉන්නෙ. එතුමියට තේරෙනවා මේ සේරම සිතුවිලි කියලා. කිසිම තේරුමක් නෑ කියලා. බලන්න, අර දුකෙන් අඬ අඬ හිටිය අම්මාට පුදුම සහනයක් ලැබෙනවනෙ මේ දහමෙන්. **ඇත්තටම සියදිවි නසා ගන්නෙ සිතුවිල්ලකටනෙ. මේ සිතුවිල්ලක් දරා ගන්න බැරුවනෙ ජීවිතය නැති කර ගන්නෙ. අපරාධයක් කරන්නෙ සිතුවිල්ලකටනෙ. විනාශයක් කරන්නෙ සිතුවිල්ලකටනෙ. එහෙම නෙවෙයිද? ඇත්තටම අපි සිතුවිල්ලක් නිසානෙ විඳවන්නෙයි, සතුටු වෙන්නෙ හිනා වෙන්නෙ, අඬන්නෙ වැළපෙන්නෙ. එතකොට මේ සිත ඇත්තක් ද? නෑනේ. ඒක මායාවක් නේ.** මේක ශබ්ද ටිකයි වර්ණ ටිකයි එකතු වෙලා හැදෙන හැටි බලන්නකෝ. මේක මහ ආශ්චර්යයක්නේ. බුදුන් වහන්සේ කියනවනෙ අර ටී.වී. එකට වැඩිය විචිත්‍රවත් කියල හිත දකින එක. ඒ කාලේ තිබුණේ ගිරජ්ජ-සමජ්ජ වගේ සංගීතනේ. බුදුන් වහන්සේ කියනවා චලන චිත්‍රවටලත් වැඩිය විචිත්‍රවත් මහණෙනි මේ සිත දකින එක. මේ සිත අවබෝධ කරනවට වැඩිය දෙයක් මේ ලෝකෙ තියෙනවා කියලා අපි දකින්නෙ නෑ. "කල්පයක් ජීවත් වුවත් වැඩක් නෑ මහණෙනි මේ සත්‍යය එක මොහොතක් නොදැක" කියල බුදුන් වහන්සේ කියන්නෙ ඒ නිසයි.

**උපාසිකාව :** තව දෙයක් එක් කරන්න ඕනි ආර්යයන් වහන්ස. ගලාගෙන එනව සිතුවිලි නම් මේක කියන්න. තනියම ඉන්න අය දැක්කම මේක කියන්න ඕනි. මොකද තනියම ඉන්න එක තමයි අපිට තියෙන සතුට. **නමුත් අර තනියෙන් ඉන්න අයට මේක අධ්‍යයනය කරන අයට තනියෙන් ඉන්න කොට ආර්යයන් වහන්ස අපි කියනවනෙ උත්තරයක් නැත්නම් කාලයට භාර දෙන්න කියලා. කාලයට ඉඩ දෙන්න කියලා. සමහර ප්‍රශ්න විසඳගන්න බැරි වුණාම. අන්න ඒක තමයි ආර්යයන් වහන්ස අපි මේ දකින දේ කියලා මට හිතෙන්නෙ.** කාලයට අපි භාර දෙමුයි කියල කියන්නෙ ආර්යයන් වහන්ස අපේ සමහර ප්‍රශ්න විසඳගන්න

බැරි වුණාම. එතකොට ඒ කාලයට භාර දෙනව කියන්නෙ ආර්යයන් වහන්ස මේ ගැන ආපහු අපි ආපස්සට මෙනෙහි කරනවා.

**ආර්යයන් වහන්සෙ :** ආ.... ඒක හරි

**උපාසිකාව :** අපිට පිළිතුරු නිකම්ම ලැබෙනවා.

**ආර්යයන් වහන්සේ :** ඔව්. ඒක නැවතත් විමර්ශනය කරනවා. ඒක කාලයට භාර දුන්න වගේ තමයි. ඇත්තටම මේ දහම අවබෝධ වුණාම කිසිම ප්‍රශ්නයකට ඉඩක් එන්නෙ නෑනෙ. දැන් මොකකට ද ප්‍රශ්නයක් එන්නෙ. දෙයක් නෑනෙ. දරුව දෙයක් ද? මහත්තයා දෙයක් ද? ගෙදර දෙය් ද? තමන් දෙයක් ද? තමනුත් නෑනෙ. මොනව ලැබුණට ද ප්‍රශ්නෙ? මොනව නැති වුණාට ද ප්‍රශ්නෙ. මේවා ඔක්කොම සිතුවිලි විතරයිනෙ. සල්ලි තිබ්බයි කිවුවත් සිතුවිල්ලක්. නෑ නිවුවත් සිතුවිල්ලක්. මේක මහ පුදුම කතාවක් හැබැයි. එහෙම කිවුවට ඉතිං සල්ලි නැති වුණාම බලන්නකො. විඳින දුක් කියයි කවුරු හරි. නෑ නෑ එහෙම කියන්න එපා. ඒකත් සිතුවිල්ලක් තමයි. සල්ලි තිබුණොත් නැතත් අපි සාමාන්‍යයෙන් ගත්තොත් එහෙම ලංකාවෙ හිඟන්නෙක් අපි ගමු. ඇයි ඒ හිඟන්නා මැරෙන් නැත්තෙ. ඒ හිඟන්නට පොඩි හරි ජීවිතයක් ගත කරන්න හැකියාවක් තියෙනවා. එහෙම නැති අවසනාවන්ත අවස්ථාත් අපි දැකල තියෙනවා. නමුත් තාම ලංකාවෙ එහෙම ස්වභාවයක් තියෙනවා. මිනිස්සු අතර කාරුණික මිනිස්සු ඉන්නවා. උදව් උපකාර කරන මිනිස්සු නැතුවාම නෙවෙයි. පාරෙ වැටිල හිටියොත් ලංකාවෙ කවුරුත් අහක බලාගෙන දුවන්නෙ නෑ. අපි දැක්කා ඉන්දියාවෙ කල්කටාවල චෙන්නායිවල පාරෙ වැටිල ඉඳලා මිනිස්සු අහක බලාගෙන යනවා. නමුත් ලංකාවෙ එහෙම ස්වභාවයක් නෑ.

ලංකාවෙ පාරේ මනුස්සයෙක් වැටිල හිටියොත් ඒ මනුස්සයාට මොකක් හරි පිළිසරණක් වෙන ස්වභාවයක් ලංකාවේ තාමත් අධ්‍යාත්මිකව මේ පසුබිම තියෙනවා. මේ ධර්මයට අවශ්‍ය කරන වටපිටාව තාම තියෙනවා. ඒක හරි භාග්‍යයක් ඇත්තට ම සිතුවිලිවලින් හීන හදාගෙන හීන සැබෑ නොවීම නිසා තමයි ගොඩක් අය දුක් විඳින්නෙ. හැබැයි එහෙම නැතුව අපි ලද දෙයින් සතුටු වෙනවා නම් අර බුදුන් වහන්සේ කියන විදිහට. බුදුන්

වහන්සේ භික්ෂූන් වහන්සේලාට ගොඩක් පෙන්නනවා අල්පේච්ඡතාවය. සිවුරක් උනත් එක අයින් කරන් නෑ. ඒක පෙරහන් කඩේට ගන්නවා. ඒකෙන් හැකි තරම් ප්‍රයෝජන ගන්නවා. සිවුරක් වත් විසි කරන්නෙ නෑ. බුදුන් වහන්සේ හරි පුදුම විදිහට අල්පෙච්ඡතාවය පෙන්නනවා. මේ වගේ බුදුන් වහන්සේ අවම සම්පත් ප්‍රමාණයෙන් යැපෙන ආකාරය භික්ෂූන් වහන්සේලාට පෙන්නනවා. ඒක ගොඩක් වටිනවා. මේ යුගයේ සැබෑ භික්ෂුවක්, මේ භික්ෂුව කියන්නේ සිතුවිලි දේවල් කර නොගන්නා ස්වභාවයමයි. ඔය සමුදයංච, අත්තගමංච, ආස්වාදයංච, ආදිනවයංච, නිස්සරනංච කියලා භික්ෂු සූත්‍රවල දේශනා කරනවා. **බුදුන් වහන්සේ ඔය සමුදය කියන්නෙ දෙයක් කරගන් නෑ කියන එකයි. අත්තගමංච කියන්නෙ ඒක අත්හැර ගන්න හැකියාවක් තියෙන්න ඕනි. ඒවත් එක්ක වැලපෙන් නැතිව ඉන්න එකයි බුදුන් වහන්සේ ආදීනව දකිනවා කියන්නෙ.** මේ සමුදය, අත්තගමංච ආස්වාද ආදීනව, නිස්සරණ කියන්නෙ අමුතු කතාවක් නෙවෙයි. ප්‍රායෝගික කතාවක්. මාර්ගය තුළ දියුණු අය තමයි කතිකාවතක ඉන්න ඕනි.

***උපාසිකාව :*** ආර්යයන් වහන්ස, අපි හිතුවොත් එහෙම මාර්ගයේ යන කොට අපට අපේ ආත්ම සංඥාව එහෙම නැත්නම් මම කියන සංඥාව තියෙන්නෙ මේ අපි ඇහෙන් කණින් නාසයෙන් දිවෙන් ශරීරයෙන් ස්පාක් වෙන අරමුණනෙ. දැන් අරමුණ පොඩ්ඩක් හැංගෙන්න පටන් ගන්නවා මුල දී මුල දී හරි පැහැදිලියි. අපිට ගෙඩි පිටින් ඕන තරම් දේවල් තිබ්බා පස්සේ පස්සේ යනකොට ඒක ඇත්තට ම සිතුවිලිවලට ෆෝකස් වෙන්න ගත්තම සිතුවිලිවලින් පොඩි බොරුවක් කරනවා, බොරුවක්ම නෙවෙයි පොඩි වංචනික දහමක් ද දන්නෑ අර විඤ්ඤාණ මායාවෙන් සඟවන ගතියක් තියෙනවා හඳුනාගන්න බැරි වෙන්න. එහෙම ඒවත් එක්ක තමයි මේ ගමන යැවෙන්නෙ. ඒ කියන්නෙ එතුමිය කියන කොට සමහර වෙලාවට අහු වෙනවා කියලා ඒක ඇත්තටම එහෙම තමයි. ඒ කියන්නෙ අර මුල දී හොඳට පෙනි පෙනි තිබ්බ ඒවා දැන් අල්ලගන්නත් අමාරුයි වගේ සමහර වෙලාවට. ඒකෙන් කියන්නෑ ආත්ම සංඥාව නැති වෙලා කියලා. ආත්ම සංඥාව හොඳට තියෙනවා. නමුත් ඒක හොයාගන්නත් සිහිය එන්න එන්නම ප්‍රබල වෙන්න ඕන අවශ්‍යතාවයක් මට දැනෙනවා.

**ආර්යයන් වහන්සේ :** ඔව් මෙතන ඇත්තටම ආත්ම සංඥාව නෑ වගේ සිතුවිල්ලකුත් එනවා. මේ මාර්ගයේ යන අය අපට කියනවනෙ ආර්යයන් වහන්ස මට දැන් ආත්ම සංඥාව නෑ කොහොමද ආත්ම සංඥාව නෑ කියන්නෙ. පෙන්නන්නකො මේක දැනෙන විදිය නෑ කියන්න හේතුව කියන්න බලන්න. බලනකොට මේ විඤ්ඤාණ මායාවෙන් හිතනවා මෙතන ආත්මයක් නෑ කියලා. බලන්නකො ආර්යයන් වහන්ස මට දැනෙන් නෑනෙ. මට පේනවනෙ ඒත් ආත්මයක් දැනෙන් නෑනෙ. මෙතන මෙහෙම දෙයක් වෙනවනෙ ඒත් මට ආත්මයක් දැනෙන් නෑනෙ. ශබ්දයක් ඇහෙනවනෙ. ඒත් මට ආත්මයක් දැනෙන් නෑනෙ. මට පේන එකේ ආත්ම සංඥාවක් නෑනෙ. නෑ කියන්නෙ කොහොමද? ඔය කියන ස්වභාවය තුළම තියෙනවනෙ ආත්ම සංඥාවක්. මේ කියන ස්වභාවයේ ආත්ම සංඥාවක් තියෙනවා කිවුවම අන්න එතකොට හොයනවා, ඇත්තටම ආත්ම සංඥාව කියන්නෙ මොකක්ද කියලා. ඇත්තටම ඔය වචනයක් මෙහෙම නෑ කියල හිතන එකත් ආත්ම සංඥාවක්. මේක හරි සියුම් කතාවක්. හොඳට බලන්න. **දැන් නෑ කියල හිතන්නෙ මොනවාද? තියෙන නිසානෙ නෑ කියල හිතන්නෙ. නෑ කියන්නෙම තිබිල නැති වෙලා තියෙනවනෙ. තිබිල නැති වෙලා කිවුවා තිබුණා එක නැති වෙලා නෑනෙ. මේකෙ මේ ආත්ම සංඥාව නැති වෙනවා කියන්නෙ දෙයක් නැති වෙනවා කියන එකමයි. ඒ කියන්නේ මුකුත් දැනෙන් නැති ස්වභාවයකට මේක යනවා. දෙයක් වගේ සංඥාවක් ආත්ම සංඥාවෙ තියෙන්නෙ. දෙයක් වගේ දැනෙන සංඥාවක් නොදැනෙන ස්වභාවයක් සිහියට අසුවෙනවා. හැබැයි ඕක කියා ගන්නම බෑ.**

අපි ගත්තොත් අරහත්ත සමාධිය කියන එක සුවයක්. ඒක ඇවිල්ල සේරම කෙලෙස් ස්වභාවය සංසිදිලා මතුවෙනවා එය ආයතනවලින් එන ද්වාර ස්වභාවයෙනුත් මිදිලා ඒත් එනවා සුවයක්. 'ඕභාසය' කියල අපි කතා කරන්නෙ ඔතෙන්ට එතන දැනෙනවා සුවයක් ඒ අරහත්ත සමාධියට එන සුවය එතන තියෙනවා. හැබැයි එතන සුවය තියෙනකම් ඒ සමාධිමය ස්වභාවයෙන් ආත්ම සංඥාව තියෙනවා. ඇයි මේ සුවය විඳින කෙනෙක් ඉන්නවා. සුවය දැනෙන්නෙ කාටද? මට හරි පුදුමයි. එතකොට මේ අරහත්තය කියන්නෙ මේ ආත්ම සමාධියක් නෙවෙයි කියන එක කිසිම

කෙනෙකුට කිසිම පොතකින් හොයන්න බැරි වෙයි. හැබැයි ප්‍රායෝගික ප්‍රත්‍යක්‍ෂ පැත්තෙන් මේක ආර්යයන් වහන්සේ ලෝකෙට හෙළි කරනවා. ඒ අරහත්ත සමාධියත් නෙවෙයි අරහත්වය කියන්නෙ කියලා. අරහත්වය තුළ අරහත්ව සමාධි ස්වභාවයක් නෙවෙයි තියෙන්නෙ කියලා ඒ තරම් මෙතන ගැඹුරුයි. මේක අපිට විග්‍රහ කරන්න පුළුවන් වෙනස් වෙනස් බුදුන් වහන්සේ දේශනා කරල තියෙන පර්යායන් ඔස්සේ. ඒක අපිට ඕන වෙලාවක පෙන්නන්න පුළුවන් මේ කතාව ඇත්ත. මේකත් හරියට ඛේමක භික්ෂුව කිවුවා වගේ තමයි. සුවඳක් තියෙනව නම් සුවඳත් නැති වෙන්න ඕන. රෙද්දක් හේදුවොත් පිරිසිදුයි තමයි. හැබැයි සබන් සුවඳ තියෙන්න පුළුවන් හැබැයි ඒකත් නැති වුනොත් තමයි සංඥා නැතිවන ස්වභාවය ඒ තරම් සියුම්. ඒක ඛේමක භික්ෂුව උපමාවකින් පෙන්නනවා. ඒ තරම් සියුම් ඒ කතාව කියපු දේ ගැන මොකක්ද ඔබතුමියට අදහස? හොඳට වැටහුනා ද දන්නෙ නෑ. ගැඹුරුයි මේ කියන කාරණා.

**උපාසිකාව :** එහෙමයි. ඒක හැංගෙන තැනක් හොයා ගන්න බෑ කියල මම අදහස් කළේ ඒක තමයි.

**ආර්යයන් වහන්සේ :** මේකෙ මේ නෑ කියල හිතන සිතුවිල්ල ගොඩක් අයට හොයා ගන්න බෑ. සිතුවිල්ලෙන් එනවා මට ආත්ම සංඥාව නෑනෙ කියලා. එතකොට කොච්චර අතරමං වෙනවද? හිතාගන්න බෑනෙ. දැන් එයා හිතන්නෙ එයා මාර්ගඵල ලබලා. එයා හිතන්නෙ එයා අරහත්වයට පත් වෙලා. එයා කියන්න ලෑස්තියි හැමෝටම මම රහත් වුනා කියලා. අපි කියනවා නෑ... නෑ... නෑ... තව ටිකක් ඉවසන්න කියලා. අපි නවත්වග න්න තමයි උත්සාහ කරන්නෙ. මොකද මේක එහෙම ලේසි කාරණයක් නෙවෙයි ඔය කියන තරම්. අතිසියුම් කාරණාවක් මේක අවසානයේ දී තියෙනවා. දැන් කතා කරල බැලුවම හරි. දර්ශණ අවබෝධයත් හොඳයි බැලුවම කියන ගොඩක් ඒවා ගැලපෙනවා. සේරම හරි. මේක හොයන්න බෑ. ගුරුවරයෙකුටත් මේක හොයාගන්න හරි අපහසුයි. සැබෑම පරිවර්තනයක් නැතුව කිසි කෙනෙකුට මේක රැවටෙන තැනක් හොයාගන්නම බෑ. අභ්‍යන්තරයෙන් ම එනවා විඤ්ඤාණ මායාවෙන්ම මේ මොකුත් නෑනෙ. දැන් මොකුත් නෑනෙ. දැන් මේ ආත්ම සංඥාව නෑනෙ. හරි. දැන් මේ ආර්යයන් වහන්සේ කියන එක තමයි මෙතන

තියෙන්නෙ. අපි කියනවා කලබල වෙන්න එපා. පොඩ්ඩක් තැන්පත් වෙන්න. හොඳට ඔතන අධ්‍යයනය කරන්න අති සියුම් තැනක්. මේක ඇවිල්ල ඔබ හිතනවාට වඩා හිතන දේ නෙවෙයි දැනෙන දේත් එක්ක යන්නෙ. සිහිය අවදි කර ගන්න. ඥානයත් එක්ක ඉන්න. මේක අති සියුම්. මේකෙ අවසානය කියන්නට එපා කාටවත් කියල කියන්නෙ ඒකයි. ඔබ වැඳ වැඳ යන කෙනෙක් වෙන්න ඕනි නෑ. වන්දනාවට සුදුස්සෙක් වෙන එක තමයි හරිම දේ. පෙරහැරවල් හදාගෙන හැතැම්මක් දිග වන්දනාවෙ යනවට වඩා හොඳයිනෙ ඔය පෙරහැරින් එක්කෙනෙක් එළියට ඇවිල්ල වන්දනාවට සුදුසු කෙනෙක් වෙන්න. ඒක නේද හරි?

**උපාසිකාව :** එහෙමයි, ආර්යයන් වහන්ස. ඇත්තටම ඒ ඒ මොහොතට ප්‍රශ්න කරන්න පුළුවන්. විඥ්ඥාණ මායාවෙන් තමයි ගොඩක් ඒවා දෙන්නෙ. ඒ දෙනකොට... දැන් අපි හිතමු ආ... දැන් මට ඒක තේරුණා කියල විඥාඥාණ මායාවෙන් දුන්න කියල, ඒ විඥ්ඥාණ මායාවෙන් දුන්න උනත් ඒකම උනත් නැවත නැවත ප්‍රශ්න කරන්න පුළුවන් ඕන වෙලාවක. එතකොට එහෙම විඥ්ඥාණ මායාවට දැනෙන්න විදිහක් නෑනෙ. සිහියටනෙ දැනෙන්න ඕනි.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය හරි. ඒක තමයි අපි කිව්වේ. විඥ්ඥාණයෙන් දෙන දේ පිළිගන්නම එපා. විඥ්ඥාණයෙන් නිවන් දැකල කියල දුන්නත් මේ ආත්ම සංඥාව නෑ කියල ඔබ හිතන මොහොතට එනවා සවිතක්ක ස්වභාවය තුළ අවිතක්ක ස්වභාවය නෑ. සවිතක්ක කියන්නෙ මෙනෙහි කරනවා කියන එකයි. මෙනෙහි කරන කොට ඔබට මතු වෙනවා ඔය ස්වභාවය. අපි නෑ කියන්නෙ නෑ. හරි. ඒක විඥ්ඥාණ මායාවක්මයි. ඒක සිතුවිල්ලකින් න්නෙ. හිතපු නිසා එන එක නෙවෙයි ඕකෙ පරිවර්තනය. පරිවර්තනය හිතන එකක් නෙවෙයි. ඔබට දැනෙන එකක්. ඒ නිසා හිතන තැනක නෙවෙයි මේ නිවන තියෙන්නෙ දැනෙන ස්වභාවයක් එක්ක යන්නෙ. එතකොට තමයි මේක අසුවෙන්නෙ එහෙම නේද?

**උපාසිකාව :** එහෙමයි. සමහර අම්මලා අහන ප්‍රශ්නවලින් මට ඒක කියන්න හිතුණෙ. මොකද, අම්මා කෙනෙක් අහන්න පුළුවන් මම මෙතන ද ඉන්නෙ ආර්යයන් වහන්ස කියල. ඒ ප්‍රශ්නෙම පොඩ්ඩක් අවුල්. මොකද

කියනවනම් මට හිතෙන්නෙ දැන් මේ නම් ටිකක් දීලා තියෙන්නෙ ඒ ඒ මග යන අවස්ථාවෙ උන් වහන්සේලාට ඒ මග ගිය වීරයන්ට දැනිච්ච දේට නමක් දුන්නෙ. එක්කෙනෙකුට පියල් කියල නමක් දුන්න වගේ. ඒක අහුවුනා ද ඒක අහු උනාද කියල යනව කියන්නෙ එතන පොඩි අවුලක් තියෙනවා. ඒ නිසා ඒවා අමතක කරල යන්න කියල තමයි මම නම් කියන්නෙ.

**ආර්යයන් වහන්සේ :** ඔව් ඒක හරි. මේ කතාවෙ ඵල සොයනකම්ම ඵලය හම්බවෙන්නෙ නෑ. ආනන්ද හාමුදුරුවෝ සක්මන් කරනවනෙ මැදියම, අලුයම එළිවෙනකම් ම රහත් වෙන්න හිතාගෙන. රහත් වෙන් නෑනෙ. අන්තිමට ම ආනන්ද හාමුදුරුවෝ අත හැරල දානවනෙ. ඇයි දැන් එළි වෙනකම්ම බැලුවනෙ සක්මන් කරල. හරි ගියෙ නෑනෙ. අවසානයේ දී අතහැරලා දාලා සැතපෙන්න යන වෙලාවෙ අන්න රහත් වෙනවා. **මේ අවිතක්ක ස්වභාවය මෙනෙහි කරන ස්වභාවයක් නෙවෙයි. ඵලයක් බලාගෙන ඉන්නවා කියන්නෙ මෙනෙහි කරනවා. ඵලයක් හොයනවා කියන්නෙත් මෙනෙහි කරනවා. හැබැයි මේ ධර්මය එහෙම එන එකක් නෙවෙයි. මේක අභ්‍යන්තරයේ සිහියට හසුවෙන එකක්, තමන්ගෙම පරිවර්තනයක්, මේ කතාවේ අවසානයේ පරිවර්තනයක් තියෙන්නෙ.** මේ ආත්ම දෘෂ්ටිය වෙනයි ආත්ම සංඥාව වෙනයි. ආත්ම සංඥාව කියන එක සිතුවිල්ලක් නෙවෙයි. මෙතන තමයි මේකෙ තියෙන ගැඹුරුම තැන. හැබැයි මේ සිතුවිල්ලෙන් එනවා ආත්ම සංඥාව. සංඥාවමයි විඤ්ඤාණය. හැබැයි සිතුවිල්ලෙන් ආත්ම සංඥාව එනවා. හැබැයි ආත්ම සංඥාව දිය වුණ එක සිතුවිල්ලට හොයන්නම බෑ. මේක මේ 'ඤායස්ස අධිගමාය' කියන එක ගොඩක් අයට තේරෙන්නෙ නෑ. මේ සිහියට අසුවෙනවා කියන එක මොකක්ද කියලා. සිහිය කියන්නෙ සිතුවිල්ලක් නෙවෙයි. ඔබට දැනෙන දෙයක්. ඒකයි මේ සම්මා ඤානං, සම්මා විමුක්ති දසාංග සමන්නාගත අරියට්ඨංග මග්ග කියල ඔය ආර්ය අෂ්ටාංග මාර්ගයේ ඉතුරු අංග දෙක කියන්නෙ. මේ සම්මා ඤානය කියන්නෙ මේක ඤානයට හසුවෙනවා. ඤායස්ස අධිගමාය, ඤානය හරහා තමයි අධිගම ලබන්නෙ. අන්න 'නිබ්බානං සච්ච කිරියාය' එහෙමයි නිවන් දකින්නෙ. එයයි විමුක්ති සාරා කිවුවෙ.

කොහොමද මේ ධර්මයත් එක්ක ගලපනකොට හරි සුන්දර කතාවන්නෙ. මේ ප්‍රශ්න අහන හැමෝම දියුණු මට්ටමින් කතා කරන්නෙ. දියුණු මට්ටමේ ගොඩක් අය ඉන්නවා බුද්ධෝත්පාද දේශනා අහන මාර්ගයේ කටයුතු කරන යෝගාවචර ස්වභාවයේ. හැමෝම තමන්ගෙ අදහස් ප්‍රකාශ කරන්න අපි උනත් මිථ්‍යා දෘෂ්ටියේ ඉඳල තමයි මේ සත්‍ය අවබෝධය කරා යොමු වෙන්නෙ. මේ ධර්මය අවබෝධ වෙනකොට ඒ අභ්‍යන්තර පරිවර්තනයක් එක්ක ස්වභාදහමට දිය වෙනවා. හැම කෙනෙක්ම අපිට දැනෙනවා එකම ස්වභාවයක්. හොඳයි, ඔබටත් පුළුවන් කතා කරන්න.

**උපාසිකාව :** මට අර කලින් මහත්මිය කතා කරපු තැනින් කියන්න හිතුණා අර කුඩා දරුවා යමකට ආරෝපණයක් වෙනවනෙ. එතනදි කුඩා දරුවාට ඒ ආරෝපණය නිසාම 'ඉත්ථභාවයත්' එක්ක ආත්ම සංඥාව හැදෙන්න පටන් ගන්නව නේද ආර්යයන් වහන්ස. ඊට පස්සේ එයා මනෝ විඤ්ඤාණ මට්ටමට එන කොට අන්න එතනදි තමයි එයාට ආත්ම දෘෂ්ටිය පටන් ගන්නෙ. ඊට පස්සෙ අපි ධර්මාවබෝධය ලබන කොට...

**ආර්යයන් වහන්සේ :** අන්න හරි, අන්න හරි. ඔබතුමිය කියපු එක හරි. පුංචි දරුවටත් තියෙනවා අර ඇලෙන ගතිය නේද? සාසවිය බව. එතනින් තමයි එන්නෙ අර කෙලෙස් ස්වභාවය, ආත්ම සංඥාව නේද? ආත්ම සංඥාව සකස් වන ආකාරයනේ. ආත්ම සංඥාවක්. දැනෙන ස්වභාවයක් අර ඉන්නව වගේ දැනෙන ඉත්ථ සංඥාවක්. සත්ත්ව සංඥාවක් එනව නේද? ඔබතුමිය කියපු එක හරි. හැබැයි ඒකත් එක්කම තමයි ආත්ම දෘෂ්ටිය එන්නෙ හැබැයි මේකෙ ආත්ම දෘෂ්ටිය නෙවෙයි ඉස්සර වෙලා එන්නෙ. ආත්ම සංඥාව මේක හොඳටම පැහැදිලියි. ඊට පස්සේ තමයි දෘෂ්ටිය ඇවිල්ල ශබ්ද වර්ණ නාම රූප එකතු වෙලා එන්නෙ. පෙර පසු නොවී මේ කතාව කියන්න පුළුවන්. **හැබැයි හොඳටම පැහැදිලි වෙනවා ආත්ම සංඥාව අවසානයේ දුරු වෙන්නෙ ආත්ම දෘෂ්ටිය මුලින් දුරු වෙන්නෙ. හැබැයි මේ කතාවෙ ආරම්භය තියෙන්නෙ ආත්ම සංඥාවෙන් ආත්ම දෘෂ්ටිය ඇති වෙනවා කියන එකයි.** ඒක ගැඹුරු තැනක්. නමුත් ඒක අපිට පෙන්නල දෙන්න ඕනි වුණා. ඔහොම ප්‍රශ්න අහන්නත් ඒක එන්න එපැයි. ඒක නිසා කියල දෙන්නත් ඕනි ඕක.

මේක හොඳටම තේරෙනවා. මේක ධම්ම චක්ඛුසයට හසු වෙනවා. ආර්යයන් වහන්සේ හොඳටම දන්නවා මේක. ආත්ම සංඥාව එන නිසා තමයි සාසව්ය ස්වභාවය එතකොට ආත්ම සංඥාවෙ එතන තියෙන ස්වභාවයක්. එකෙන් ආත්ම දෘෂ්ටිය ඇති වෙලා තියෙන්නෙ. තේරුණා නේද? හරියටම තේරුණා ද මේ කියන කතාව. හොඳයි ඔබ තුමියගෙ ප්‍රශ්නෙ ඉදිරිපත් කරමු. ඒක පෙන්නල දෙන්න ඕනි වුණා.

**උපාසිකාව :** හොඳමයි ආර්යයන් වහන්ස. දැන් ඔතන පණුවටත් ආත්ම සංඥාවක ඉන්නවනෙ. ඒකනෙ අර වෙනස් වෙන්නෙ. ඒවා දැනෙන කොට.

**ආර්යයන් වහන්සේ :** ඔව්, ඔව්... පණුවගෙ විශේෂය තියෙන්නෙ පණුවට සෙන්සස් නෑ මෙච්චර. පණුවට අවම සෙන්සස් ප්‍රමාණයක් තියෙන්නෙ. අර හංකඩේ පෙන්නන්නෙ. බලන්නකෝ නේද? ඉත්ත සංඥාව එකම ආයතනයකින් එන හැටි ඒකෙන් පේනව නෙ. දැන් අපි ගත්තොත් අන්ධයා, අන්ධයාට ඒක සෙන්සර් එකක් නෑ. බීරාට තව සෙන්සර් එකක් නෑ. කන් ඇහෙන් නෑ. අන්ධයාට පේන්නෙ නෑ. අපි හිතමු අඳ, ගොලු, බිහිරි කියලා. එතකොට සෙන්සස් දෙකක්ම නෑනෙ. එතකොට සෙන්සර් 5ම නෑනෙ. බලන්න ඒත් ඉත්ත භාවයක් තියෙනවනෙ. තේරුණාද මේ කතාව. මේ ඉත්ත භාවය කියන්නෙ අර මේකෙ ඇවිල්ල වේගෙට සකස් වෙන එක මොකක්ද කියල සෙන්සර් එක අදාළ නෑ. වේගයක් තියෙනවනම් එතන දැනෙන ස්වභාවයක් තියෙනව නම් එතන ඉත්ත සංඥාවක් තියෙන්න ඕනි. ඒ කියන්නෙ අර තියෙනවා ඉන්නවා වගේ දැනෙන සංඥාව සකස් වුණොත් ආත්මයක් තියෙනවා. ඒ කියන්නෙ මැරෙන්න කැමති නෑ. තේරෙනව ද මේ කතාව? සත්ත්ව ස්වභාවය මේ කතා කරන්නෙ. මේ සත්ත්ව කියන්නෙ ඉත්ත ස්වභාවය. ඉති රූපං කිවුවෙ ඒකයි. දැන් මේ රුප්පනයනෙ, රුප්පනයට ඉත්ත භාවයක් තියෙනවා වගේ දැනෙන ගතියක් ආවොත් අන්න එතන සත්ත්ව කියනවා. ඒ කියන්නෙ පුද්ගල සංඥාවෙන් කියනව නෙවෙයි. ඇත්තටම ආර්යයන් වහන්සේට ආර්යයන් වහන්සේ වගේ කෙනෙක් හම්බ වෙලා නෑ. මේ විදිහට කවුරුත් අපෙත් එක්ක සාකච්ඡා කරලත් නෑ. අපිට සාකච්ඡා කරන්න කෙනෙක් නෑ. මේක ආත්ම සංඥාව, මේක දෘෂ්ටිය

මේක මෙහෙමයි කියල කාත් එක්ක ද කතා කරන්නෙ. හැබැයි මේක තේරෙනවා දැනෙන් නැත්ද? එච්චරයි.

මේක තේරෙන අය නෑ. ඔබතුමිය මේක හොඳින් දන්නවා. ඔබ තුමියත් අපි වගේ අට මස් ලේ නහරවලින් හැදුණ ශරීර කූඩුවක් තියෙන ඔය වගේ ස්වභාවයක්. ඔබ තුමියට මේක දැන් දැනෙනවා නෙ. දැන් කියන කොටත් දැනෙනවා නේද? අන්න ඒ තත්ත්වයට ඔබ තුමිය දියුණු වෙන්න හරි අපි මේ දේශනා දාන්න එපයි. අපිට මේ ඔක්කොම ස්වභාව දහමක්. මේ පංචායතනයෙන් ලෝකයක් හැදිලා, ඇස කන දිව නාසය ශබ්ද වර්ණවලින් හැදුන ලෝකෙ සලායතන ලෝකෝ කියන කොට මේක අවබෝධ කරන එකම එහා විද්‍යාවක් නෑ. කොහෙද විද්‍යාවක් තියෙන්නෙ. මෙහෙමයි. නූතනයේ එන එක විෂය ධාරාවන් ඔස්සේ ළමයි ඉගෙන ගන්නවා. ඔය විෂයන් එකක්වත් අපට අදාළ නෑ. අපිට අදාළ මොකක්ද මෙ කියන්නෙ කියල බල එකයි. වර්ණයක් එනකොට බලනවා. මේ වර්ණය කොහොමද හැදෙන්නෙ. ශබ්දයක් එනකොට බලනවා ශබ්දය කොහොමද හැදෙන්නෙ. ඉතිං ඕක වරදක් ද? ඇයි බුදුන් වහන්සේත් ඕකනෙ කරන්නෙ. බුදුන් වහන්සේ කියනවා "චක්ඛුං පජානාති" මේක අවබෝධ කරන්න කියලා. "රූපං පජානාති" මේක ශුද්ධ කරල ශුද්ධ කරලා බලන කොට තේරෙනවා මහාභූතවලින් හැදෙනවා කිවුවට මේක හැදෙන්නෙ රුප්පනයෙන්.

ඔක්කොම බිමට දාන්නත් ඕනි. අවසානයේ මොකුත් නෑ කියන තැනට තමයි එන්නෙ. දැන් මේ මොකුත් නෑ කියන කෙනා ඉන්නවනෙ. එතකොට කෙනා නැති වෙන්නෙ කොහොමද? මම ඉන්නකං මට දුක තියෙනවනෙ. ඇයි දාපු දුකක් තියෙනව. බිමට දාපු දුකක් තියෙනව බලනකොට මේ මනුස්සයට. එතකොට කියන්නෙ නෑ. ඔයා දැන් බිමට දාපු දුකක් තියෙනවා. ඇපි ඔබ ඉන්නවනෙ. ඕක ඔබත් එක්ක බිමට දාන්න ඕනි මාත් එක්ක... එහෙනම් ඉතිං සියදිවි නසා ගන්න තමයි වෙන්නෙ කියයි. නෑ. නෑ... සියදිවි නසා ගන්න ඕනි නෑ. ඔබ හැදෙන හැටි බලාගන්න. අන්න එතනයි මහා විද්‍යාව තියෙන්නෙ. ඒකයි බුදුන් වහන්සේ කියන්නේ "මහණෙනි, ඇස නිත්‍යද? අනිච්චං භන්තෙ. මහණෙනි, එහෙනම් ආත්මයක් තියෙනව ද? කියලයි අහන්නෙ. මෙය අනාත්ම ධර්මයක් මේ ලෝකෙට හෙළි කරන්නෙ ආත්මයක් තියාගන්න තාක්කල් ආත්ම

සංඥාවක ඉන්න තාක්කල් ආත්මීය ධර්මයක් බුද්ධ දේශනයේ නෑ. ඒකයි මේක භව නිරෝධයක් කියන්නෙ. මෙතන දෙයක් තියෙනව නම් භවයක් තියෙනවා. දෙයක් නැත්තං භවයක් නැත්තං 'නේතං - මම - නේසෝ හමස්මි නමෙසෝ අත්තා' මමත් නෑ කියන එක. මුළු ධර්මයේම තියෙන්නෙ ආත්මයක් නැති බවයි. කෙනෙක් පුද්ගලයෙක් නැති බවයි. **අනුසෝතයේ කෙනා හැදෙන හැටි බඹරෙ කැරකිල එකතු වෙන හැටි පටිසෝතයේ බඹරෙ අනිත් පැත්තට කැරකෙන හැටි කෙනා නැතිවෙන හැටි. බුදුන් වහන්සෙ පොට්ඨපාදට කියනවා. සංඥා අභිසංකරණයක්ය පොට්ඨපාද ජීවත් වෙනවා කියන්නෙ.** සංඥා අභිසංකරණ නිරෝධයක්ය පොට්ටපාද නිවන් දකිනව කියන්නෙ. එතකොට මේ සංඥා කියන්නෙ ස්පාක් එක. මේ ස්පාක් එක එකතු වෙනවා 'අභිසංකරණය' ඒක ලිහෙනවා. නිවන් දකිනවා. හරි නේද? පුදුමයි නේද? එක වචනෙ තියෙනවා මුළු දහමම.

***උපාසිකාව :*** දැන් මනෝ විඤ්ඤාණ මට්ටමේ දී ඔන්න දැන් දරුවට පටන් ගන්නව ආත්ම දෘෂ්ටිය කියන එක. එතන ඉඳලා ඊට පස්සෙ අපි මේ ධර්ම අවබෝධය ලැබීම තුළින් අපි බාහිර දෙයක් නෑ කියන තත්ත්වයට එනකොට ඒ වගේම බාහිර දෙයක් ඇත්ත කරගෙන හැම මොහොතකම අර ආත්ම සංඥාවක් එන්න එන්න තීව්‍ර වෙනවා. ආරෝපණය වෙනවා. දැන් ඔතනදි ධර්මාවබෝධය ලබන කොට මොකද වෙන්නෙ අපි දකිනව මේ බොරුවකට ආරෝපනය වෙනව කියලා. එතකොට මුලින්ම ආත්ම දෘෂ්ටිය අයින් වෙලා ක්‍රමානුකූලව ආත්ම සංඥාව ටික ටික දියවෙලා යනවා. ආර්යයන් වහන්සෙ අපිට ලෙවල්ස් හතර ගැන කියන කොට පළමුවෙනි ලෙවල් එකේ දී ආයතන බාහිර යමක් නෑ කියල දකින කොට, එතන දි අපි ආයතන පැත්තට හැරෙනවා. ඊට පස්සෙ ආයතනවලින් චුන් වෙන එක නතර වෙනවා. ඊට පස්සෙ ක්‍රමානුකූලව අපි මේ දර්ශන විඤ්ඤාණය දැක දැක යනකොට ඔය මනෝ විඤ්ඤාණ මට්ටමේ දී අපිව සුද්ද වෙලා යනවා. එතකොට වෙන්නෙ එය ආත්ම සංඥාව තමයි අවසාන වෙනකම්ම යන්නෙ. අවසානයේ දී ආත්ම සංඥාව දියවෙලාම යනවා. අන්තිම හරිය ඔබ වහන්සේ ලස්සනට පැහැදිලිකරනවා. ඒ ටික ගැන අපිට එච්චර අවබෝධයක් නෑ. මුලහරිය හොඳටම ප්‍රත්‍යක්‍ෂයි. ආත්ම සංඥාව දියවෙමින් යන හැටි. ආත්ම දෘෂ්ටිය නැති වෙන හැටි. එහෙමයි නේද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** හොඳමයි මහත්මිය. දැන් මේ වෙන කොට ගොඩක් අය හඳුනාගෙන තියෙනවා නේද ආත්ම සංඥාව දියවෙන හැටි, ආත්ම දෘෂ්ටිය කියන්නෙ මොකක් ද? ආත්ම සංඥාව කියන්නෙ මොකක් ද? මොකක් ද මේ රූප දර්ශනය කියන්නෙ, සෙන්සස්වල ස්වභාවය ගැන නේද? මොකක්ද මේ ඕභාසය කියල කියන්නෙ. ධර්මය නේද වැදගත්. මේ ධර්මය කොච්චර වටිනවාද? හරිම සුන්දර කතාවක්.

**උපාසිකාව :** එහෙමයි ආර්යයන් වහන්ස, මටත් එකතු කරන්න හිතුණා **දැන් කලලයක් උපදින්න ලං වෙච්ච අවස්ථාවක කලලය දන්නෙ නෑ කම්පනයක් ආවෙ කොහෙන්ද කියලා. නමුත් කලලය තාම ඉපදිලා නැති වුණත් කම්පනයක් දැනෙනවා. එතනම හැදිල ඉවරයි. මට මේ ධර්මයෙන් කියන්නෙ මට දන්නෙ නෑ වෙන ක්‍රමේකට. ආත්ම සංඥාව එතනම බිහිවෙලා ඉවරයි.** මොකද ඒ කම්පනය එක්කම ඒක පොඩි ආරෝපණයක් එක්කයි එන්නෙ. එතකොට කම්පනය ආරෝපණයක් ඇති කරනවා කලලය උපදින්න ළඟ අවස්ථාවේදී. එතකොට ඇත්තටම එතන ආයතනවත් තාම බිහිවෙලා නෑ. මේ මනෝ විඤ්ඤාණ කතාවටත් කලින් මම අරූපය කියලා එහෙම තමයි පොඩි අදහසක් තියෙන්නෙ. මම දන්නෙ නෑ ආර්යන් වහන්ස මම මේ කියන එක හරි ද කියලා.

**ආර්යයන් වහන්සේ :** හරියට හරි. ඇත්තට ම ඔය කවුරුවත් කියන් නැතුව පොතක් වත් බලන් නැතුව මෙනෙහි කරල ඔය තමන්ට නුවණට හසුවෙන ප්‍රඥාවට හසුවෙන කාරණා කියන විදිහ හරියටම හරි. ඇත්තට මුළු ධර්මයම විවර වෙනවා ඔය කම්පනය කියන වචනය ගත්තට පස්සෙ. ඒ කියන්නෙ රුප්පනය කියන වචනය බුදුන් වහන්සේ ඉති රූපය හැදෙන්නෙ කොහොමද? තියෙන රූපයක් වගේ එන එක. අපි කියන්නෙ ඉති රූපං සමුදයෝ දෙයක් වුණේ කොහොමද? ඉත්ත භාවයක් ආවෙ කොහොමද? මෙතන තියෙන්නෙ කම්පනයක්. දැන් ආලෝකය කියන්නෙ කම්පනයක්. ඒක දන්නව තරංග සිස්ටම් එකෙන් පෙන්නනකොට. ශබ්දය කියන්නෙ කම්පනයක්. එතකොට දන්නවා මේ සෙන්සස්වලින් මේ ටික තමයි මේ සෙන්සර් වෙලා එන්නෙ. විශ්වය දිහා බැලුම අපිට තේරෙනවා මීට වැඩිය සෙන්සස්. දැන් විකිරණ සෙන්සර් එකක් අපිට නෑ. අපිට රේඩාර් සෙන්සර් නෑ. රේඩාර් තියෙන සත්තු

ඉන්නවා. මේකෙ මේ සෙන්සස් පහට එහා ගිය විශාල සෙන්සස් ප්‍රමාණයක් ඒ කියන්නේ විශාල පරාසයක අපිට පේනවා මේ සෙන්සස් පිහිටන්න හැකියාව තියනවා කියලා. මනුස්සයා ගාව එහෙම නෑ මනුස්සයා ගාව සෙන්සස් 5යි මෙතන ස්පාක් වෙන්නෙ කියලා හොඳටම පැහැදිලියි. එතකොට එතනින් තමයි ලෝකෙ මැවිල තියෙන්නෙ. හැබැයි අනිත් සෙන්සස් ආවොත් මොකද වෙන්නෙ මනුස්සයාට. ලෝකෙ තව විශාලයි. අපිට රේඩාර් පේන්න ගත්තොත් මොකද වෙන්නෙ. නිකං ගැජට් එකක් හයි කරගෙන හරි ගත්තොත් මොකද වෙන්නෙ. ඩොක්ටස්ලා එක්ස් රේ ගන්නව වගේ සෙන්සර් එකක් හයිකර ගත්තොත් මොකද වෙන්නෙ.

ඇත්තටම මේ දහම ප්‍රඥා ගෝචරයි. ඇත්තටම මේක මවා ගත්ත ලෝකයක් සෙන්සර්වලට මැවෙනවා. මෙතන ඇත්ත කතාවක් නෑ. ආත්ම කතාවක් නෑ සෙන්සස් ටිකක් ස්පාක් වෙනවා විතරයි. ඇත්තටම මේ ටික තේරෙන කොට මොනවද කියන්න තියෙන්නෙ. අභ්‍යන්තර පරිවර්තනය විතරයි වෙන්න තියෙන්නෙ. කාට හරි මේ අභ්‍යන්තර පරිවර්තනය වෙලා මේ අවබෝධය ඇතිවෙන එක නවත්වන්න පුළුවන් ද? මේක තේරුණාට පස්සෙ බාහිර ඇත්ත වෙයිද? නෑ... ඒකයි කිවුවෙ සෝතාපන්න වුණාට පස්සේ, ඒ කියන්නෙ මේ අනුසෝතය කියන්නෙ බාහිර ඇත්ත වුණ තැන. බාහිර දෙයක් නෑ කියල දැක්ක කියන්නෙ සෝතාපන්නයි. සෝතාපන්න ආර්යයන් වහන්සේ නමක් ආයෙ හරවන්න පුළුවන්ද? ඒක කිසි දවසක වෙන්නෙ නෑ නියත සම්බෝධි පරායනයි කිවුවෙ ඒකයි. නිවනින්මයි සැනසීම ලබනවා කිවුවෙ ඒකයි. මීට වැඩිය ආශ්චර්යයක් මම දකින්නෙ නෑ. බුදුන් වහන්සේ කියන විදිහට මේ තුන් ලෝකයේ ම නෑ මේ දහමට එහා කතා කරන්න දෙයක්. ඒක තමයි බුදුන් වහන්සේ පෙන්නුව උපමාව මහණෙනි, කල්පයක් හිටියත් වැඩක් නෑ. මේ සත්‍යය නොදැන කියල. අපි හැමෝගේම අදහස් දැනගන්න සතුටුයි. බොහෝ අය මේ මාර්ගයේ දියුණු ලෙස කටයුතු කරනවා. බොහෝ අය මේ ධර්මය ගැඹුරු තැනින් ස්පර්ශ කරනවා. මේ වන විට අපිට නිතර ම කතා කරන බොහෝ පිරිසක් ඉන්නවා. ගැඹුරු තැනින් ස්පර්ශ කරමින් ආත්ම සංඥාව දුරුවන ආකාරය ගැන කතිකා කරමින් පුංචි පුංචි හිරවෙන තැන බලමින් හදමින් යන පිරිසක් ඇති වෙලා තියෙනවා. ඇත්තට ම ඒක මේ යුගයේ විශාල කතාවක්. ගෞතම බුද්ධ සාසනයේ දියුණු පිරිසක් බිහිවෙනවා. අපිට

එහෙම තමයි කියන්න වෙන්නෙ. ඒක භාග්‍යයක් හැමෝටම අසන්න ලැබීමත්. ඔබ හැමෝටම කතා කරන්න පුළුවන්. අවසරයි.

**උපාසිකාව :** ආර්යයන් වහන්ස, අපිට ගිහි ජීවිතේ ඉන්නකොට ආත්ම සංඥාව හොයා ගන්න ලේසියි කියල මට හිතෙනවා.

**ආර්යයන් වහන්සේ :** ඒක ඇත්ත. ඒක බුදුන් වහන්සේත් දේශනා කරනවා. ඒ කියන්නෙ අවිද්‍යා භූමියේ මහණෙනි නිවනත් තියෙන්නෙ කියලා. ආත්ම සංඥාව හොයා ගන්න. දැන් ඔය අසංඥ තලයේ ඉන්නවනෙ සංඥා නොදැනෙන ස්වභාවයේ සංඥා වේදනා නිරෝධ සමාපත්තිය කියන්නෙ, සංඥා සුකුම කරගෙන ඉන්නව කියල අපි කියන්නෙ. ඕකනෙ ඔය භාවනා කරන්න ගිහිල්ල සමථය වඩලා හිරවෙලා ඉන්නවා කියන්නෙ අසංඥ තලයේ සංඥ නොදැනෙන ස්වභාවයකට පත් වෙනවනෙ. එතකොට අපි කියනවා අසංඥ තලය කියලා. එතන හිරවීමක් තියෙනවා පොට්ඨපාද හිරවෙලයි ඉන්නෙ. ඔය පොට්ටපාද සූත්‍රයේ ඒක හොඳට පේනවා. පොට්ඨපාද ඔබ ඉන්න ආත්ම දෘෂ්ටිය තියෙනකම් ඔබට නිවනක් නෑ කියනවනෙ බුදුන් වහන්සේ, මේකෙන් ඒක තේරෙනවා. එතකොට සාමාන්‍ය ගිහි ජීවිතය තුළ ආත්ම සංඥාව හොඳට පේනවා. ගිහියන් එදිනෙදා ප්‍රශ්නවල දී ගොඩක් වෙලාවට ආත්ම සංඥාවත් එක්ක ඉන්නවා. එතකොට ආත්මෙ හොඳට පේන නිසා ආත්මෙ තියෙනවා හොඳට දැනෙනවා. අපි හිතමු ඊට පස්සෙ මෙයා පැවිදි වෙනවා කියලා. දැන් පැවිදි වෙලා ආරණ්‍යකට වෙලා මාර්ගය තුළ දියුණුවෙන් කටයුතු කරනවා කියලා හිතමු.

ඊට පස්සේ පැවිදි වුණාම වෙන දෙයක් තමයි අවසාන ටිකේ යනවා භාවනාවට. ඇයි හිතනව දැන් ඉතිං කරන්න දේකුත් නෑනෙ. සමාධි සුවය විඳිනවා කියල. සමාධියට වෙලා ඉන්නවා, අපෙනුත් අහනවා ආර්යයන් වහන්ස අපි දැන් සමථය වඩලා සමාධියේ හිටියට කමක් නැද්ද කියලා. කමක් නෑ. සතුටු දෙයක් කියල අපි කියනවා. මේක භාවනාවක් නෙවෙයි. දැන් කරන්න දෙයක් නැති කමටයි ඔය කියන්නෙ. ඔන්න ඔතන හිරවෙනවා. හිරවෙනව කියන්නෙ දෙන්නෙම නැතුව සමාධියට ගිහිල්ලා. ඊට පස්සෙ ඔන්න කියනවා, ආර්යයන් වහන්ස දැන් මොකුත් තේරෙන්නෙ නෑනෙ. ඇත්තට ම ආර්යයන් වහන්සෙ මේකද ඒ අවස්ථාව කියලත්

හිතාගන්න බෑ. ඔතනින් කොහොම ද දැන් කියන්නෙ. ඔය සමාධියේ හිරවෙලානෙ. දැන් ඕක නිවන ද? ඕක පැත්තකින් කියල ආයෙමත් එන්න කියනවා මොනවා හරි සාමාන්‍ය විදිහට කටයුතු කරලා තමන්ගේ ආත්ම සංඥාව හොයාගන්න කියලා. ඒ තරම් සිත සැඟව යනවා. බුදුන් වහන්සේම කියනවා 'සිත සැඟව ගිය කල්හි ඔබ කුමක් කරමුද? මේ භික්ෂූන් වහන්සේලාටයි කියන්නෙ. සිත දකින්න බෑ. තේරෙනව ද මේ කියන කතාව. මේක නිසා තමයි අපි කැමති නැත්තෙ ආයිමත් භාවනාවට ගැට ගහන එකට.

මේ විදර්ශනා භාවනාව කියන්නෙ සමථ භාවනාව නෙවෙයි. හිත විසිරෙන කොට සමථ භාවනාව මුල් අවස්ථාවෙ ඒක වුනාට, මේකෙ අවසානයේ දී විතක්ක විචාර සංසිඳිලා ප්‍රීති සුඛ ඒකාග්‍රතාවයක් තමයි තියෙන්නෙ. හැබැයි ඒක සමථය වඩපු එකක් නෙවෙයි. මේක අර අවබෝධය තුළ මිදෙන ස්වභාවය තුළ එනවා අර උත්තරීතර හුදකලාව කියන ස්වභාවය එනවා. අනුත්තර ස්වභාවයක් එනවා. ඒ අනුත්තර ස්වභාවයේ තියෙනවා සමාධි ස්වභාවයක්. ඒකෙ විදර්ශනා සමාධි ඛණික සුවයක් තියෙනවා. ඛණික සමාධියේ සුවය තියෙනවා. ඒ කියන්නෙ අරමුණුවල බැසගන්නැති ස්වභාවයකින් මතු වෙනවා. මේක විදර්ශනා සමාධියක්. මේක සමථය වඩලා එක පාරටම හුස්ම දිහා බලල ආයේ නොදැනෙන ස්වභාවයට යන්න ගියොත් එතකොට හිරවෙනවා. මේ දෙක දෙකක්. සාමාන්‍යයෙන් අපිත් පර්යංකයෙන් ඉන්නවා. මේක හිටගෙ නම ඉන්නත් බෑනෙ. වාඩිවෙලා ඉන්නත් බෑනෙ. ඇවිදගෙනම ඉන්නත් බෑනේ. මේකට ඉරියව්වක් නෑ. මොන ඉරියව්වෙන් හරි සාමාන්‍යයෙන් එදිනෙදා සාමාන්‍ය කටයුතු ටික කරගෙන සාමාන්‍ය විදිහට මේ පැවිදි ප්‍රව්‍රජ්ජාව තුළ සාමාන්‍ය විදිහට ජීවිකාව යනවා. මේක අවබෝධඥනයක් 'සංඛිත්තේ නිබ්බිදාය.' නිවන අවබෝධඥානය තුළින් මතුවෙන්නෙ. මේක අවබෝධ කරන ධර්මයක් තියෙනව මහණෙනි කියලා බුදුන් වහන්සේ පෙන්වන්නෙ ඒ නිසා තමයි. හැබැයි මෙතනදි අර මහා ප්‍රඥාව අවදි වෙනවා. අර ඥානෙට හසු වෙනවා, ආසවක්ඛ්‍යා ඥානයට හසුවෙනවා අර සංඥාව යන්තම් හරි දැනෙන ස්වභාවය තියෙනව නම් ඒ සංඥාව අර යෝගවචර භික්ෂුවක් වේවා අපි හිතමු පැවිදි ප්‍රව්‍රජ්ජාව තුළ හිටිය කියලා. කොහොමත් මෙතන එන්නෙ භික්ෂු ස්වභාවයක්.

මේකෙ අවසානයේ අරහත්ත භාවයේ දී කොහොමත් භික්ෂු ස්වභාවයක් තියෙන්නෙ. භික්ෂු කියන්නෙ කොහොමත් කෙලෙස් සංසිදෙන ස්වභාවය 'වත' තමයි වෙනස් වෙන්නෙ. 'පැවිදිවත'ද 'ගිහිවත'ද කියලා. ඇත්තටම **බුදු සමය තුළ මේ වත නෙවෙයි තියෙන්නෙ. අභ්‍යන්තරව අධ්‍යාත්මිකව මේ පරිවර්තනය තියෙන්නෙ. අධ්‍යාත්මිකව තියෙනව උපසම්පදාව. ඒ උපසම්පදාව කියන එක එතෙන්ටයි එන්නෙ මෙතන 'වත' නෙවෙයි, අධ්‍යාත්මික පරිවර්තනයක් තියෙන්නෙ. මේ තුළ භික්ෂු ස්වභාවයක් තියෙන්නේ.** මේක අවසානයේ භික්ෂු කියන වචනය තමයි පාවිච්චි කරන්න වෙන්නෙ. ගිහි කියන වචනය පාවිච්චි කරන්න බෑ. ඝටීකාර අනාගාමි කියනවා. දැන් ඝටීකාර අනාගාමි භූමියෙන් එහාට ගිහි වචන පාවිච්චි කරන්න බෑ. හේතුව "නහිජාතු ගබ්බසෙයියං පුනරේතී" එතකොට ගර්භයක සකස් වෙන්න ලෝක සංඥා තියෙන්න ඕනි. ලෝක සංඥා තියෙනවා නම් විතරයි අපිට ඕක කතා කරන්න පුළුවන්. ලෝක සංඥා ගැන එතනින් එහාට කතා කරන්න බෑ. එතනින් එහාට එයා මොන වතේ හිටියත් භික්ෂුවක්. එයාට අධ්‍යාත්මික උපසම්පදාවක් තියෙනවා. මේක රෙදි මාරු කරන එකක් නෙවෙයි. මේකෙ අනාගාමි භූමියෙන් එහාට මොන වතේ හිටියත් භික්ෂුවක්.

මේකෙ වතක් නෑ. මේකෙ තියෙන්නෙ සැබෑම අධ්‍යාත්මික උපසම්පදාවක්. හැබැයි ඕකෙ අවසානෙට යනකොට සිවුපසේ නැතිව යන්න බෑ. ඒක නිසාමයි 'ඒහි භික්ෂු භාවයෙන්' පැවිදි උපසම්පදාව දරාගන්න කියලා බුදුන් වහන්සේ කියන්නේ. ඒ කියන්නෙ සිවුරු දරාග න්න වෙන්නෙ මොකද සිවුපසය හම්බවෙන්නෙ නෑ. ඇයි මෙයා උපයන්නෑ කොහොමත්. ඔය අනාගාමී භූමියෙන් එහා කතාව හුඟක් වෙනස්. අභ්‍යන්තර පරිවර්තනයකට ලක් වෙනවා. හැබැයි මේ අවබෝධය ඇතිව එක්තරා මට්ටමක් තියෙනවා ඒකත් කියන්න ඕනි අරහත්වය තුළ නම් නෙවෙයි, ඊට මෙහා තියෙන ස්වභාවය. සාමාන්‍ය විදිහට කටයුතු කරගෙන ඉන්න ස්වභාවයක් තියෙන්නෙ. හැබැයි ඒ අධ්‍යාත්මික පරිවර්තනය තුළ ඒ ස්වභාවයට පත්වන ස්වභාවය තුළ ඒක බාහිරින් නම් කවදාවත් හොයන්න බෑ. හැබැයි අපිට මේකෙ 99.9%ක් ම කියන්න තියෙනවා මේකෙ අවසාන ස්වභාවය වතෙන් හොයන්න යන්න එපා. හැබැයි ඒ ස්වභාවය ඔබ හිතනවට වැඩිය අධ්‍යාත්මික උපසම්පදාවක් තියෙන්නෙ. ඒ සැබෑ භික්ෂුවක් මිසක් ගිහියෙක් නම් නෙවෙයි.

**ගිහි කියන්නෙ ගේය සිත. ගේය සිත නෑ එතන කොහොමත් ඉන්නෙ භික්ෂුවක්.** මේකෙ අවසානෙ අනාගාමි භූමියෙන් එහාට මේ පැහැදිලි කිරීම් ප්‍රායෝගික අත්දකින කතාව තුළ වෙන වචනයක් කිවුවොත් එතනත් ආර්ය උපවාදයට අහුවීමක් තියෙන්නෙ. ඒක නිසා අපිට වෙන වචනයක් කියන්න බෑ. එතන සැබෑ භික්ෂුවක් ඉන්නෙ. ඔබව අඳුන ගන්න එක තම තමන්ට බාරයි. ඒකට දියුණු නොවී ප්‍රායෝගික නොවී ප්‍රත්‍යක්ෂතාවයක් නැතිව සාන්දිට්ඨික දෙයක් එතන තියෙන්නෙ. එතන රහතන් වහන්සේ නමක් ගිහියෙකුට හඳුනගන්න බෑ. ඒ ආර්ය භූමිය ආර්යන් වහන්සේලාටමයි හඳුනා ගන්න පුළුවන්. එතන ගිහියෙක් ඉන්නව කියල නම් කවදාවත් කියන්න එපා. හැබැයි මෙතන වත ගැන කතා කරන්න යන්නත් එපා. මොකද මෙතන ඒ තරම්ම සියුම්. මේකෙ අවසානයේ ඉන්නෙ භික්ෂුවක්. ඒ භික්ෂු ස්වභාවය තුළ කවදාවත් ඔබ දකින්න එපා ගිහි ස්වභාවය තුළ මුදල් උපයන දේවල් නම් කරයි කියලා. කවදාවත් ඒක සිද්ධ වෙන්නෙ නෑ. ඒක ආර්යයන් වහන්සේ ප්‍රත්‍යක්ෂ ඥානයෙන් කියන්නෙ. මේ ටික දැනට පැහැදිලියි. ඔතන තව ගොඩක් කතා කරන්න තියෙනවා. ආන්දෝලාත්මක ස්ථානය තමයි ගොඩක් අයට නොතේරෙන ස්ථානය තමයි ගොඩක් අය රැවටෙන ස්ථානය තමයි ආර්ය උපවාද කරගන්න මේ යුගයේ සැබෑම ආර්යයන් වහන්සේලා සමග යන මේ කටයුත්ත හරි භයානකයි. මෙතන දි ඔබ බොහොම පරිස්සම් වෙන්න. කවුරුත් හෝ සැබෑ ආර්යයන් වහන්සේ නමක් ලංකා භූමියේ වැඩ සිටිනවා නම් එළියට එන්න එපා. ආර්ය උපවාදයට අහුවෙලා විශාල පිරිසක් මේ නිවන් මගත් වැහිලා දුගති පරායන වෙනවා පිරිහෙනවා. කරදරේ වැටෙනවා. මේ යුගය අති භයානකයි. අපිට අත්දැකීම් ගොඩක් තියෙනවා ඒ නිසා අපි මේක කියන්නම ඕනි.

සැබෑම ආර්යයන් වහන්සේලා බාල බොළඳ වැඩවලට යන්නෙ නෑ කියල අපි දන්නවා. ඒක නිසා ඒ ගැන අපිට සැකයක් නෑ. ඒ ගැන කියන්න කිසිම දෙයක් නෑ. අපිට ඒ ගැන අවබෝධයි. ඒ වගේම සැබෑම ආර්යයන් වහන්සේලා නිහඬයි කියලත් අපි දන්නවා. ඒ ගැනත් අපිට කිසිම ප්‍රශ්නයක් නෑ. ඉතිං ඒක වෙන හැටිත් කියන්න පුළුවන්. මේකෙ වෙනම විද්‍යාත්මක පසුබිමක් අපි එළිකරල තියෙනවා. අපි කියනවනෙ විද්‍යුත් ආකර්ෂණ බලය වගේ චුම්භක ආකර්ශන බලය

වගේ චිත්තාකර්ශන බලයක් ගැන. මෙන්න මෙතන විකර්ශන බලයක් ඇති වෙනවා. ඔබ මේක තවම දන්නෙ නෑ. ඔබට මේ ගැන අවබෝධයක් නෑ. ඔබට මේවා ගැන වැටහීමක් නෑ. නමුත් මේ ආර්යයන් වහන්සේට පුදුමාකර අවබෝධයක් තියෙනවා. මේක වෙන හැටි වෙනම පර්යායකින් කියන්න පුළුවන්. ඒක එකම අවස්ථාවයි. අපේ මුවින් පිටවෙලා තියෙන්නෙ. මේකෙ විශාල පර්යායක් තියෙනවා මේ ආර්යය උපවාද සිදුවන ආකාරය. මේ ගැන පුදුමාකාර අත්දැකීම් ටිකක් තියෙනවා. නැතුව මේක කියන්නෙ නෑ. මෙච්චර දේවල් කියන ආර්යයන් වහන්සේට මේක නොතේරෙනවා නෙවෙයි. ඒක නිසා ආර්යයන් වහන්සේලා එළියට නම් එන්න එපා. ඇත්තට ම ආර්යයන් වහන්සේලා පරිස්සම් වෙන්න. ඒකම හේතුව ගිහියා අමාරුවේ වැටෙනවා.

ඔබ සැබෑම ආර්ය භූමිය මතුවෙලා ඉන්න යුගයක ඉන්නෙ. ඒ නිසා පරිස්සම් වෙන්න. මොකද ඔබ කොටස් දෙකකට බෙදෙනවා. **සැබෑම ආර්යයන් වහන්සේ හඳුනාගන්න බැරිව. සමහර විට දෙව්දත්ගෙ කොටසකුත් මේ යුගයේ ඉන්නවා. සැබෑම ආර්යයන් වහන්සේලා කොටසකුත් මේ යුගයේ ඉන්නවා. ඔබ ඇඟිල්ල දික් කරල ඒ පැත්ත මේ පැත්ත කරකවන කොට ඔබේ බෙල්ලම කැපිල තියෙයි කොයි පැත්තෙන් හරි. ඔබට ම හිතාගන්න බැරිවෙයි. ඔබ නිකං උම්මත්තකයෙකු වගේ ධර්මය ගැන කියව කියව ඉඳියි. දැනුමේ හිරවෙලා. ඔබට ඒ අභ්‍යන්තර පරිවර්තනය වෙන්නෙ නෑ. ඔබ දන්නෙ නෑ හේතුව. ඔබට එය හොයාග න්න පුළුවන් වෙන්නෙ එකම එක ක්‍රමේටයි. ඔබට දැනුනොත් දවසක ඔබ ඒ ආර්යය උත්තමයාට වැඳලා ඒක දැනුන බව කියල ඒක නිදහස් කර ගනියි වෙන ක්‍රමයක් නෑ.** මේකෙ නොකියන පුදුමාකාර කතාවක් තියෙනවා. ඔබ සමහර විට හෑල්ලුවට ගනි, විහිළුවට ගනි. ඔය කරන්න යන එකක් වත් කරන්න යන්න එපා. ඊට වැඩිය හොඳයි වතුර වගේ ඉන්න. වර්ණා ඕනි නෑ. එක එක කතා ඕනි නෑ. බොහොම නිහඬව ඉන්න. ඒක ඒ තරම් භයානකයි. ඉදිරි කාලයේ දී අපේ අත්දැකීම් එළි කරන්නම්. මේක කියන්න හේතු තියෙනවා. ඒ නිසා පරිස්සම් වෙන්න. ඔබ මේ දේශනා අධ්‍යයනය කරලා ඔබේ සසර ඕඝය, සසර දුක නිවා ගන්න. ඔබ කට පරිස්සම් කරගන්න. බුදුන් වහන්සේ වැඩිම විනය ප්‍රමාණයක් පනවලා තියෙන්නෙ කටටයි.

ඔබ දන්නවා සාමාන්‍ය සම්මුතිය තුළ පෘතග්ජන භූමිය තුළ දෙයක් කර ගත්ත භූමිය තුළ ඔබ දන්නවා **කයින් වන වැරදි, සිතින් වන වැරදිවලට වැඩියි ඔබේ කටින් වන වැරදි. ඒ නිසා කට පරිස්සම් කර ගන්න. ඔබේ විතක්කවල ගොඩ නැගෙන චේතනාව විතක්කවලට යටින් තියෙනවා. චේතනාව තුළ ආරෝපණ බලයක් තියෙනවා. ඒක ඔබට පාරා වළල්ලක් වෙයි.** ඔබට ඒක තාම තේරෙන්නෙ නෑ. බුදුන් වහන්සේ නිකම්ම මෙවා කිව්වා නෙවෙයි. දෘෂ්ඨිගත අයත් දෘෂ්ඨිය තුළ විනාශයකට ලක් වෙනවා. ඒක නිසා පරිස්සමෙන් දෘෂ්ඨියෙන් ගැලවෙන්නත් තියෙනවා. තවත් විනාශයක් කර ගත්තොත් අපරාධයක්. හැමෝම මේ දහම අවබෝධ කරගන්න. සසර ඕඝයෙන් මිදෙන්න. සසර දුකෙන් මිදෙන්න. මනුස්ස ආත්ම භවය අති දුර්ලභයි. මේක අවබෝධ කරන්න බෑ සතෙකුට මෙතන කෙනෙක් පුද්ගලයෙක් සත්වයෙක් නැති බව. මේ භව ඕඝයට යන සැටි සසර කතරක කතාව අපි අභිඥා දේශනාවල පැහැදිලි කරා. ඔබ ඒ දේශනා අහන්න. ඔබට අහන්න ලැබෙයි කොහොමද ඔබ දෘෂ්ටිය තුළ නැවත සකස් වෙන්නෙ කියලා. දෘෂ්ටි ගත කෙනා නැවත උපදිනවා. දෘෂ්ටියෙන් මිදුන කෙනාට උප්පත්තියක් නෑ. මෙහෙම දේශනා ඔබට අහන්න ලැබෙන්නෙ බුද්ධොත්පාදෝ එකෙන් විතරයි වෙන්න පුළුවන්. නමුත් මේ තමයි සත්‍යය. ඔබට කවදා හරි එය වැටහේවි. ඔබට දැනෙන දවසක ඔබ එය භාර ගන්න. හොඳමයි එහෙනම්, හැමෝගෙන්ම අවසරයි. තෙරුවන් සරණයි.

**උපාසිකාව :** තෙරුවන් සරණයි, ආර්යයන් වහන්ස.

# 02

# නුවණින් විමසන්නාට ලෝකය මායාවක්

**උපාසක මහතා :** ආර්යයන් වහන්ස, මට මේ සිහිය ගැන පොඩි පැහැදිලි කර ගැනීමක් කිරීමට අවශ්‍යයයි. ඒ කියන්නෙ සිහිය කියන එක අපි අවබෝධ කර ගන්න ඕනි සිතුවිල්ලක් සමග ඇතිවන සිහිය නැත්නම් සමහර වෙලාවට මේකෙ පොඩි පැටලීමක් තියෙනවා. සිහියෙන් ඉන්නවා කියලා අපි එක දිගටම සිහියෙන් ඉන්න පුළුවන්ද? ඒ කියන්නෙ පොඩි ළමයෙකුටත් සිහියක් තියනවනෙ. මොකක් හරි කකුල වැදුණොත් කකුල ගන්නවා. ඒ වගේ රස්නයක් දැනුනොත් අත ගන්නවා. ඒ සිහියෙන් ද ගන්නෙ? මෙතන අපි දියුණු කරගත යුතු සිහිය ඒ සිත සැදෙන අවස්ථාවේ දී පනින සිහයද කියන එක පොඩ්ඩක් පැහැදිලි කරනවද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** සිහිය කියන එක නෙවෙයි ඔය කතා කරන්නෙ සිතුවිලි ගැන. පොඩි ළමයා මොනව හරි දෙයක් හිතුවොත් තමයි දන්නෙ. ඔබතුමා උනත් හිතුවොත් තමයි දන්නෙ.

**උපාසක මහතා :** පොඩි ළමයි උෂ්නත්වයක් දැනුනොත් කකුල ගන්නවනෙ එයා.

**ආර්යයන් වහන්සේ :** ඔව්. ඒ සිතක් පහළ වෙලයි ගන්නෙ. ආරම්මනයක් එන්න ඕනි. ආරම්මනයක් නැතුව කකුල ගන්නෙ නෑ. එහෙම නැතිනම් ප්‍රතීක ක්‍රියාවක්. ඒක එතෙන්ට සම්බන්ධයක් නෑ. ඇස් පිල්ලම් ගහන එක සිහියක් නෙවෙයිනෙ සම්බන්ධයක් නෑ. ඒවා ප්‍රතීක ක්‍රියා. ඒවා සාමාන්‍යයෙන් ෆිසිකල් බොඩි එකේ සිද්ධ වෙනවා. මේ සිහිය කියන එක

ඔබතුමාට හිතන්න බෑ. කවදාවත් සිහිය හිතන්න බෑ. දැන් හැම දේටම සිහියක් තමයි පවතින්නෙ. කේන්ති ගිය බවට සිහියක් තමයි තියෙන්නෙ. සිහිය හිතන්න බෑ. ඔබතුමා කරන්න හදන්නෙ සිහිය හිතන්න යන එක. කවදාවත් ඕක කරන්න බෑ. ඔබතුමාට සිහියක් තමයි පවතින්නෙ හැම තිස්සෙම. ඒ සිහිය හරියට අවකාශය වගේ. සිතුවිලි වලාකුළු වගේ. සිහිය මතයි වලාකුළු පවතින්නෙ. ඔබතුමාට සිහිය නැතිවෙන එකක් තමයි සිද්ධ වෙන්නෙ. ඒ කියන්නෙ ඔබතුමා හිතන එකනෙ. හිතෙන එක තමයි කතා කරන්නෙ. ඒ කියන්නෙ අපිට ආයතන ඔස්සෙ ඇස්, කණ, දිව, නාසය, කය මේ පංචායතන ඔස්සේ එන ආරම්මන අපි කියනවනෙ ඒ ආරම්මනයක් තමයි අපි හඳුනා ගන්නෙ. එහෙම නැත්තං අපි හිතමු අපි දැන් සිහිය නැතිකරන ඉන්ජෙක්ෂන් එකක් ගහල තියෙනවා කියලා. එතකොට අපි කියනවනෙ සාමාන්‍යයෙන් අපේ දත් ගලවන කොට එහෙම ගහනවනෙ. එතකොට අපි දන්නෙ නෑනෙ. එතකොට අපිට උණුසුමක් සීතලක් දැනෙන් නෑනෙ. එතකොට පොඩි ළමයට අත ගන්න බෑනෙ. ඒ වගේ. දැන් ආයතනවලින් සිතුවිලි තමයි දැන ගන්නෙ. අරමුණ ඔස්සේ දැන ගැනීම සිද්ධවෙන්නෙ. දැන් අපේ ඇස් පේන් නැත්තං වර්ණ කතාවක් නෑ. කණ් ඇහෙන් නැත්තං ශබ්ද කතාවක් නෑ. අපිට පිළිකාවක් හැදිල ගන්ධය දැනෙන් නැත්තං, රස දැනෙන් නැත්තං ඒකට කරන්න දෙයක් නෑ. දැන ගැනීමක් සිද්ධ වෙන්න සෙන්සස් ටික වැඩ කරන්න ඕනි. මේ සිත කියන්නෙ අරමුණු. අරමුණයි සිත කියන්නෙ. එහෙනම් ඒ අරමුණකින් තොරව හිතල අපි කියන ඔය එකක් වත් හරියන්නෙ නෑ. ඔක්කොම සිතිවිලි. ඒ කියන්නේ ආරම්මන. සිහිය කියන එකට ඔය සිතිවිලිවලින් උත්තර දෙන්න බෑ. **සිහිය කියන්නෙ හැම මොහොතෙම සිහියක් පවතිනවා. අපි සිතිවිලි ආරම්මන ඔස්සේ අපිට වැරදුනා හෝ හරි ගියා හෝ සිහියක් තමයි පවතින්නෙ. ඇත්තටම සිතිවිලි හඳුන ගන්න ඕනි සිහිය හඳුන ගන්න ඕනි. සිතිවිලි වෙනයි සිහිය වෙනයි.**

**උපාසක මහතා :** එහෙමයි.

(ඉහත දේශනය මෙතැනින් අවසන්)

**ආර්යයන් වහන්සේ :** තව විශේෂ දෙයක් කියන්න තියෙනවා. මේ මග යන අය අභ්‍යන්තර දියුණුවක් ඇති කර ගන්න ඕනි. හැමෝටම තියෙන ගැටලුව තමයි අභ්‍යන්තර පරිවර්තනයක් සිද්ධ වෙන්නෙ නැතිකම. ඒ පරිවර්තනය වෙන එක ලේසි නෑ. ආනන්ද හාමුදුරුවෝ සක්මන් භාවනාව කරේ අරහත්වයට පත්වෙන්න හිතාගෙන. නමුත් ඒක සිද්ධ වුණේ නෑ. ආනන්ද හාමුදුරුවෝ මැදියම, අලුයම සක්මන් කරලා ඒක අතහරිනවා. අන්න ඊට පස්සෙ තමයි අරහත්වයට පත්වෙන්නෙ. මේ වගේ අභ්‍යන්තර පරිවර්තනය කාටවත් හිතල කරන්න බෑ. හැබැයි මේ මග යන බොහෝ අය දියුණුවට පත් වෙන කොට මේ අභ්‍යන්තර පරිවර්තනය ගැන හඳුනා ගන්නෙ නෑ. මේ සිද්ධ වෙන එකක්. මේක අර ඕඝතරණ සූත්‍රයේ පෙන්නන්නෙ දැඟලුවොත් පාරුව වෙරළෙනවා එහෙම වෙන එකක් නෙවෙයි ඉතිං බොහොම පරිස්සමින් කටයුතු කරන්න. දියුණු තැන්වල කටයුතු කරන කොට ඇත්තටම අපි උණත් යනවා අන්ධ වනයට. අපි උනත් විවේකීව කටයුතු කරනවා. මේක තමයි ඇත්තට ම මේ මාර්ගයේ දියුණුවට එනකොට හැමෝටම හිතෙන්නෙ. හැමෝමගෙම අභ්‍යන්තරයෙන් එනවා ඒ සංඥාව. ඊට පස්සේ ඇලුම් කරන්නෙ නෑමේ ආයතන පිනවීම. ඒ නිසා ආයතන පිනවීමෙන් මිදිලා කටයුතු කිරීමට තමයි සකස් වෙන්නෙ. එහෙම තමයි සංඥා සකස් වෙන්නෙ. හැබැයි ඒකක් විඤ්ඤාණ මායාවෙන් එන්නෙ. ඒක නිසා ගොඩක් පරිස්සම් වෙන්න ඕනි.

විශේෂයෙන් ම මේ බුද්ධෝත්පාද දේශනා අහල ගොඩක් අවබෝධයට පත්වෙලයි ඉන්නෙ. දැන් ලෝකෙ වටේට විශාල පිරිසක් ගැඹුරු තැනින් මේ ධර්මය ස්පර්ශ කරනවා. මෙතෙක් කාලයක් තිස්සේ මේ නිවන යම්කිසි බිල්ලෙක් කරලා තිබුණා. නිවන් දකින්න මේ යුගයේ බැරි කරලා තිබුණා. නමුත් අද විශාල ගිහියන්ගේ පිබිදීමක් තියෙනවා. සිහියන් විශාල වශයෙන් සත්‍ය ධර්මය හොයනවා. උන්වහන්සේලාත් දැන් බුද්ධෝත්පාද දේශනාවල හෙවනැලි බවට පත්වෙනවා. අපිට තේරෙනවා බුද්ධෝත්පාද දේශනා අනාගතයේ විශාල පරිවර්තනයක් සිද්ධ කරනවා. ඒකට හේතුව තමයි මෙතෙක් මේ යුගයේ බිහිවුන සියලුම

ධර්ම දේශනාවල ඇත්තටම කිවුවොත් අර වැලි මිරිකල වතුර ගන්නව වගේ සංෂිප්තව ඔබට සියල්ලම එකම තැනකින් හමුවන මහපුදුමාකාර ප්‍රායෝගික පැත්තේ අත්දැකීම් සහිතව පරිවර්තනයක් එළිදක්වන එකක්. අපි අපේම අභ්‍යන්තර පරිවර්තනය ලෝකෙට එළි දක්වන්නෙ. අපේ ශරීර කූඩුවෙන් අපිට එලක් නෑ. සත්ව පුද්ගල කතාවක් අපිට නෑ. අපි ගාව තියෙන්නෙ ආර්යය භූමියේ කතාවක්. ඒ ආර්යය භූමියේ කතාව සාමාන්‍ය මනුෂ්‍යයෙකුට ඇහෙන්නෙ එයාගෙම කතාව වගේ තමයි. හැබැයි ඒක එයාගෙ කතාව නෙවෙයි. ඔබ කතා කරන්නෙ පෘතග්ජන ස්වභාවයකින්. ඔබට ලෝකයක් තියෙනව කියල සංඥාවක් තුළ ඉඳගෙන ඔබ හැසිරෙන්නෙ. නමුත් ඔය ආත්ම සංඥාව අපි ළඟ නෑ. ඒක නිසා මේ ආර්යභූමියත් එක්ක බොහොම පරිස්සමින් කටයුතු කරන්න ඕනි. ඒක ඔබම හඳුනාගන්න.

ඇත්තටම මේ දහමට අවංකව යොමු වුන අය ඉන්නවනෙ. දැන් ගිහි අය වුනත් අපට කතා කරන කොට තේරෙනවා මෙයා අවකංව ම මේ මාර්ගයේ ඉන්නෙ කියලා. මේ මාර්ගය තුළ ආර්ය භූමිය පෘතග්ජන භූමිය නෙවෙයි. සත්ව පුද්ගල භූමිය නෙවෙයි. එතනින් මිදුන ස්වභාවය. සත්ව පුද්ගල භූමිය කියන්නෙ ආයතනවලට කොටු වුණ භූමිය. ඒ කියන්නෙ ඇස, කණ, දිව, නාසය, කය මත සිතුවිලිවලටත් කොටු වෙනවා. එතකොට සිතුවිලිවලට කොටුවෙලා, ආයතනවලට කොටු වෙලා ඉන්න භූමිය ලෝක භූමිය, ලෝක භූමිය කියන්නෙ සත්ව පුද්ගල භූමිය. ඒ සත්ව පුද්ගල දෘෂ්ටියෙන් බලන කෙනෙකුට ඇත්තටම දුක උරුමයි. මොකද එයාට ලෝකයක් තියෙනවා. එයාට දෙයක් තියෙනවා. ඒක නිසා එයා දුක් විඳිනවා. ඇත්තටම ඔතනින් මිදෙන්න බෑ ඔය ටික හොඳට අවබෝධ කර ගන්නෙ නැතුව. ආයතන ටික හොඳට අවබෝධ වෙන්න ඕනි. එතකොට මේ ආයතන නිසා නේද මේ සලායතන ලෝකෝ ලෝකෝ කියන්නෙ. කියන අවබෝධය තියෙන්න ඕනි. ඒ අවබෝධය තුළ තමයි ඇත්තටම මේ පරිවර්තනය සිද්ධ වෙන්නෙ. ඇත්තටම මෙහෙණින් වහන්සේලාගේ මේකෙ අධ්‍යාත්මික පැත්තෙන් අභ්‍යන්තර පරිවර්තන ස්වභාවය තමයි අපි දකින්නෙ. සාමාන්‍යයෙන් දැනුමක් තියෙන්න පුළුවන්

ඕන කෙනෙකුට. දැන් ආර්යයන් වහන්සේ එක්ක උනත් කතා කරනවා දැනුමෙන්. ආර්යයන් වහන්සේට යටින් දැනෙනවා හැම තිස්සෙම, සංඥාව දැනෙනවා තාම පරිවර්තනය වෙලා නැද්ද, තාම පරිවර්තනය වෙන්න තියෙනවද කියලා.

අපි අභ්‍යන්තර පරිවර්තනය තමයි මෙතනදි අගය කරන්නෙ. බුදුන් වහන්සේ පෝට්ල භික්ෂුවට කිවුව වගේ තමයි. බුදුන් වහන්සේ අගය කළේ නෑ දැනුම. මෙතනදි පරිස්සමින් කටයුතු කළ යුතුයි. මොකද ආර්යයන් වහන්සේට අවශ්‍යයයි ආර්ය භූමියට ප්‍රවේශ වන හැම කෙනෙක්ම හඳුනාගන්න. ඒ වගේම මුළු ලෝකයක්ම ඒක දැන ගන්නවා. ආර්යයන් වහන්සේ විවෘතව කතා කරන්නෙ. ඇට මස් ලේ දිය උනත් මේ හුස්ම බිංදුව පොළවට පස් උනත් ආර්යයන් වහන්සේ සියල්ල අත හැරලයි ආවේ. අතහැරියත් අතින් නෙවෙයි අත්හැරියේ භෞතිකව නෙවෙයි, අධ්‍යාත්මිකවයි. අධ්‍යාත්මිකව මේ සියල්ලම නුවණින් දැකල සුවිසුද්ධං කියන තැනට ආවේ නැත්තං අපිට බෑ මේ දේ කරන්න. ආර්යයන් වහන්සේ කරන්නේ මේ දුරකථනයෙන් කරන සන්නිවේදනය පමණයි. සන්නිවේදනය තුළ තමයි මේ සියල්ල සිදුවෙන්නෙ. ආර්යයන් වහන්සේ සමහර විට සැරෙන් කතා කරනවා. එහෙම කරන්නෙ මොකක් හෝ දෘෂ්ටියක් විසඳන්නයි. ආර්යයන් වහන්සේට තේරෙනව මේක සුදුසු නෑ ඉක්මනට විසඳන්න ඕනි කියලා. එතකොට පෘතග්ජන භූමියේ කෙනෙක් දකින්නෙ මෙහෙම වෙන්න බෑ. මෙහෙම සැරෙන් කතා කරන්න බෑ. ඒ ස්වභාවය හරි සැරයි. මේ ආර්යයන් වහන්සේ කියන්නෙ බයාදු නිවට කෙනෙක් නෙවෙයි. හිස ගසා දාන්න ආවොත් මෙන්න ගහල ඉවර කරන්න කියනවා. ඒ තරම් හයියක් තියෙනවා. ඒ හයිය අවතක්සේරු කරන්න එපා.

ආර්යයන් වහන්සේලා හිමින් කතා කරන, බිම බලාගෙන ඇවිදින, ගෝනි බිල්ලෝ කරන්න එපා. ආර්යයන් වහන්සේලා එහෙම අය නෙවෙයි. උන් වහන්සේලා ඍජුයි. සත්‍යය ඍජුව ප්‍රකාශ කරනවා. දස දහසක් ලෝක ධාතුව කම්පා වෙනවා. ආර්යයන් වහන්සේ මේ දේශනා කරන දේශනාවල හැම දෙයක් ම දේශනා වෙනවා. උපදින හැටිද නැවත

සකස් වෙන හැටි ද දස දහසක් ලෝක ධාතුව කියන්නෙ මොකක්ද, තිස් එක් ලෝක ධාතුව කියන්නෙ මොකක් ද මේවා සිත තුළින් දකින්නෙ කොහොමද, මේ ආත්ම දෘෂ්ටිය, ආත්ම සංඥාව මොකක් ද කියලා. ඇත්තටම මේ යුගයෙ ආත්ම සංඥාව වෙන් කරල ආත්ම දෘෂ්ටිය වෙන් කරලා මේක සිතුවිල්ලක් ය. මේක සංඥාවක්ය කියන්න තරම් දක්ෂයෙක් හිටියෙ නෑ.

ආර්යයන් වහන්සේ හුස්ම ටික වැටෙනකම් ඒ මහා සිංහනාදය ඒ ධම්ම අභිඥ්ඥාව තව තව තව තව බැබළෙනවා මිසක්, ගහන්න ගහන්න ඇගේ ගෙඩියක් තිබ්බොත් මොකද වෙන්නෙ. තව තවත ඉදිමෙනව නේද? ආර්යයන් වහන්සේ ඒ විදිහටම පිබිදෙනවා. ඒ පිබිදෙන්නෙ පුද්ගලයෙක් නෙවෙයි ධර්මයයි. බුද්ධ දර්ශනයයි. දර්ශන ඥානය කොයි තරම් ද කියන එක ප්‍රශ්න අහන්න අහන්න තමයි දැනෙන්නෙ. අන්න ඒ දර්ශන ඥානය ලෝකෙට හෙළි වෙනවා. තව තව විවර වෙනවා. පිරිසිදු වෙනවා. ඒ ධම්ම අභිඥාව කියන්නෙ මොකක්ද කියන එක අන්න ලෝකෙට විවර වෙනවා. ධර්ම ප්‍රචාරය කරන එක හොඳයි. ධර්ම කටයුතු කරන එකත් හොඳයි. ධර්මය දේශනා කරන එකත් හොඳයි පුද්ගල භාවයෙන් දකින්න එපා. කවුරු කිවුවත් ඒ ධර්මය ගන්න. බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ ලෝකෙට හෙළි කරන ඒ මහා සත්‍යය යුග පෙරළියක්.

**ගෞතම බුද්ධ ශාසනයේ අවසාන මගඵල ලාභීන් මේ බිහි වෙන්නෙ. ඔබ හිතනවට වැඩිය ඔබ නොදන්න දෙයක් ඔබේ කතාව ඇතුළේ තියෙනවා. ඔබ නිකන්ම සකස් වුණේ නෑ. ඔබ නිකම්ම ඉපදුණා නෙවෙයි. ඔබ නිකම්ම මේ දහම අවබෝධ කළත් නෙවෙයි. එහෙනම් මේ ලෝකෙ ඉන්න හැමෝටම ඒක අවබෝධ වෙන්න ඕනි. ඒක එහෙම වෙන්නෙ නෑ. ඔබේ තියෙන සුදුසුකම ඔබයි නැති කරගන්නෙ.** ඔබ මේ දහම අවබෝධ කරන්න මේ යුගයේ පහළ වෙලා තියෙන්නෙ නිවනින් සැනසීම ලබන්න. මේකට කිරි හට්ටියට ගොම බිංදුවක් දැම්මා වගේ දේවල් වෙන්න දෙන්න එපා. ඒ අපරාධය කරගන්න එපා. මෙතනින් ඔබ නිවනින් සැනසීම ලබන්න. ආර්යයන් වහන්සේ කැමති නෑ ඔබ ප්‍රපාතයට වැටෙනවට. ආර්යයන් වහන්සේට ඕනි අත දීලා ගොඩට ගන්න. ඒක එදා

ඉඳන්ම කියනවා. ඇඟිල්ලක් හරි මතු උණොත් ඒ ඇඟිල්ලෙන් හරි ඔබව ගොඩට ගන්නයි ආර්යයන් වහන්සේට ඕනි. ඔබ කණ්ණාඩියෙන් මූණ බලනවා වගේ ඔබ දිහාම බලන්න. ඔබ ආර්යයන් වහන්සේ සත්වයෙක් පුද්ගලයෙක් විදිහට නම් කවදාවත් ගන්න එපා. දැක්කත් ගන්න එපා දුටුවත් ගන්න එපා පෙනුනත් ගන්න එපා. ධර්මය විතරක් ගන්න. බුදු සමයටත් වැඩිය මේ යුගය දෘෂ්ටි කාන්තාරයක්. බුදුන් වහන්සේත් කියනවා දෘෂ්ටි කාන්තාරයක් කියලා. නමුත් අද ඊටත් වැඩිය දෘෂ්ටි කාන්තාරයක්. අපිට ඒක කියන්න වෙනවා.

මාපිටක සම්ප්‍රදායේ පොතේ තියෙනව කිවුවත් පිළිගන්න එපා. දෙයක් නැති බවමයි ධර්මය. ධර්මය හරි සුන්දරයි. ඒ තුළ දෙයක් නෑ. 'ධම්මං විනා නත්ථි පිතාච මාතා' කිවුවෙ ඒකයි. හොඳයි මෙහෙණින් වහන්ස, ඔබ වහන්සේලා අඩුපාඩු ගොඩක් හදාගෙන මේ මග යන බව තේරෙනවා. ඉතිං හැමෝගෙම ආශිර්වාදය හැමෝටම තියෙනවා. මේ මාර්ගය තුළ දියුණුවට පත්වන අය, මේ මග හඳුනාගන්න අය අනිත් අයට අත දේවි. හැමෝටම අපි කියනවා අත්වැල් බැඳගන්න. ඒක ගොඩක් වගේ අපි එකට ශක්තියක් වෙන්න ඕනි. එහෙම නේද? අපි හැමෝම විවෘත වෙන්න ඕනි.

අපි හැමෝම මමත්වය නැති කරගන්න ඕනි. කාගෙ හරි ආත්ම දෘෂ්ටියනෙ කුඩු කරන්න ඕනි. ඒකට ආර්යයන් වහන්සේලා දක්ෂ වෙන්න ඕනි. මෙයාට ආත්ම දෘෂ්ටිය තියෙනවා. ඒක තමයි කමටහන වෙන්නෙ කියලා. අංගුලිමාල ඇවිල්ල කියන්නෙ අර දරු ප්‍රසූතියෙන් ඉන්න අම්මත් දරුවෙක් ප්‍රසූත කරන වේදනාව ගැන එයාට ඇඟිලි කපන කොට මිනී මරන කොට වේදනාව තේරුණේ නැද්ද? තේරෙනවා නේද මෙතන පරිවර්තනය? අංගුලිමාලට දැනුනෙ අර ගුරු පූජාව විතරයි. අංගුලිමාලට ඉන් එහා දෙයක් තේරුණේ නෑ. නමුත් බුදුන් වහන්සේ ඇස් අරිනවා අංගුලිමාලගේ. අංගුලිමාල ඔබ කරන්නෙ ගුරු පූජාවක්. **නමුත් අංගුලිමාල මිනී මරන චේතනාවකින් නෙවෙයි ඒ දේ කරේ ගුරු පූජාවේ චේතනාවෙන්, බුදුන් වහන්සේට මේක අසුවුණා. අංගුලිමාලට අන්න ඔබ නවතින්න මම නැවතිලයි ඉන්නෙ කියල එතනින් අංගුලිමාලව**

**ගැලෙව්වා. මහණ බොරු කියන්නෙ නෑ. මහණ නැවතිලයි කියනවා. එහෙනම් මම කොහොම ද දුවන්නෙ. එහෙනම් සිත තමයි නැවතිලා තියෙන්නෙ.** අන්න ජේතවනාරාමයට අංගුලිමාල අරන් යනවා. අංගුලිමාල ගුරු පූජාව කරපු ඒ දෘෂ්ටිය සම්පූර්ණයෙන්ම අයින් කරනවා. අයින් කරල, අංගුලිමාල මේ මොහොත විතරයි තියෙන්නෙ. මේ මොහොතත් නෑ අංගුලිමාල, කෙනෙක් ආත්මයත් මෙතන නෑ අංගුලිමාලට කියනවා. මේක කියන එක තමයි භික්ෂුව කියන්නෙ.

භික්ෂුව කියන්නෙ සමුදය කියන්නේ දෙයක් නැති බව දකින එක. සමුදය අත්තගමන්චි කියන්නෙ එහෙම වුණොත් තමයි අත්තමය සිද්ධ වෙන්නෙ. "සමුදයංච, අත්තගමන්ච, ආස්වාදයංච, ආදිනයංච, නිස්සරනංච කියන්නෙ අන්න එතන දෙයක් තිබ්බොත් ඔබ එයට ඇලිලා ඔබ ආත්ම දෘෂ්ටිය තුළ පිනවනවා. විඳවනවා. ඒක තමයි කියන්නෙ ආදීනව දකිනවා කියලා. ඒක තමයි කයන්නෙ ආස්වාදය දකිනවා කියලා. එහෙනම් නිස්සරණය අත් හැරෙන්නෙ මේ සත්‍ය දැක්කොත් විතරයි. එතකොට භික්ෂුව කියන්නෙ අමුතු කතාවක් නෙවෙයි. ඔය සමුදයංච, අත්තනමන්ඩ, ආස්වාදයංච, ආදිනයංච නිස්සරනංච කියලා මේ වාක්‍යයක් කියලා භික්ෂු සූත්‍රය දේශනා කරලා දැන් මං භික්ෂුවක් කියලා, වාක්‍යක් කියල භික්ෂුවක් වෙනවද? නෑ. ඔබේ අභ්‍යන්තර පරිවර්තනයක් වෙන්න තියෙනවා. ඔබ එහෙනම් සමුදය, දෙයක් නැති බව දකින්න ඕනි. ඔබ එහෙනම් දෙයක් තියෙනව නම් ඔබත් ඉන්න බව දකින්න ඕනි. එහෙනම් ආත්මයක් නැති බව දකින්න ඕනි. එහෙනම් අනාත්මය තුළ දෙයක් නැති තැන ආත්මයක් නැති තැන ඔබට ඔබත් නෑ. මට මම නැති වන හැටි දකී නම් ඔබ ඔබේ නුවණට හසුවේ නම් ඔබ සැබෑ භික්ෂුවක්.

**ඒහි භික්ෂු භාවයෙන් පැවිද්ද උපසම්පදාව දරා ගන්න කියන්නෙ බුදුන් වහන්සේ අන්න එන එන අරමුණ, හැම තැනම 'රාත්‍රිය යම් සේද' දහවල ද එසේ ය. 'දහවල යම් සේද රාත්‍රිය ද එසේ ය' 'උඩ යම් සේද යටත් එසේ ය' 'යට යම් සේ ද උඩත් එසේ ය' අන්න බුදුන් වහන්සේ ම දේශනා කරනවා. "යථාපුරෝ තථාඅදෝ" "යථා දිවා තථාරාත්‍රි" මොනවද මෙතන කියන්නෙ. මෙතන දෙයක් නැති බව දකිනවා. මේ භික්ෂුවයි.** ඔබ

එවැනි කෙනෙක්. ඔබ දන්නෙ නෑ ඔබගෙ ආකල්ප පරිවර්තනයක් සිද්ධ වෙලා. මෙතන සත්වයෙක් පුද්ගලයෙක් නෑ අන්න භික්ෂුවක්. ඔබ භික්ෂුව දැක්කෙ කොහෙන්ද? රෙද්දෙන් ද? රෙද්දෙන් භික්ෂුව හොයන්න එපා. දශක ගාණක් තිබුණ මේ වඳින්නෙ සිවුරට, කියලා. නමුත් එතකොට අපිට තිබුණේ නෑ මේ පටිච්ච සමුප්පාද ධර්මය, මේ අධ්‍යාත්මික උපසම්පදාව තිබුණෙ නෑ. දැන් යුග ගණනක් ගෙවිල අන්තිමට ත්‍රිපිටකත් සිංහලයට පරිවර්තනය කරලා, මේ ත්‍රිපිටක පොත් ටික මේ බුද්ධජයන්ති පොත් ටික හදල ගැනීම අපේ භික්ෂූන් වහන්සේලා අතින් සිද්ධ වුණු විශාලම කර්තව්‍යයයි මේ යුගයේ. මේකෙන් තමයි අවදි වුණේ. මේ සාසනය පිබිදුණේ ඒ ආකාරයට කියලා අපි දකින්න ඕනි. මේක හැම පැත්තෙන්ම දකින්න ඕනි. ශාසනය සිතකයි සකස් වෙන්නෙ. හැබැයි සිතක සකස් වන දේ බාහිරින් පෙන්නෙ. එහෙනම් බාහිරිනුත් ඒක හැදෙන්න ඕනි. ආන්න ඊට පස්සෙ පුදුමාකාර ශාන්ත වචන ටිකක් ඇහෙනවා. මේවා හැමෝම දන්නවා. පානදුර අරියධම්ම හාමුදුරුවන්ගේ

"මම මේ මළුවට යනවා එනවා - බෝපත් බෝ මුල් මට පෑගෙනවා
සමාව දී මගේ පව් අරවනවා - බෝ රජුනේ මට අවසර දෙනවා"

කී දෙනෙක්ගෙ හදවත් නිවෙන්න ඇත් ද මේ වචනවලින්, ඒක යුග පෙරළියක්. අපි දකින්නෙ එහෙමයි. අන්න සීනු නාදයක් ඇහෙනවා නැවතත් මේ සසර දුකෙන් සසර ඕඝයෙන් මිදෙන්න පුළුවන් කියන පළවෙනි සීනුව ඇහෙනවා. අපේ සමාජය දැන් ගෝත්‍රිකත්වයෙන් ටික ටික මිදෙනවා. දැන් සුදුසු කාලයක් ඇවිත් තියෙනවා. යුග පෙරළියකට පස්සේ පටිච්ඡ සමුප්පාද ධර්මය ප්‍රායෝගික අත්දැකීම් සහිතව පරිවර්තනයක් ලෝකෙට හෙළි කරනවා. අභ්‍යන්තර පරිවර්තනයක් ලෝකෙට හෙළි කරනවා. ඇට මස් ලේ දියවිලා ගියත් කමක් නෑ කියලා. මේක පුළුවන් නම් නැති කරන්න. ඒක වෙන්නෙ නෑ. මේක ආර්යයන් වහන්සේගෙ මහා ඥානෙට හසු වෙනවා. ඒ අභිඥා ඥානයට හසුවන පරම සත්‍යය කියල දේශනා දැම්මෙ ඒ නිසයි.

ඒ අභිඥා ඇස නිකම් පහළ වුණේ නෑ. අපිත් අරූපයේ හිටිය. අපිත් අසංඥ තලයට වෙලා හිටියා. බුදුන් වහන්සේ පස්වග

තවුසන්ට බණ කියලා අන්න කොණ්ඩඤ්ඤට කියලා කොණ්ඩඤ්ඤ තාපසතුමාට එය නොවැටහුණා නම් බුදුන් වහන්සේ මේක කියනවද මේක කියන්න පුළුවන් ද කියලා. බුදුන් වහන්සේට සිතක් පහළ වෙනවා. මේ වගේ දෙයක් මෙතන තියෙනවා. අපිත් මේ දහම දේශනා කරල අවසානයේ අත හැරියා. අපි දේශනා කළේ භික්ෂූන් වහන්සේලාට. උන් වහන්සේලාට මේක තේරෙන්නෙ නෑ. නමුත් අවසානයෙ අපි නිහඬ වෙනකොට කොරෝනා වසංගතය හරියට නිකං වසන්තයක් විදිහට එනවා. වසංගතය වසන්තයක් වෙලා බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේගේ හුස්ම ටික යන්න සූදානම් වෙනවා. නෑ හුස්ම ටික දැන්ම යන්නෙ නෑ සංඥාවත් සකස් වෙනවා. මෙතන යමක් සිද්ධ වෙනවා මේ කාලක්‍රියාව සිද්ධ වෙන්නෙ නෑ. එහෙනම් මේ සිද්ධ වන දේ හොයන්න ඕනි. එහෙනම් මේ දේ වමාරන්න ඕනි. හොඳටම දැනෙනවා මොකක්ද මෙතන ඉතුරුවෙලා තිබුණෙ. ඉතුරුවෙලා තිබුණෙ එකම එකයි. මේ ධර්මය කිසිවෙකුට කියන්න බැරි වුණා දුන්නෙ නෑ කියන එක. එහෙනම් ඒක එළි කරන්න ඕනි. අන්න අපේ යුතුකම ගැන අපි හිතුවා. ඊට පස්සෙ මේ මෑත යුගයේ විශාල පරිවර්තනයක් සිද්ධ වෙනවා. මේ දේශනා පොඩ්ඩ පොඩ්ඩ අහපු අයට වැටහිලා නැවත කතා කරනවා. මුලින් සාකච්ඡා නෑ. පළමු දේශනා 600ම සාකච්ඡා නෑ. දේශනා 600ට පස්සේ තමයි සාකච්ඡා. ප්‍රතිපදා, ප්‍රායෝගික අත්දැකීම්, ප්‍රායෝගික පුහුණු වන ආකාරය වැනි විවිධාකාර විදිහට මේ දේශනා ඉදිරිපත් කෙරුණා. ඊට පස්සේ මේක පුහුණු වන අය අපට තේරුණා කතා කරන්න අවස්ථාවක් ඉල්ලනවා. විවිධ දේශනා දාමින් ගොඩක් උත්සාහ කරා. ඒ හේතුවෙන් නැති වුණ දේවල් නැවත ඇති වෙලා තියෙනවා. නැවත විවර වෙලා තියෙනවා. ගොඩක් අය මේ දේවල් හොයන්න අරගෙන තියෙනවා. ඒක ඉතා හොඳ දෙයක්. හො,යි තව කෙනෙකුට අවස්ථාව තියෙනවා ඔබගේ දහම් ගැටලුව ඉදිරිපත් කරන්න.

**උපාසිකාව :** තෙරුවන් සරණයි! ආර්යයන් වහන්ස. අර්යයන් වහන්ස, මට පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ඒක මෝඩ ප්‍රශ්නයක් ද මම දන්නෙ නෑ. මම බුද්ධ පූජාව එහෙම නිතරම තියෙන කෙනෙක් ඉස්සර

ඉඳලා. දැන් ඔබ වහන්සේගෙ ධර්මය අහල මට හිතෙනවා මේක නිකං මට ම වැඳ ගන්නවා වගේද කියලා සිතුවිල්ලක් එනවා.

**ආර්යයන් වහන්සේ :** එහෙනම් ඔබ තුමියට ඇහෙන්න ඇති අපි කිව්වු දේශනාවක බුද්ධ වන්දනාව කරන හැටි. මෙහෙමයි බුදුන් වඳින්නෙ. අපි බුදුන් වඳිනවා අම්මෙ කියලා දේශනාවක් ඇහුණේ නැද්ද? තේරුවන් සරණ යන හැටි කියන දේශනා ඇහුවද? කොහොම ද තෙරුවන් සරණ යන්නෙ කියන්න බලන්න.

**උපාසිකාව :** තෙරුවන් සරණ යනවා කියන්නෙ ආර්යයන් වහන්ස මට වැටහුණු විදිහට බුද්ධං සරණං ගච්ඡාමි කියන්නෙ රාග ද්වේශ මෝහවලින් අත් හැරුණා. ඒක අවබෝධ කර ගත්තා කියන එක.

**ආර්යයන් වහන්සේ :** නෑ. නෑ... තෙරුවන් සරණ යන්නෙ අවබෝධ කර ගන්න කලින්නෙ. කොහොමද තෙරුවන් සරණ යන්නෙ මාර්ගයෙ යන අය තෙරුවන් සරණ යනවා. කොහොම ද තෙරුවන් සරණ යන්නෙ? ඒක එන්නෙ ශ්‍රැතමය ඥානයෙන්. කොහොම ද ඒක එන්නෙ කියන්න බලන්න. මොකක්ද බුද්ධං සරණං ගච්ඡාමි කියන්නෙ. මොකක්ද ධම්මං සරණං ගච්ඡාමි කියන්නෙ. මොකක් ද සංඝං සරණං ගච්ඡාමි කියන්නෙ? ඇත්තටම **"සෝ ධම්මං පස්සති - සෝ මං පස්සති"** ධර්මය දකින්නායි බුදුන් දකින්නෙ. එහෙනම් කොහොම ද ධර්මයේ සරණ යන්නෙ. ශ්‍රැතමය ඥානය තියෙන්න ඕනි. අශ්‍රැතවත් පෘතග්ජන කෙනා මේ ධර්මය නොදන්න කෙනෙක්, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයායි තෙරුවන් සරණ යන්නෙ. ඒ කියන්නෙ අනිත් ආගම්වල ඉන්න අයනෙ අශ්‍රැතවත් පෘතග්ජනයා කියන්නෙ මිත්‍යා දෘෂ්ටික අයනෙ. ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා කියන්නෙ, බෞද්ධයෙක් කියන්නෙ එයාටනෙ. එයා භව නිරෝධය දකිනවනෙ. දෙයක් නැති බව දකිනවනෙ. ධර්මය තුළ දෙයක් හම්බවෙන්නෙ නෑනෙ. දෙයක් නැත්තං කෙනෙකුත් නෑනෙ. දෙයක් නැති බව දකින තැන අන්න අනුසෝතයෙන් මිදිලා පටිසෝතයට එන තැනයි අන්න බෞද්ධයෙක් කියලා කියන්නෙ. දෙයක් නැති බව දකින එකයි භව නිරෝධය දකිනවා කියන්නෙ.

අපිට දුක් එන්නෙ කොහොමද? දෙයක් තියෙන නිසා. ඇයි දරුවෝ නිසා නෙවේද අපිට දුක එන්නෙ. දරුවා කියන සිතුවිල්ලටයි අපිට දුක එන්නෙ. දෙයක් තියෙනවා නම් දුකක් තියෙනවා. දෙයක් නැත්තං දුකක් නෑ. එහෙම නේද? එහෙනම් අපි දුක් විඳින්නෙ දෙයක් තියෙන නිසා. එහෙනම් අපි දුක් විදන්නෙ දෙයක් තියෙන නිසා. එහෙනම් ධර්මය දකිනවා කියන්නෙ දෙයක් නැති බව දකින තැන අපට දුකක් එන්න හේතුවක් නෑ. අන්න **"නත්ථිමේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං"** දෙයක් නැති බව දකින තැන ඔබේ දුකෙන් ඔබ මිදෙනවා. හැබැයි දෙයක් නැති බව දකිනවා කියන්නෙ ධර්මය දකින්නම ඕනි. එහෙනම් දෙයක් හැදෙන්නෙ ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස යන මේ ආයතන හරහායි. ඒ ප්‍රසාදය හරහායි. ඒ ශබ්ද වර්ණවලින් හැදෙන එකක් කොහෙවත් තියෙනවද? නෑ නේද? ඔබට දුකක් එනකොට පෙඩ්ඩක් බලන්න. මේක චිත්තයක්. මේක ශබ්ද වර්ණවලින් හැදුණා සිතුවිල්ලකටයි අපි දුක් විඳින්නෙ. දරුවා අසනීපෙන්, දරුවා කියලා සිතුවිල්ලක් තියෙනවා. සිතේ තියෙන්නෙ. සිතින් තමයි දුක් විඳින්නෙ. තේරුණා නේද ඒ කතාව.

එහෙනම් අපි **"නත්ථිමේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණංවරං"** කියන්නෙ. **අපි අසරණ වෙලා ඉන්නෙ දෙයක් තියනවා කියලා හදාගත්ත ලෝකයක්, සිත තුළ හදාගත්ත ලෝකයක් තුළ අතරමං වෙලා. ඒ ලෝකයෙන් මිදෙන දවසට අන්න "විනෙය්‍යය ලෝකේ අවිද්‍යා දෝමනස්සානං" දුකෙන් මිදෙනවා. "නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං" කිවුවෙ ඒකයි. අපිට දුකක් ආවොත් අපි ධර්මය දකිනවා කිවුවෙ ඕකටයි. දෙයක් නැති බව දකින එකටයි.** "නත්ථිමේ සරණං අඤ්ඤං ධම්මෝමේ සරණං වරං" කියන්නෙ දෙයක් නැති බව දකින තැන. සියලු දුකෙන් මිදෙනවා. සියලු දුකෙන් මිදෙනවා. සියලු දුකෙන් මිදෙනව කියන්නෙ දෙයක් නැති බව දකිනවා කියන්නෙ "නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං" බුද්ධ කියන්නෙ සත්වයෙක් පුද්ගලයෙක් නෙවෙයි. දෙයක් තිබ්බොත් සත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවා. **සත්වයෙක් පුද්ගලයෙක් නැති ස්වභාවයක් අත් දකිනවා දෙයක් නොවන ස්වභාවයක් අත්දකිනවා. සත්ව පුද්ගල**

**දෘෂ්ඨියෙන් මිදුණ ස්වභාවයක් අත්දකිනවා. එහෙනම් බුද්ධං සරණං ගච්ඡාමි කිවුවෙ ඒකයි.** ඒ ස්වභාවයයි අපි සරණ යන්නෙ. එහෙනම් අපි සංඝං සරණං ගච්ඡාමි කියන්නෙ මේ එන එන අරමුණයි දකින්නෙ. එක අරමුණක සත්‍යයයි අපිට හැම මොහොතෙම පේන්නෙ. එක අරමුණකවත් අපි ඇලෙන් නෑ. ගැටෙන් නෑ. දෙයක් කරගෙන අපි දුක් විඳින්නෙ නෑ. "**එන එන අරමුණ දැක දැක මිදෙන එකයි සංඝං සරණං ගච්ඡාමි. නත්ථි මේ සරණං අඤ්ඤං සංඝෝමේ සරණං වරං**" කිවුවේ ඒකයි, තෙරුවන් සරණ ගිය සැබෑම ආර්යයන් වහන්සේ නමක් බවට පත් වෙනවා. ඒ කියන්නෙ ඔබ අසා ඇති සෝතාපන්න ආර්යයන් වහන්සේලා තෙරුවන් සරණ යන්නෙ කියලා. සෝතාපන්න මාර්ගයේ යන අයත් එහෙමයි. සෝතාපන්නයි කියන්නෙ අනුසෝතය නෙවෙයි පටිසෝතය.

අපි දන්නවා මේ ධර්මය තුළ අස්සජි මහරහතන් වහන්සේ බුදුන් වහන්සේ හඳුන්වලා දෙන්නෙ කොහොමද? **'යේ ධම්මා හේතු පභවා - තේසං හේතුං තථාගතෝ'** ඒ තථාගතයන් වහන්සේ දේශනා කරන්නෙ හේතුඵල දහමයි. අපි කර්ම ඵලයක් පොත්වල ලියාගෙන අපේ සමාජය අසරණ කළාට අපිට කරන්න දෙයක් නෑ. අපි සත්‍ය දේශනා කළ යුතුයි. සත්‍ය නම් සත්‍යමයි. අපිට මේ බෞද්ධයා අසරණ කරන්න බෑ. අපි මේ සත්‍ය දේශනා කළ යුතුයි. ඒ මහා සිංහනාදයක්. හැම කෙනෙක්ම තෙරුවන් සරණ යන්න ඕනි. සැබෑ බෞද්ධයෙක් වෙන්න ඕනි හැම කෙනෙක්ම. අපිත් ඉපදුණේ මිථ්‍යා දෘෂ්ටික පවුල්වල. අපත් කරේ මිථ්‍යා දෘෂ්ටික වැඩ. ඒත් අපි මේ සත්‍ය දැකලා මිදුණා. ඇයි ඔබට ඒකට අවස්ථාවක් නැද්ද? ඔබත් අන්ධයෙක් වගේ ඉපදිලා අන්ධයෙක් වගේ ඉදලා අන්ධයෙක් වගේ මැරිලා යන්න ඕනි ද? අපේ හුස්ම ටික ගියාදෙන්. ඔබ සසර දුකෙන් මිදේ නම් අපි ඒ කැප කිරීම් කරනවා. එයයි ආර්ය භූමිය. එයයි ආර්යන් වහන්සේලාගේ ස්වභාවය. එහෙම නේද? දැන් ඔබ දන්නවා තෙරුවන් සරණ යන්න. දැන් ඔබට පුළුවන් බුද්ධ වන්දනා කරන්න. ඔබේම සිත තුළ බුද්ධ ස්වභාවය අවදිවෙන එකට වන්දනා කරන්න."නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධධෝ, විජ්ජා සරණ සම්පන්නෝ" අන්න දැන් කියන්න ගාථාව

**උපාසිකාව :** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** සියලු දෘෂ්ටිවලින් මිදිලා විජ්ජාවලින් අවිද්‍යාවෙන් මිදිලා සත්‍යයට එන්න. පුදුමාකාර දහමක් ලෝකෙට එළි වෙනවා. ලොවක් සැනසෙන දහම් පදයක් හැමෝටම ඇහෙනවා. සෑම දිනකම උදෑසන අන්න දහම් පදයක් ඇසෙනවා. ධර්මය ඇසෙන මේ මනුෂ්‍ය සත්වයා කොයිතරම් සැනසීමක් ලබනවද? ඒකයි කිව්වේ අර උදෑසන හිමිදිරි පාන්දර අරුණාලෝකෙ වැටෙන කොට අවිද්‍යා ඝණදුර පහව යනවා. විද්‍යා ලෝකය මතු වෙනවා. ප්‍රඥා ලෝකෙ දසත පැතිරෙනවා. සැනසුම් සුසුමක් දසත හමනවා. මේ මනුස්සයා සැනසෙන්නෙ මේ සත්‍ය ධර්මය ලෝකෙට අවදි වුනොත්. අවිද්‍යා ඝනදුර පහවෙලා ගියොත්. ඒ මිත්‍යා දෘෂ්ටිය සුනුවිසුණු වෙලා ගියොත්. ඒ ප්‍රඥා ලෝකය අවදි වුණොත්. ගස්වලට තොතේරුණාට සතුන්ට නොතේරුණාට මේක මනුස්සයාට තේරෙනවා. එයයි සිතෙන් මිදෙන මග, එයයි දුකෙන් මිදෙන මග එයයි නිවන් දකින මග. එයයි නිස්සරණ මග.

**උපාසිකාව :** සාධු... සාධු... සාධු....

**ආර්යයන් වහන්සේ :** සාධු කියනවා නෙවෙයි අම්මේ, සාධු කියවෙනවා. ඒ ගෞතම බුද්ධ සාසනය නැවත පිබිදෙන යුගය ඇවිල්ලා. ඒ සත්‍ය ධර්මය ලෝකෙට අවදි වෙනවා. ඒ සදාතනික සුවයක් හැමෝටම අත්දකින්න ලැබෙනවා. ඒ අනුත්තර ස්වභාවයට හැමෝම අවදි වෙනවා. එහෙම නොවේද?

**උපාසිකාව :** එහෙමයි, ආර්යයන් වහන්ස.

**ආර්යයන් වයන්සේ :** සැබෑම ආර්යයන් වහන්සේලා සුන්දරයි. සුන්දර කතාවක් කියනවා. ආර්ය භූමිය හරි සුන්දරයි. ඇස් ඇත්තෝම දකිත්වා කිවුවා වගේ. තව කෙනෙක් ආර්යයන් වහන්සේට Call එකක් දෙන්න ගියොත් ඒක වළක්වන්නත් එපා. ආර්යයන් වහන්සේලා ඉන්නෙ සත්‍යය හෙළි කරන්නයි. ආර්යයන් වහන්සේ ඒ වෙනුවෙන් තමයි කටයුතු කරන්නෙ. ආර්යයන් වහන්සේ සත්‍ය ධර්මය ලෝකෙට හෙළි කරන්නෙ

ආර්යයන් වහන්සේලා හරි සෘජුයි. ආර්යයන් වහන්සේලාට අමුතුවෙන් කියන්න කරන්න දෙයක් ඉතුරු වෙලා නෑ. ආර්යයන් වහන්සේලාට ලොකු භයියක් තියෙනවා. ඒ භයිය ස්වභාදහම. මහපොළාවෙ ඇවිදින්නෙ. මේ හැමෝටම කියන්න දෙයක් තියෙනවා මේ ධර්මය අහන. මහපොළොවෙ ඇවිදින්න කියලා, ලොකු ලොකු දේවල් හොයන්න එපා කියලා, සාමාන්‍ය විදිහට කටයුතු කරන්න කියලා. බුදුන් වහන්සේත් සිවුර අවසානයේ ගන්න බැරි නම් පෙරහන්කඩයකටත් අරගෙන ඒක ගන්න බැරි නම් පටිවලට කපල අරගෙන වැල් බඳින්න කියලා පුදුමාකාර විදිහට අල්පේච්ඡතාවය පෙන්නනවා. ආණ්ඩදාපු සිවුරක් ඇඳපු උත්තමයන් වහන්සේ නමක් ඒ උත්තරීතර තථාගතයන් වහන්සේ. උන් වහන්සේ ගිය මගයි මේ කියන්නෙ. අපි යන්නෙත් ඒ මග. මේ මාර්ගයට ආවට පස්සෙ අපිට පුද්ගලයෙක් නෑ. මේ ස්වභාවය ඇතුළේ දෙයක් නෑ. කෙනෙක් නෑ. මොනව රකින්නද? මොනව කරන්නද? අපිට ඔය එකක්වත් වැඩක්. නමුත් මේ දහම ලෝකෙට දෙන්න ඕනි නිසා යම්කිසි ආකාරයකට ආර්යයන් වහන්සේ කටයුතු කරනවා, මේ දහම ලෝකයට දෙන්න බෑ නැත්නම්.

ආර්යයන් වහන්සේ බුද්ධ නිකායෙන් පෙනී සිටින්නෙ. එය සියලු නිකාය යටයි බුද්ධ නිකායට. භික්ෂූන් වහන්සේලා කිව්වා. ඔබ වහන්සේ මේ නිහඬව මේ දහම දෙන්න. මේ දහම ලෝකෙට හෙළි කරන්න කියලා. ඔබ වහන්සේ දේශනා කරන ධර්මය අපට ප්‍රත්‍යක්ෂයි. අපි කැමතියි දවසක එළියට එන්න. ඒ සත්‍ය ධර්මය ලෝකෙට දේශනා කරන්න. අපි ලෑස්තියි කියන භික්ෂූන් වහන්සේලා අද ඉන්නවා. නිහඬව ඉන්නවා නිකාය ඇතුළෙ ඉඳලා කියාගන්න බැරිව මේක තමයි ඇත්ත කතාව. මේ සත්‍යය ධර්මය මහා සිංහනාදයක්. මේක සමථ භවනාව නෙවෙයි. විදර්ශනා භාවනාව කියන්නෙ විදසුන් නුවන තුළ මතු වෙනවා දෙයක් නැති ස්වභාවයක්. ඒ දෙයක් නැති ස්වභාවය විදසුන් නුවණටයි හසු වෙන්නෙ. මේක අත් දෙක තියාගෙන ඉන්න එකක් නෙවෙයි. මේක එහෙම එකක් නෙවෙයි. සතර ඉරියව්වෙන්ම තොරයි මේ විදර්ශනා ඛණික සමාධිය. ඒ ඛණික සමාධිය සතර ඉරියව්වෙන්ම තොරයි. ඒක භික්ෂූන් වහන්සේලා දන්නවා. අර සංකාර උප්පත්ති සූත්‍රය තුළ තිස් එක් ලෝක

ධාතුවම සිත තුළින් දකින කොට දිව්‍ය ලෝකයක් එළියෙන් හම්බවෙන්නෙ නෑ. මේක භික්ෂූන් වහන්සේලා දන්නවා. ඒක නිසා ප්‍රථම නිබ්බාන සූත්‍රය දේශනා කරන්න භයියක් නෑ. න පඨවි, න ආපෝ, න තේජෝ, න වායෝ, න ආකාසංඥා, න විඤ්ඤාණායතනං, න නායං ලෝකෝ - මෙලොවක් නෑ, න පරලෝකෝ - පරලොවක් නෑ, න උභෝ චන්දිමෝ, සූර්යයෝ, සඳහිරු කියලා දෙයක් නෑ, න ගතිං, නතිතිං න චුතිං න උප්පත්තිං න අපටිත්තං, න අපවත්තං, න අනාරම්මනං ඒ සෝ වන්තෝ දුක්ඛස්සාති කියන වාක්‍ය කියන්න බෑ. මෙලොවක් නෑ පරලොවක් නෑ කියන්න පුළුවන් මේ මාර්ගය තුළ දියුණුවට පත් වුණාට පස්සෙයි. ඒකට හේතුව මෙතන කෙනෙක් නෑ, දෙයක් නෑ. අර හේතුඵල දහමට එනවා. සෝතාපත්ත මාර්ගයට එනවා. නියත සම්බෝධි පරායන වෙනවා. සුගති පරායන වෙනවා.

හැබැයි ඔබ කර්ම භූමියේ හිර වෙලා ඉන්න තාක්කල් මෙලොවක් තියෙනවා පරලොවක් තියෙනවා ඔක්කොම තියෙනවා කියලා. ඔබ ඉන්නවා. **ඔබට ලෝකයක් තියෙනවා. දෙයක් තියෙනවා. එහෙනම් ඔබට උපතකුත් තියෙනවා. මරණෙකුත් තියෙනවා. දෙයක් තියෙනවා. එහෙනම් ඔබට උපතකුත් තියෙනවා. මරණෙකුත් තියෙනවා. ඔබට එහෙම දැනෙන තාක්කල් ඔබ උපදිනවා. ඔබට ඉන්නවා වගේ දැනෙන තාක්කල් ඔබ උපදිනවා.** ඒක වෙන හැටි අපි අභිඥා දේශනාවල පැහැදිලි කරනවා. ඔබට ඒකෙන් ගැළවෙන්න බෑ මේ දෘෂ්ටියෙන් ගැලවෙනකම්. මේ දෘෂ්ටියෙන් ගැලවෙන්නෙ නෑ මේ දර්ශන ඥානය පහළ වෙනකම්. මේ දර්ශන ඥානය පහළ වෙන්නෙ නෑ හිත හැදෙන හැටි අවබෝධ වෙනකම්. සිත හැදෙන හැටි අවබෝධ කරන්න වෙනවා කියන්නෙ අන්න රූපය පර්ජානාති වෙන හැටි දකිනවා. එහෙනම් රුප්පනය තුළ මෙතන ආත්මයක් හැදෙන හැටි දකින තාක්කල් ඔබ සසර ඕඝයෙන් මිදෙන්නෙ නෑ. මේක අතැඹුලක් වගේ එකට අරගෙන පෙන්වල දෙන්න පුළුවන්. පුදුමාකාර දහමක් ලෝකෙට හෙළි වෙනවා. එහෙම නේද?

**ආර්යයන් වහන්සේ :** බය හිතෙනවනෙ. හරි ගාම්භීරයිනෙ නේද? ඒකට හේතුව බය කියන්නෙ කෙනෙක් ඉන්නවා නේද?

**උපාසිකාව :** එහෙමයි ආර්යයන් වහන්ස, මම ඒකත් අවබෝධ කරගෙන තියෙන්නෙ.

**ආර්යයන් වහන්සේ :** ඉන්න කෙනා නැති කර ගන්න නේද Call එක ගත්තෙ. පුදුම කතාවක් මේ නේද? ඉන්න කෙනා නැති කර ගන්න Call එකක් ගත්ත කියන එක. ඇත්තටම එහෙම දෙයක් නෙවෙයි පෘතග්ජන භාෂාවෙන් අපි කතා කරන කොට සම්මුතිය තුළ එහෙම තමයි කියවෙන්නෙ. හැබැයි මෙතන එහෙම දෙයක් නෙවෙයි තියෙන්නෙ. මෙතන තියෙන්නෙ සත්‍ය අවබෝධ වෙන එක විතරයි. සත්‍ය අවබෝධ වෙනකොට මායාව අවබෝධ වෙනවා. බොරුව අවබෝධ වෙනවා නේද? ඒක තුළ අභ්‍යන්තර පරිවර්තනයක් සිදු වෙනවා. මෙන්න මෙතනයි රහස තියෙන්නෙ. ඔබතුමියගෙම අභ්‍යන්තරයේ ඉන්නවා වගේ දැනෙන ගතිය නැති වෙනවා. මේක හිතාගන්න බැරි කතාවක්. මේක උනාට පස්සෙ ඔබතුමියට ආයේ කවුරුත් කියන්න ඕනි නෑ. ඔබ තුමියට ප්‍රත්‍යක්‍ෂයි. එදාට ඔබ තුමිය දන්නවා. ඒක තමයි බුදුන් වහන්සේ කියන්නෙ මේක ප්‍රත්‍යක්‍ෂ දහමක් කියලා. මේක සාන්දිට්ඨික ධර්මයක් තමන්ටමයි දැනෙන්නෙ. සාන්දිට්ඨික, අකාලික, ඒහි පස්සික, ඕපනයික පච්චුප්පන්න ධර්මය කිවුවෙ ඒකයි. මේකට තුන් කාලයක් නෑ. මේක මේ මොහොතෙම අවබෝධ වෙනවා නේද? හැම මොහොතම ඒ මොහොත විතරයිනෙ. එතකොට ඔබ තුමිය මේ දහම ගැන අහන කොට තෙරුවන් ගැනනෙ ඇහුවෙ. බුද්ධ වන්දනාව ගැනනේ ඇහුවේ? ඇයි නිවන ගැන ප්‍රශ්නයක් ඇහුවෙ නැත්තෙ?

**උපාසිකාව :** ඇත්තටම මට මෙතන දෙයක් නෑ කියන එක ගැන හොඳ අවබෝධයක් තියෙනවා ආර්යයන් වහන්ස. ඒ වුනාට මගේ මහත්තයාගෙ බලාපොරොත්තුව දාන දීලා ලෞකික පැත්තෙන් සසර දිගටම යන්න. මමත් බුද්ධ පූජාව කියලා උදේට වැඩ පටන් ගන්නෙ. මම මේ දහම අහල මේක නතර කරොත් මහත්තයාගේ තියෙන නැඹුරුව නැතිව යයිනෙ කියල ලොකු බයකුත් තියෙනවා. ඔය ප්‍රශ්නෙ මට තිබුණ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඇත්තටම මෙහෙම දෙයක් තියෙනවා. අපි සම්මුතිය තුළ ඔබ තුමියට ඇහෙන්න ඇති කියනවා වෙසක් කාඩ් එකත් වටිනවා, තොරණත් වටිනවා, දන්සැලත් වටිනවා, සල්පිලත් වටිනවා. අපිටත් ළමා කාලයක් තුබුණා. ළමා කාලයේ සුන්දරත්වය අපි දැක්කා. වෙසක් කූඩුවක් හදන එක කොච්චර ෂෝකද? ඇත්තටම මේ සුන්දරත්වයට සිත නිවෙන් නැද්ද? සිත නිවෙනවා. නිවන් දකින්නෙ නැති වෙන්න පුළුවන්. හැබැයි සිත නිවෙනවා. මේ දරුවෝ මේක කරන්න ඕනි. ඒක මිථ්‍යා දෘෂ්ටියකින් මිදෙන්න තව මිථ්‍යා දෘෂ්ටියක ගැට ගහන්න එපා. මේවත් එපා අරවත් එපා කියලා කියන්න හොඳ නෑ. ඒ කියන්නෙ සම්මුතියනෙ පුතේ අපි කරමු.

අපිට කියන්න ඕන දේ තමයි දන්සැලත්, වෙසක් කාඩ් එකත් සල්පිලත් හැමදේම වැදගත්. ඒ මනුස්සයින්ගෙ පිබිදීමක් තියනවා. ඇත්තටම පෘතග්ජන මනුෂ්‍යයන්ට මේ දහම එක වරම අවබෝධ කරන්න බෑ. ඒ මනුස්සයා වන්දනාවෙ යනවා. ඒ මනුස්සයා කතරගම යනවා. අනුරාධපුරේ යනවා අටමස්ථාන වඳින්න. ඒ මනුස්සයාගෙ හිතේ යම්කිසි පැහැදීමක් ඇති වෙනවා. ගාථා කියන එක. බෝධි පූජා කවි කියන එක ඇත්තටම මේ හැම එකම හොඳයි. මෙත් මල් අරණ කියලා ආරණ්‍යය මේ හැමතැනම හැදෙනවා. මිනිස්සු කියනවනේ අපේ මළ ගිය අයට පින් දෙන්න ඕනි කියලා. කමක් නෑ. ඔබ සතුටු විදිහට කටයුතු කරන්න. කවුරු හරි මනුස්සයෙක් දුක කිවුවොත් අහගෙන ඉන්න. මට මේකට පිං දෙන්න කිවුවොත් පිනුත් දෙන්න. තේරෙන්නෙ නෑනෙ. මේ මනුස්සයට කටින් කියන එකක්නෙ. මේ මහලොකු වරදක් නෙවෙයිනෙ. පස්සේ ඒ මනුස්සයට හෙමීට හෙමීට ඒ මනුස්සයත් එක්ක එකතු වෙලා ඒ මනුස්සයට දහම දෙන්න. හැබැයි එකපාරටම මේවා කිවුවොත් ආයෙ ඒ ආරණ්‍යයට එන්නෙ නෑ. මේ පැත්තෙ ඉන්න ඕනි අහගෙන ඉන්න පුළුවන් කෙනෙක්. දුක අහගෙන ඉන්න පුළුවන් වෙන්න ඕනි. සමහර විට ඔබ තුමියට උණත් ඇහෙනවා ඇති Youtube එකේ ආර්යයන් වහන්සේ ඉන්නවා ඔහේ අහගෙන. ඔහේ කියාගෙන කියාගෙන යනවා කතාව. ඔබතුමිය කතාව කිවුව වගේ. ඊට පස්සෙ එයාට පැහැදීමක්

ඇති වෙනවා. මගේ කතාව අහගෙන හිටියනෙ. අන්න පැහැදීමක් ඇති වෙනවා. ඊට පස්සෙ එයාගෙ කෙනෙක් කර ගන්නවා. ආර්යයන් වහන්සේට මේක දැනෙනවා. ආර්යයන් වහන්සේ පැයක් කෙනෙක් එක්ක සාකච්ඡා කරොත් ඒ කාලය අවසන් වෙන කොට ආර්යයන් වහන්සේ එයාට දැනෙන්නෙ එයාගෙ කෙනෙක් වගේ. අන්තිමට ඔක්කොම ටික කියනවා. පුද්ගලික ඒවත් කියනවා. ආර්යයන් වහන්සේ තමන්ගේ කෙනෙක් වගේ දැනෙනවා. ඊට පස්සෙ ආර්යයන් වහන්සේ කියන දේ අහනවා. ආර්යයන් වහන්සේ විශ්වාස කරනවා. ඊට පස්සෙ කියනවා ආර්යයන් වහන්ස මම මොකක්ද කරන්න ඕනි කියලා. මට කියන්න ආර්යයන් වහන්ස. මම කරන්න ලෑස්තියි. අර පැහැදීමක් ඇති වෙනවා. ඡන්දයක් ඇති වෙනවා. "ඡන්දං ජනෙති" නිවනටත් ඡන්දයක් ඕනි. බණ අහන්නත් ඡන්දයක් ඕනි.

ආර්යයන් වහන්සේත් එක්ක එකමුතු වෙන්න ඕන් නැද්ද බණ අහන්න. ආර්යයන් වහන්සේ හම්බවෙන්න බැරි වුණත් මොකද? මේ දේශනා කරන ධර්මයනෙ වැදගත්. ඕක කාටවත් නරකක් වෙන්නෙ නෑනෙ. ගැලපෙන්නෙ නෑ ඔබ හිතන විදිහට. නමුත් ඒ මනුස්සයා ඒක අවබෝධ කරනවනෙ. ඒ මනුස්සයාටනෙ ඒක වැදගත් වෙන්නෙ. ඔය කියන ශබ්දයවත් එකවත් නෙවෙයි. වැදගත් වෙනනෙ මේ මනුස්සයා මේ ධර්මය අවබෝධ කරගන්න එක. ආර්යයන් වහන්සේට ඕනි මේ දහම දෙන්නයි. ආර්යයන් වහන්සේට ඕනි එක මනුස්සයෙක් හරි එයාගෙ ඊගෝ (ආත්ම දෘෂ්ටියෙන්) එකෙන් නිදහස් කරල එයාව ස්වභාව දහමට එකතු කරලා දෙන්නයි. එයාට දැනෙන සැහැල්ලුව ආර්යයන් වහන්සේට තේරෙනවා. එයා ඒ සැහැල්ලුව අත් දකිනවා. අද කී දෙනෙක් නම් ඒ සැහැල්ලුව අත් දකිනවද? ඒ සැහැල්ලුව ආර්යයන් වහන්සේට තේරෙනවා. අංගුලිමාල මිනී මරුවෙක් කිය කිය හිටිය නම් මොකද වෙන්නෙ. බුදුන් වහන්සේ අංගුලිමාල ඔබ මිනීමරුවෙක් නොවෙයි. අංගුලිමාල සූත්‍රය බලන්නකො අන්තිමට කියනවනෙ මම කිසි දවසක මිනියක් මරල නෑ. ඒ ආනිශංස බලයෙන් මේ අම්මගෙ විලිරුදාව සනීප වේවා කියලා. අංගුලිමාලට ඕක බුදුන් වහන්සේ කිවුවම අංගුලිමාල අහනවා මම කොහොමද එහෙම

අධිෂ්ඨානයක් කරන්නෙ. මම කොච්චර මිනී මරලා තියෙනවද? එතකොට අංගුලිමාලගෙන් බුදුන් වහන්සේ අහනවා, අංගුලිමාල ඔබ භික්ෂුවක් විදිහට මිනී මරලා තියෙනවද? නැහැනේ ස්වාමීනි. භික්ෂුව කියන්නෙ දෙයක් නැති බව දකින තැන.

# 03

# ඔබේ හීන ලෝකය, ඔබේ ගති පුරුදුයි

**ආර්යයන් වහන්සේ :** අපි ඇත්තටම බැලුවොත් සතා සිවුපාවට හිතෙයි ද ඇයි අපි ඉපදුනේ කියලා. ඇයි අපි ජීවත් වෙන්නෙ. ඇයි අපි මැරෙන්නෙ කියලා. සතෙකුට තේරෙන්නෙ නෑ. හොඳට බලාගෙන ඉන්න මේ සත්තු දිහා. මේ සතාට පේන් නැද්ද? මේ සතාට ඇහෙන් නැද්ද? මේ සතාටත් දැනෙන් නැද්ද? අපි ඉත්ථභාවය සත්වභාවය ඉපදීමක් තියෙනවා නම් මරණෙකුත් තියෙනවා. මේක මේ සතාට දැනෙනවා. සතාට දැනෙනවා නැති වෙන බව. සතාත් හැම තිස්සෙම ඉන්නෙ මර බියෙන්. බලන්න මේ කුරුල්ලෝ, ලේන්නු මේ සත්තු කොයි තරම් මර බියෙන්න්ද ඉන්නෙ. ලොකු සතෙක් ඇවිල්ලා පොඩි සතෙක් ඩැහැගෙන යනවා. ඉතිං පොඩි සතෙක් ලොකු සත්තු එනකොට කෑ ගහනවා. මර බියෙන් කෑ ගහනවා. අපි අනන්තවත් දකිනවා මේ වනාන්තරය ඇතුළෙ ඉන්න කොට අහසෙ පියාඹන රාජඅලි, උකුස්සෝ වගේ සත්තු. හරියට ඉන්නවා. මේ අය කැරකිලා එනවා පල්ලෙහාට. යන්තං පල්ලෙහාට එනකොට කුරුල්ලො කෑ ගහගෙන යනවා පියාඹගෙන. අපි දැකලා තියෙනවා ඇනිමල් නාලිකාවෙ කොටියෝ. කොටියගෙ ආහාරය වෙන්නෙ මාංශය. ඉතිං කවුරු හරි සතෙක් මරාගෙන කන්න වෙනවා. කොටියට ඒක දැනෙන්නෙ ආහාරයක් විදිහට විතරයි. කොටියට දැනෙන් නෑ මේ සතා මරාගෙන කනවා කියලා. කොටිය හිතන්නෙ නෑ මේ සතා අඬනවා කියලා. ඒත් අපි දැකලා තියෙනවා ඒ කොටියා වතුර බොන්න දිය කඩිත්තට යනකොට කිඹුලා ඇවිල්ලා කොටියව ඩැහැගන්නවා. එතකොට ඒ සතා මරබියෙන් කෑ ගහනවා. මේක පුදුම කතාවක්. මේ ඔබට තියෙන කතාවමයි. මේ ඔබේ කතාවමයි.

ඇත්තටම පටාචාරාට වගේ දරුවො නැතිවෙලා ගෙවල් දොරවල් නැතිවෙලා යාන වාහන නැති වෙලා අම්මා තාත්තා නැති වෙලා උන්හිටි තැන් අහිමි වෙලා එහෙම වෙන්නම ඕනි ද මේක දැනෙන්න. අපිට ඒක දැනෙන්න ඒක වෙන්නම ඕනි ද? කවුරු හරි අහනවා ඇයි අපි නිවන් දකින්නෙ? ඇයි ආර්යයන් වහන්සේ සේරම අතහැරල මෙහෙම කරන්නෙ? ඇයි මෙහෙම හුදකලාව කැලේට වෙලා ඉන්නෙ. මොකද මේ වෙලා තියෙන්නෙ? ආර්යයන් වහන්සේගෙන් හරියට මේක අහනවා. ඇයි මේ කැලේ තනියම ඉන්නෙ කියලා. ආර්යයන් වහන්සේට හැම තිස්සෙම මේක දැනෙනවා. සමහර විට මේක දැනෙන බොහෝ අය ඇති. හුදකලාව ඇලුම් කරනවා පිරිසට වැඩිය කැමති හුදකලාව ඉන්න.

හුදකලාව ඉන්න කොට හොඳට දැනෙනවා. ලෝකය හොඳට දැනෙනවා. ලෝක ස්වභාවය හොඳට දැනෙනවා. එතකොට ඔබත් හුදකලාව අලුම් කරනවා ඇති. වෙලාවකට හිතෙනවා මේ කතා කරන එකත් මොකටද කියලා. ඔව් ඒක ඇත්ත. අපිටත් ඒක දැනෙනවා. කතා නොකර ඉන්නවා නම් තවත් හොඳයි කියල හිතෙනවා. හුදකලාව ඇලුම් කරන එක සාමාන්‍ය දෙයක් වෙනවා. ඔබත් සමහර විට එහෙම වෙන්න ඇති. කෙනෙකුට හුස්ම යනකොටම මෙහෙම තේරුණා කියල ගළපගන්න බැරි වෙයි. ජීවත් වෙලා ඉන්න කොට හොඳට ඉන්න කොට මේ සත්‍ය දැනෙනවනම් කොච්චර හොඳයි ද? ඒක දැනගෙන සාමාන්‍ය විදියට කටයුතු කරන්න පුළුවන් නම් කොච්චර හොඳයි ද? එතකොට ඔබට පටාචාරට වගේ දරුවො නැති වෙන කොට අසනිප වෙන කොට, ගෙවල් දොරවල් නැති වෙන කොට, අම්මා තාත්තා නැති වෙන කොට ඉන්න තැනක් නැති වෙන කොට මිල මුදල් නැති වෙන කොට ඒක ඔබට සාමාන්‍ය දෙයක් වෙනවා. ඔබට ලොකු ගින්නක් නෑ. ඔබට හැකියාව ලැබෙනව සාමාන්‍ය විදිහට ඉන්න. මේක නේද ස්වභාදහම. ඇයි ඔබ ඒකට හැමදාම සූදානමින් හිටියා. අපි ඔබට නිතරම කියපු වචනයක් තියෙනවා මේ මහ පොළොවෙ පය ගහලා ඇවිදින්න ඕනි.

අපි මහපොලොවෙ පය ගහලා ඇවිදිනවා කියලා ඔය කොච්චර මොන දේවල් කිවුවත් ආර්යයන් වහන්සේ කොච්චර බණ කිවුවත් මොන දේවල් කොහොම කතා කරත් මේ මහ පොළොවෙ පහ ගහල

ඇවිදිනවා කියල කිව්වා. මේකට හේතුව මේකයි. ආර්යයන් වහන්සේ ඇත්තටම සමහර වෙලාවට උස් හඬින් කතා කරාම බොහෝ අයගෙ හිත රිදෙනවා. ආර්යයන් වහන්සේ කරුණාවෙන් කතා කරාම බොහෝ අයගෙ හිත පැහැදෙනවා. ඒත් ඒ දෙකම තේරුමක් නෑ කියල තේරෙනවා. අර සන්නිවේදනය සඳහා පමණයි මේ වචන භාවිතා වෙන්නෙ. වෙන අදහසක් අපට තියෙන්න බෑ. ඇත්තටම මේ ආර්ය භූමියට එන කොට ආර්ය භූමිය හඳුනාගන්න කොට ඔබට ජීවිතය ගැන හොඳ අවබෝධයක් තියෙන්න ඕනි. එහෙම නැත්නම් ඇත්තටම මේ ආර්ය භූමිය හඳුනා ගැනීම කොහොමද සිද්ධ වෙන්නෙ. ඇත්තටම ආර්ය භූමිය කියන්නෙ කුමක් ද? ආර්ය භූමිය කියන්නෙ මේ සත්ත්ව පුද්ගල දෘෂ්ටියෙන් මිදුන භූමිය. **ලෝකයක් තියෙනවා කියලා දෙයක් තියෙනවා කියලා අපි හිතින් හදාගන්න ලෝකෙක අතරමං වෙලා මායාවකට කොටු වෙලා ඒ මායාව තුළ මායාවෙන් මිදිලා සත්‍ය ලෝකයට අවදි වීමයි ඒ ආර්ය භූමියට ප්‍රවේශ වෙනවා කියන්නෙ. "අරියානං දස්සාවි අරිය ධම්මේසු කෝවිදෝ - අරිය ධම්මෝ විනයෝ" ඒ ආර්ය භූමිය දකින්න ඔබ දක්ෂ වෙන්න ඕනි.** එහෙනම් ඔබ ඔබේ ජීවිතය දිහා බලන්න දක්ෂ වෙන්න ඕනි.

අපි ඉස්සෙල්ලම දකින්න ඕනි තමන්වමයි. දෙයක් තියෙන තැන ලෝකයක් තියෙනවා. ලෝකයක් තියෙන තැන ඔබත් ඉන්නවා. දෙයක් නැති තැන ලොවක් කොයින්ද? **ලොවක් නැති තැන ඔබටත් ඔබ අහිමිවෙනවා. ලොවක් නැති තැන ඔබ නැති තැනයි. මට මම නැති වෙන හැටි. ඔබට ඔබ අහිමි වෙන හැටි. ඇත්තටම මෙතන තියෙන්නෙ සත්‍ය අවබෝධ කිරීමක්.** මේ මගේ හැටි, මේ මම කන හැටි. මේ මම අඳින හැටි. මේ පුරුදු ගොඩක්. ඇත්තටම මෙතන ඉන්නවා කියල දැනෙන දැනීමම තමයි ඉපදීම. බුදුන් වහන්සේ ජාති ධම්ම සූත්‍රයේ ඒක කියනවා. 'ස්කන්ධානානං පාතිභාවෝ - ආයතනානං පටිලාභෝ - අයං උච්චති ජාති' මහණෙනි ඇසේ උපතයි උපත කියලා. ඇසින් බලලා දෙයක් කියලා ගත්තොත්, තොටිල්ලෙ ඉන්න පුංචි දරුවා, ඇහැට එන වර්ණ හැඩතලය, ඒ පුංචි දරුවාගෙ තොටිල්ල උඩ එල්ලන මෙරිගො රවුන්ඩ් එක කැරකෙන කොට ඒ දරුවා හිනා වෙනවා. කණට එන ශබ්දය, නාසයට දැනෙන ගන්ධය, දිවට දැනෙන රස, කයට දැනෙන උණුසුම මේ දැනෙන ස්වභාව ටික මොනවද කියල. මේ දරුවා දන්නවාද? ඒවා

මොනව ද කියලා දන්න දරුවෙක් ඉන්නවද? එහෙම පනවන්නත් බෑ. හැබැයි දෙයක් වගේ දැනෙන් නැත්ද? දෙයක් වගේ දැනෙන ගතියක් සෙන්සස්වල තියෙනවා. ආයතන කෘත්‍ය ක්‍රියාත්මකයි. හැබැයි ඒක සෙන්සස්වලට දැනෙන දැනීම. ඒක දෙයක් වගේ දැනෙන්නෙ මේ මනෝභාවය සකස් වෙන නිසා.

ආයතනනාං පටිලාභෝ - ස්කන්ධානානං පාතිභාවෝ තමයි මේ වේගෙට සකස් වෙලා, ස්පාක් වෙන වේගෙට ශබ්ද වර්ණ ගන්ධ රස රූප්පනය, වේගෙට දෙයක් වගේ දැනෙන ගතිය, ශබ්දය දෙයක් වගේ දැනෙන්නෙ කණ් බෙරය හෙළවෙන නිසා. වර්ණය දෙයක් වගේ දැනෙනවා, රස දෙයක් වගේ. එතකොට ගන්ධය. එතකොට ගන්ධය ගන්ධයක් වගේ දැනෙන එක. රස රසක් වගේ දැනෙන එක, ශබ්දය ශබ්දයක් විදිහට එන එක එතකොට උණුසුම සීතල තද ගතිය මේ පුංචි දරුවට දැනෙන ස්කන්ධානානං පාතිභාවෝ කියන එක වේගෙ නිසා ඉත්ත භාවයක් දෙයක් වගේ දැනෙන ගතියක් එනවා. හැබැයි චක්ඛු විඤ්ඤාණය කියන්නෙ පුටු ඇඳන් මේස නෙවෙයි වර්ණ හැඩතලයක් පමණයි. සෝත විඤ්ඤාණය කියන්නෙ ශබ්ද හැඩලයක් පමණයි. අර ඒකත් දෙයක් වගේ දැනෙන එක. පණුවගෙ ස්වභාවය අපි කිව්වා හංකඩේට දැනෙන ස්වභාවයට පණුවටත් ඉත්ත භාවයක් දැනෙනවා. ඒක නිසා තමයි පොළොව ඇතුළට රිංගන්නෙ. මේ දැනෙන ස්වභාවය ඔබ ගාව තමත් තියෙනවා. ඇස, කණ, දිව, නාසය, කය පංච ද්වාර ඒක පෙන්වනවා චිත්ත වීථිවලත්.

අපි මේක ප්‍රායෝගික පැත්තෙන්ම කතා කරමු. දෙයක් වගේ දැනෙන ශබ්දය, වර්ණය, ගන්ධය ඒ ශබ්දය ශබ්දයක් වගේ දැනෙන එක වර්ණය වර්ණයක් වගේ දැනෙන එක උණුසුම දැනෙන එක, සීතල දැනෙන එක තද ගතිය දැනෙන එක. මේ ඔබේ ආරම්භයයි. මේ ඔබේ උපතයි. එතනයි ආරම්භය, ස්කන්ධයයි. එහෙනම් ස්කන්ධයේ හට ගැනීම දකින එකමයි මහණෙනි ස්කන්ධයේ උදය දකිනවා කියන්නෙ මහණෙනි. එහෙම දැක්කොත් අන්න වය ඥානය ස්කන්ධයේ හටනොගැනීම දකින්නෙ එතකොටයි. හට ගන්නා ආකාරය දකිනවා කියන්නෙ, ස්කන්ධය කියන්නෙ ශබ්දය හට ගන්නා ආකාරය දකින එක, වර්ණය හට ගන්නා ආකාරය

දකින එක, ගන්ධය හට ගන්නා ආකාරය දකින එක. මේ ප්‍රසාද ටික 'ස්කන්ධානානං පාතිභාවෝ' හට ගන්නා ආකාරය දකින එක. **මේ පෙර සිත් කඳ පිළිවෙත් හැදෙන හැටි දැක්කොත්නෙ මේ මොහොතෙ ඒ සිත දකින්න පුළුවන්. ඔබ ඒ දිහා මෙනෙහි කිරීමක් කරන්න. ඒ 'ධම්ම විජය සම්බොජ්ජංගය', ඒ 'බෝධි අංගය', 'බුද්ධ ස්වභාවය' දෙයක් නොවන ස්වභාවයක් අත්දකින ස්වභාවය දකින්න. ඒ අත්දැකීම ඔබට තියෙනවා. ඔබ මේ මොහොතෙ මෙනෙහි කරන්න මේ කියන ආකාරයට.** මේක මහා විදර්ශනා භාවනාවක් වේවි. ඔබ නිවනට ළං වේවි.

ආර්යයන් වහන්සේ කියන දේ පොඩ්ඩක් මෙනෙහි කරල බලන්න. ඔබ පුංචි දරුවට යන්න. ඔබේ කුඩා කාලෙට යන්න. ඔබ තොටිල්ලෙ ඉන්න තැනට යන්න. එතන ඔබ නෑ. ඔබට මතකද? නෑ.. නෑ.. බොහෝ අයට අම්මගෙන් කිරි බීපු එක දැන් මතක නෑ. ඒ වගේ මෙතන මේ මොහොතෙ ස්වභාවය එතන පුංචි දරුවගේ සෙන්සන්වල ස්වභාවය හැබැයි ඉත්ත ස්වභාවයක්, හැබැයි එතන අර ශබ්දය ශබ්දයක් විදිහට වර්ණය වර්ණයක් විදිහට, ගන්ධය ගන්ධයක් විදිහට, රස රසක් විදියට, උණුසුම සීතල ඒ විදිහට දැනෙන ස්වභාවයක් තියෙනවා. ඒක අපිට තේරෙනවා පොඩි දරුවෙක් දිහා බලන් ඉන්නකොට. හැබැයි පොඩි දරුවට මොනවද කියල දන්නෙ නෑ කියන්නෙ පුටු මේස ඇඳන්, ගෙවල් දොරවල්, ඉර හඳ, අම්මා, තාත්තා, නෑ කියන්නෙ එහෙම දුකක් නෑ. ඒ කියන්නෙ "තින්නං සංගති ඵස්සෝ" ඵස්ස කියන්නෙ සමුදය. "තදංග ඵස්ස පච්චයා" ඒක සිද්ද වෙලා නෑ. ඒ කියන්නෙ ඒ දරුවට තාම දෙයක් වගේ දැනෙන්නෑ. පුටුවක් වගේ දැනෙන් නෑ. මේසයක් වගේ දැනෙන් නෑ. ඒ දරුවට දැනෙන්නෑ. බුද්ධාගමේ කියල ඒ දරුවට දැනෙන්නෑ පිරිමි ළමයෙක් කියලා, ලංකාවෙ ඉන්නෙ කියලා දැනෙන්නෑ ඒ තොටිල්ලෙ ඉන්න පුංචි දරුවට. ඔබේ පුංචි කාලෙට යන්නයි මේ කතා කරන්නෙ. මොහොතකට ඔබට නිවනට අරගෙන යන්නයි හදන්නෙ. **දැන් ඔබ ඉපදුන ගමන් කුඩා දරුවෙක්. දැන් ආයතන ටික වැඩ කරනවා ඒත් තාම ඔබ නෑ එතන ප්‍රභාෂ්වරයි. ඒ ප්‍රභාෂ්වර සිතේ ස්වභාවයි. "ප්‍රභාෂ්වරං චිත්තං සංකිත්තේ උපක්කිලේශේ උපක්ඛිලිට්ඨා" දැන් මේ යටගිය දවස අපේ හිතෙත් තිබුණෙ සුදු රෙදි කඩක් මෙතන තමයි අපි හැමෝම හිටියෙ. එතන ඉරිසියාව තිබුණෙ නෑ වෛරය තිබුණෙ නෑ**

**ද්වේශය තිබුණෙ නෑ** තොටිල්ලෙ ඉන්න පුංචි දරුවො ඉරිසියා කළේ නෑ, කාටවත්. වෛර කරේ නෑ කාටවත්. ඔබත් එතනයි හිටියෙ.

ඔබ ද්වේශ කරේ නෑ කාටවත්. ඔබට ශාන්ත සුවයක් තිබුණා. මොකද එතන ඔබ පනවන්න බෑ. තාම ඔබ හැදිලා නෑ. අපිට එහෙම කියන්න බෑ. ඔබ බලන්න තොටිල්ලෙ ඉන්න දරුවා ගාවට ගිහිල්ලා ඔබ ඉපදුන තැනටයි මේ යන්නෙ. තාම ඔබ ඉපදුණේ නෑ. ආයතන ටික වැඩ කරනවා. දැන් බලන්න මොකද වෙන්නෙ. පුතේ මේ අම්මා, මේ තාත්තා, මේ අයියා, මේ අක්කා, පුතේ මේ ඉර මේ හඳ, මේ තියන්නෙ රතුපාට, කහපාට, නිල්පාට, මොන්ටිසෝරි යනකොට කියල දෙන්නෙ මේ ස්වභාවය අපි ඔබට කිවුවා ඔබ හොඳින් බලන්න මොකක්ද මේ වෙන්නෙ කියලා. හැබැයි මේක සතා සිවුපාවාටත් මේ විදිහටමයි. මේ විදිහට දෙයක් සතා සිවුපාවාටත් සිද්ද වෙන්නෙ. ඒ ආයතන තියෙන ප්‍රමාණය අනුව සත්තුන්ගෙ ස්වභාවයට අනුව. මේ විදිහටමයි මෙතන ස්පාක් වෙන වේගෙට මෙතන මේ වර්ණය හැදෙනවයි කියන එක මුළු ධර්මයේ ම තියෙන අවසාන තුරුම්පුවයි. ඒ කියන්නෙ මුළු ධර්මයේ ම තියෙන ඔබ නිවන් දැක්කා හා සමානයි වේගෙට සකස් වෙන මේ වර්ණය දකින තැන. වේගෙට සකස් වෙන ශබ්දය ඇසෙ තැන. වේගෙට සකස් වෙන ඒ ප්‍රසාද ටික රූප්පනය වෙන හැටි ඔබට මෙනෙහි කරන්න පුළුවන් නම් නුවණින් ඔබ නිවන් දකිනවාමයි. මේ වේගෙට සකස් වෙන ස්වභාවයක් මේ සෙන්සස් වල හැම එකකම තියෙනවා. කන් බෙරේ හිල් වුණොත් වයිබ්‍රේට් වෙන වේගෙ නැති වෙනවා. වේගෙ නැති නිසා ශබ්දෙ නැති වෙනවා. ඔබේ ඇසට හානි වුණොත් අර අහසෙ එන හිරු කිරණට කණ්ණාඩිය අල්ලනවා වගේ අර දිදුලන ස්වභාවය ඔබේ ඇසේ තිබෙන ස්පාක් වෙන ස්වභාවය නැති වෙනවා. එතකොට ඒ රූප්පනය නෑ. ඒ ස්පාක් වෙන වේගෙට දෙයක් වගේ දැනෙන ස්වභාවය නෑ. ඒ ස්පාක් වෙන වේගෙට ආලෝක හැඩතලය හැඩතලයක් විදිහට වැටෙන්නෙ එහෙමයි.

අපි මේ කතාව තව ටිකක් ඉස්සරහට යමු. අපි කිවුවා අම්මා දෙනවා ෆෝන් එක තොටිල්ලෙ ඉන්න දරුවට අම්මට වැඩ කරගන්න ඕනිනෙ ගෙදර.... දරුවා බලාගන්න ඕනි. නලවන්න ඕනි. ගොඩක් අම්මලා මේක

කරන නිසා තමයි කිවුවෙ. මේකට දෙනවා සිංදුවක් දාලා. Twincle twincle little star - How I wonder what you are ? දැන් මේ ළමයගෙ ෆෝන් එකෙ සිංදුවක් යනවා. එතන ළමයෙක් පනවන්න බෑ මේ තොටිල්ලෙ ඉන්න ලේ කැටි දරුවා. පුංචි දරුවා. නැපියක් අන්දලා නේද? ලස්සන පිංතූර යනවා ෆෝන් එකේ. ට්වින්කල් ට්විල්කල් ලිට්ල්ස්ටාර් කියලා සද්දෙකුත් යනවා. මේ දරුවා හිනාවෙනවා. දැන් කවුරු හරි බලාගෙන හිටියොත් කියනවා. බලන්න දරුවගෙ හිනාව කොයි තරම් ලස්සනද? රන්ටිකිරි සිනා මුව අග පාලා නේද? හරි සුන්දර දසුනක් දකිනවා. අපිට හිතෙන දේ අපි කියනවා. අපිට පේන පිංතූරේ අපි කතා කරනවා. දැන් සෙන්සස් ටික වැඩ. දැන් අර ඇහැට එනවා වර්ණය දරුවගෙ. දරුවගෙ කණට එනවා ශබ්දය Twincle twincle කියලා. දරුවා ඒක ඉඹිනවා. සුවඳකුත් එනවා. ඒක ලෙවකනවා. හොඳට බලන්න නැද්ද කියලා. දිව ගාලා බලනවා. ඒක ඉව කරන සත්තු ගාවත් තියෙනවා අපි දැක්කා. ඊට පස්සෙ ඒ දරුවා ඒක මිරිකනවා. පොඩි කරනවා. ඊට පස්සෙ හිනාවෙනවා. කොච්චර ෂෝක් ද? සෙන්සස් ටික වැඩ. ආයතන වැඩ. ප්‍රසාද 5ක් සිද්ධ වෙනවා. ලස්සනට ප්‍රසාද ටික සිද්ධ වෙනවා. දැන් මොකද සිද්ධ වෙලා තියෙන්නෙ. මේකත් වේගයක් තුළයි සකස් වෙන්නෙ. දැන් මේක දෙයක් වගේ දැනෙන ස්වභාවය අර රස, සුවඳ, ගඳ ඔක්කොම එන්නෙ වේගෙට. හැබැයි ඊට පස්සෙ එකතු වෙන කොටත් ඒකත් එන්නෙ අර ස්පාක් වෙන වේගෙම තවත් එක දිගුවක් විදිහට සේරම එක මොහොතෙ දැනෙන්න ගන්නවා.

මෙතන ක්ෂණික සිද්ධියක් සිද්ධ වෙනවා. ඒ කියන්නෙ ඒ තරම් වේගවත්ව ඇති වන නැති වන ප්‍රවාහයක් මේ මුළු විශ්ව ධාතුවම ක්‍රියාත්මක වෙන්නෙ. මේ ස්වභාවය මෙතනත් වෙනවා. මේ ලේ කැටි දරුවා දැන් ඒකට ඇලිලා. මොනවද කියලා දන්නෙ නෑ. මේ ෆෝන් එකත් කියල දරුවා දන්නෙ නෑ. දරුවාට කතා කරන්න පුළුවන් ද? බෑ... හැබැයි දරුවා ඇලිලා. දැන් අම්මට කෝල් එකක් ගන්න ඕනි. අම්මා ෆෝන් එක දරුවගෙන් ගන්නවා. බබා මට ෆෝන් එක ඕනි. කියලා ගන්නවනෙ නේද? දෙන්න පැටියෝ කියලා ගන්නවා. කොයි විදිහට කතා කරත් මේ දරුවා චෑස් ගාලා කෑ ගහනවා. ඇයි ඒ? සෙන්සස්වලින් ඇලිලා. ස්පාක් වෙන වේගෙට මෙතන සෙන්සස්වලට ඇලෙනවා. මොකක්ද කියල දන්නෙ නෑ.

හැබැයි ඒ ඇලුණු ස්වභාවයට තමයි නන්දිය කිවුවෙ. ඒ නන්දිය ඇලුණු ස්වභාවය අපාධානයක්. අල්ලා ගැනීමේ බලයකට කොටු වෙනවා. අන්න ඒ බලය අතහැරෙන කොට අනිත් පැත්තට ප්‍රතිරෝධයක් එනවා. ඒ ප්‍රතිරෝධයට තමයි දරුවා කෑගහන්නෙ වෑස් කියලා. අන්න දරුවා කෑ ගහලා අඬනවා. බලන්න මේ කතාව ඊට වැඩිය ටිකක් ගැඹුරුයි. දැන් මොකක්ද වෙන්නෙ. ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස මේ මොහොතෙම දැනෙන ස්වභාවවලට ඒක දෙයක් වගේ දැනෙන ගතියක් ඇති කරනවා. අන්න එතන තමයි අපි ඔබට කිවුවෙ දෙයක් වගේ දැනෙන ගතිය මොකක්ද කියල නෑ, ශබ්දයටත් ඇලිලා, වර්ණයටත් ඇලිලා, ගන්ධයටත් ඇලිලා මේ ඇලෙන ස්වභාවය තමයි සාසවීය ස්වභාවය.

මේ බුද්ධෝත්පාද දේශනාවල 'සාසවීය' ස්වභාවය අපි දැක්කෙ ධම්ම සංඝීකරණයේ වචනයක් විදිහට. හැබැයි ගොඩක් අය කිව්වෙ මේ 'සාසවීය' ස්වභාවය කොහෙන් හරි ආවා කියලා. හැබැයි මේ 'සාසවීය' ස්වභාවය මෙතන වේගයට සකස් වන මේ සෛලවලම අපි මේක මහා නිධාන සූත්‍රයේ පැහැදිලි කරා යුක්තානුව මව් කුස ඇතුළේ ගෙඩියක් විදිහට තියෙන කොට ඒ සෛල වර්ධනය වේගයක් තුළ සෛල වර්ධනය වෙනකොට ඒ සෛල වර්ධනයටත් තියෙනවා දැනෙන ස්වභාවයක්. ඒ දැනෙන ස්වභාවය තමයි අර ගෙඩි 5ක් විදිහට හැදිලා ඇස කණ දිව නාසය හැදෙන ආකාරය ඒ සෛල වර්ධන වේගයක් තුළ ස්වබාවය සකස් වෙන ආකාරය ඒ සෛල වර්ධනය වන ස්වභාවය සෛල සකස් වන ආකාරය තුළ දැනෙන ස්වභාවයක් තියෙනවා. ඒ දැනෙන ස්වභාවය විඤ්ඤාණය කිවුවොත් එතනත් විඤ්ඤාණ ස්වභාවය. හැබැයි එතන දැනෙන ස්වභාවය දැනෙන ස්වභාවය විඤ්ඤාණ ස්වභාවය කියලා වෙනස්ම විග්‍රහයක් මහා නිධාන සූත්‍රය තුළ බුදුන් වහන්සේ පෙන්නුවා. ආර්යයන් වහන්සේ ඔබට පෙන්නලා දුන්නා බුදුන් වහන්සේ ඒ පෙන්නපු මහා නිධාන සූත්‍රය ඇසුරෙන් ඒ යුක්තානුව තුළ සෛල වර්ධනය තුළ දැනෙන ස්වභාවයක් තියෙනවා.

බුදුන් වහන්සේ, පිදුරු නිසා හටගත් ගින්න පිදුරු ගින්න, දර නිසා හටගත් ගින්න දර ගින්න කිවුවා වගේ, මේක එතන එතන ස්වභාවය තමයි විඤ්ඤාණය දැනෙන ස්වභාවය. විඤ්ඤාණය කියල පවතින

එකක් නෑ. අපි මේකට නමක් භාවිතා කරනවා පමණයි. ශබ්ද අපි මේ භාවිතා කරන හැම වචනයක්ම සංඛාරයක්. හැම වචනයක්ම ලෞකිකයි. අපි සන්නිවේදනය සඳහා වචන භාවිතා කරනවා පමණයි. වචන මත නැගී සිටින්න එපා කියල අපි ඔබට නිතර කිවුවා. එතකොට ඔබ අතරමං වේවි වචනයක් දෙයක් කර ගෙන. **හැබැයි මේ පුංචි දරුවගේ 'සාසවීය' ස්වභාවය ගම් එක කියල. මේ කෙලෙස් හට ගන්නෙ සාස්‍රව ස්වභාවයයි ආස්‍රව බවට පත්වෙන්නෙ කියලා. අන්න පුංචි දරුවා ගන්නකොට ආවෙ නැද්ද ප්‍රතිරෝධයක්. ප්‍රතිරෝධය නොවෙයි ද මෙතන බලයක් වගේ එකක් හැදිල නේද අර ආකර්ෂණ බලය හැදුණා වගේ. ගුරුත්වාකර්ෂණ බලය හැදුන වගේ. ගුරුත්වාකර්ෂණ බලය, විද්‍යුත් ආරෝපණ බලය වගේ චිත්තාකර්ෂණ බලය. මේකට කියන්න වෙන නමක් කොහින්ද? චිත්තාරෝපණය, චිත්තාකර්ෂණ බලය** කියල කියත හැකි. අපි කිවුවා දෙයක් වගේ දැනෙන සංඥාව මෙතන ඉත්ත සංඥාවක් සකස් වෙන ස්වභාවයක් අපි කිව්වා.

හැබැයි ඉත්ත සංඥා මේකත් නෙවෙයි අපි කතා කරන්නෙ. ඊටත් වැඩිය ගැඹුරු තැනකට යනවා. ඒ කියන්නෙ අන්න ඒ සාසවීය ස්වභාවය තමයි ආස්‍රව කෙලෙස් බවට පත් වෙන්නෙ. ඔබ බලන්න මේ දැරවා පුතේ, මේ අම්මා කියන කොට අම්මා කියන ශබ්දෙ අර ආලෝක හැඩතලය එකට එක් වෙන එක, ශබ්දයයි වර්ණයයි එකට එකතු වෙන එක, සම්පටිච්චන්න වෙන එක පටිච්චසමුප්පාදය මෙන්න මෙතන තියෙනවා. බලන්න ඒ ස්වභාවයේම දිගුවක් විදිහට නෙවෙයි ද අම්මා කියල ශබ්දයක් දැම්මොත් අර වර්ණයයි ශබ්දයයි එකට එන එක. අර තොටිල්ලෙ ඉන්න දරුවගෙ තිබුණ සාසවීය ස්වභාවය සෛලවල වර්ධන වේගෙට එකට දෙයක් වගේ දැනෙන ස්වභාවය අන්න ඒ දරුවා මව්කුසෙන් එළියට අවිල්ලා ආයතන ටික ප්‍රසාද වෙනවා. ආයතන ටික ප්‍රසාද වෙන කොට මේවා සේරම එකට එකතු වෙන ස්වභාවය එනවා. ඒ ස්වභාවය තුළ දාන ශබ්ද මොනවද වර්ණත් එක්ක එකතු වෙනවා. කැලේ හිටියොත් ටාසන් වගේ හූ කියන ශබ්දෙ හරි එකතු වෙනවා කිවුවා. ඇමෙරිකාවෙ හිටියොත් මදර්, ටේබල්, චෙයා ඕන ශබ්දයක්. මොන හැඩතලය ද වර්ණ ද ඇහැට එන්නෙ ඒ හැඩතලය එකතු වෙනවා. ජපානෙ හිටියොත් චාන්

චීන් වගේ ඕනිම ශබ්දයක් එකතු වෙනවා. එතකොට ඔන්න අපි හිතක් ගැන කතා කරනවා. හිත කියන්නෙ අරමුණයි.

ඔබ දකින්නෙ බිත්තිය නම් බිත්තිය දකින සිත කියන්නෙ අරමුණයි. මේ පුංචි දරුවගෙ කතාවෙ අම්මා හැඳුණා කියන්නෙ අම්මා දකින මමත් එතනම හැදෙනවා. ඒ ආත්මීය 'ඉත්ථ සංඥාව', 'ආත්ම සංඥාව' 'ඉත්ථ භාව' 'අන්‍යතා ආකාරයට' ආත්ම භාවයට පත් වෙනවා. 'ඉත්ථ භාව අඤ්ඤතා භාවෙති' කියන එක ධර්මයේ තියෙනවා මේක සූත්‍රවලත් තියෙනවා. බොහෝ භික්ෂූන් වහන්සේලා පැහැදිලි කරනවා. හැබැයි ගොඩක් අය කියන්නෙ ඉත්ත භාවය කියන්නෙ, තියෙනවා අන්‍යතා ආකාරය කියන්නෙ නැති වෙන එකයි කියලා. නෑ... ආර්යයන් වහන්සෙ ලෝකෙට හෙළි කරනවා ඊට වැඩිය ගැඹුරු පර්යායකින් පටිච්ච සමුප්පාද ධර්මය දැකලා. ඉත්ත භාවය කියන්නෙ තියෙනවා වගේ දැනෙන එක. අන්‍ය ආකාරයකට පත් වෙනවා කියන්නෙ ආත්ම භාවය සකස් වෙන එකයි. එහෙනම් ඉත්තභාව නැති වෙන එක කියන්න ඕනි. නෑ. අන්‍යාකාය මොකක්ද? එහෙනම් තවත් ආකාරයක් තියෙනවා. ඒක තමයි ආත්මීය දැනීම. ඉත්ත දෙයක් වගේ දැනෙන එකම අන්‍යාකාරයකට ආත්මය වගේ දැනෙන එක. මේ විග්‍රහය කිසි කෙනෙක් කරල තිබුණේ නෑ. 'ඉත්ථ භාව අන්‍යතාභාවෙති' කියන එක ආත්මය හැදෙන එකයි කියන එක. මේක තමයි ආත්මය හැදෙන ආකාරයේ මූලික සිද්ධාන්තය විදිහට ආර්යයන් වහන්සේ ලෝකෙට හෙළි කළේ. ආත්මය හැදෙන හැටි මේ කියන්නෙ. නිවන් මග විවර වෙනවා මේ දේශනා මාලාව තුළ. ආර්යයන් වහන්සේට දිය හැකි උපරිම ධනයයි මේ දෙන්නෙ. ඒ ධර්ම දානයයි. මේ ආත්මය හැදෙන හැටියි ලෝකෙට සැඟව ගිහින් තියෙන්නෙ. ඒ ඉත්ත භාවය තුළ අන්‍යාකාරයේ ආත්මය හැදෙන හැටි.

ඔබට දැන් ඔය ආත්මයක් තියෙනවා වගේ දැනෙන ගතිය පුංචි දරුවට හැදුණ හැටියි පෙන්නුවේ. ඔබ ඉන්නව වගේ ඔබට දැනෙන ගතිය අර පුංචි දරුවට දැනෙන්න ගත්තෙ කොහොම ද කියලයි පෙන්නුවේ. බුදුන් වහන්සේ මේක තමයි පෙන්නල දුන්නෙ 'ස්කන්ධානානං පාතිභාවෝ - ආයතනානං පටිලාභෝ අයං උච්චති ජාති' කියලා. මහණෙනි ඇසේ උපතයි උපත කියල කිවුවෙ ඒකයි. ඇසින් බලලා ඒ මොහොතෙ එන

ආලෝක හැඩතලයට ඒ මොහොතෙ තියෙන ශබ්දයක් දැම්මොත් ඒකත් එකට එකතු වෙලා ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස වලින් දෙයක් කියල ගත්ත එක ආයතන කෘත්‍යයක් සිද්ධ වෙනවා. හැබැයි මේ ආයතන කෘත්‍ය ආයතනවලට ගත්තොත් අපි කතා කරන්නෙ සම්මුතිය තුළ අපි ධර්මය ඉගෙන ගන්න කාලෙදි කතා කරන විදිහටත් බලන්න ඔව් ඇස ආයතනයක්. එතකොට රස ආයතන කෘත්‍යයකින් සකස් වෙන්නෙ. 'තින්නං සංගති ඵස්සෝ' කිවුවෙ ආයතන කෘත්‍ය. එතනින් තමයි සකස් වුණේ. මොකක්ද මේ 'තින්නං සංගති ඵස්සෝ' කිවුවෙ? මොකක්ද **මේ ආයතන කෘත්‍ය? අන්න මනා ආයතනය සකස් වීමයි කෘත්‍යය. ඒ කියන්නෙ 'තදංග ඵස්ස පච්චයා' කියපු තැන 'තින්නං සංගති ඵස්සෝ කියපු තැන ඔබ හිතනවට වඩා ගැඹුරක් තියෙනවා. ඉතාම ගැඹුරුයි මේ කියන එක. මේ වේගය තුළ මේ සේරම එකට එකතු වෙලා දෙයක් වගේ දැනෙන එකයි මනෝ විඤ්ඤාණය කියල කියන්නෙ. හය වෙනි ආයතනය මෙතනයි තියෙන්නෙ. ඒ කියන්නෙ අන්න එතනයි ඔබ ඉපදුණ තැන. එතකං තිබුණෙ ආයතන විඤ්ඤාණ ටික විතරයි.**

එහෙනම් දැන් මොකද ඔබට වුණේ? දැන් ඔබට අම්මා ඉපදුණේ 'අජ්ජෝසාය තිට්ඨති' අරමුණ අන්න දෙයක් කර ගත්තා කියන එක. අන්න 'යාරූපේ නන්දි' එතන එන නන්දිය අන්න අර ෆෝන් එක ගන්න කොට අර ඇති වෙලා තිබුණ නන්දිය සාසවීය ස්වභාවය තුළ එතනම සෙලවල විභේදනය තුළ සකස් වුණු වේගෙය තුළ දැණුන අර ස්වභාවය තමයි මෙතන වේගය තුළ ස්කන්ධානං කියන ස්කන්ධය තුළ වේගය තුළ ඒ වේදනාව මොකක්ද? එන්නෙ ඇහැට කිරණයක් කිරණය රූප ආරම්මණය. එහෙනම් එන්නෙ කිරණයක්, කිරණය මොකක්ද වේදනාව. එහෙනම් ඒක සංඥාව. ඒක නැවත නැවත එන එක සංකාර. දෙයක් වගේ දැනෙන එක විඤ්ඤාණ. රූප, වේදනා, සංඥා, සංකාර විඤ්ඤාණ තමයි ස්කන්ධ විග්‍රහය. එතකොට මොකක්ද  මේ ඇසින් ආලෝක හැඩතලයක් එන්නෙ. හැබැයි ශබ්දෙත් එහෙමයි, වර්ණයත් එහෙමයි, ගඳත් එහෙමයි රසත් එහෙමයි උණුසුම සීතලත් එහෙමයි. මේවා සේරම එක මොහොතෙ වේගය වැඩි කිමට දනෙන එකක් එනවා. වෙන වෙනම තමයි සිද්ධ වෙන්නෙ. හැබැයි එකට දැනෙන එක වේගය නිසයි සිද්ධ වෙන්නෙ. එකට දැනෙන එකයි මනෝ විඤ්ඤාණය කියන්නෙ. 'තධංග

ඵස්ස පච්චයා' කිවුවෙ ඒකයි. එහෙනම් ස්පර්ශය, සමුදය කියන්නෙ දෙයක් කියන්නෙ එකම කතාවයි. ඒ අර ඔක්කොගෙම බන්ධන බලයකට කොටු වුණු උපාදාය රූපය චිත්තයක්.

ශබ්දයි වර්ණයයි චිත්තයක්, ඒක වෙන් කරන්න බෑ. උපාදාය රූපයක් එළියෙ නෑ. එහෙනම් 'චත්තාරෝච මහා භූතානං - චතුන්නං ච මහා භූතානං - උපාධාය රූපං රූපං' කිව්වෙ ඒකයි. එහෙනම් මේ උපාදාය රූපයක් හැදෙන හැටි. හැබැයි මේක හැදුණෙ කොහොමද රුප්පනය නිසයි. ඒක අර කප්ජනීය වග්ගයට ගියාම අපිට හම්බවෙනවා. 'කප්ජං, කප්ජං' කියන තැනින් අපිට හමුවෙනවා. 'රුප්පන්තිකෝ ආයුසෝ රූපං' කියන බුදුන් වහන්සේගේ ඒ ධර්මය පර්යායෙන් අපට හම්බෙනවා. එහෙනම් රුප්පනය නිසා වේගය නිසා මේක හට ගත්තෙ. ස්පාක් වෙන වේගය නිසයි මේ දැනෙන ගතිය හට ගත්තෙ." තච්චාරෝච මහා භූතානං - චතුන්නංච මහා භූතානං උපාදාය රූපං රූපං කියන්නෙ, උපාදාය රූපං රූපං. ඒ බන්ධන බලය හැදුණේ 'රූප්පන්තිකෝ ආයුසෝ රූපං වදෙති' කියන තැනින්. එක වචනයක් වත් බුදුන් වහන්සේ කියන අහක දාන්න එපා. ඔක්කොම එකට ලියන්න.

අපි ධර්මයේ ප්‍රායෝගික වෙන කොට අපිට දැනෙන හැම එකම බුදුන් වහන්සේ කියල තියෙන විදිහට සේරම අපිට පෙන්නල දෙන්න පුළුවන් කියලා. හැම එකක්ම පෙන්නන්න පුළුවන්. අපට ඉඩ දෙන්න ඒක කියන්න. ඇත්ත කතාව කියන්න දෙන්න. මේක ඇත්ත කතාව. මේ ප්‍රායෝගිකව වෙන දේ. ප්‍රායෝගිකව ඔබ අත්දකින දේ පෙන්නල දෙනවා ටී.වී. එකේ දාලා පෙන්නනවා වගේ අපේ මස් ඇසට පෙනෙන දේ නෙවෙයි අපේ ධම්ම චක්ඛුසයටයි අසු වෙන්නෙ. නුවණට හසුවෙනවා මේක. මේක මනෝ විඤ්ඤාණය සකස් වෙන ආකාරය. මේක දෙයක් කියල දැනෙන එක. ස්කන්ධයේ උදය වැය දැකීමමයි මහණෙනි නිවන් දැකීම සඳහා කළ යුත්තේ. මෙන්න මේ ධර්මය දකින්න. ස්වාමීනි, සෝවාන් වීම සඳහා කුමක් කළ යුතුද? සකෘදාගාමී වීම සඳහා කුමක් කළ යුතුද? අනාගාමී වීම සඳහා කුමක් කළ යුතුද? අරහත්වය සඳහා කුමක් කළ යුතු ද? හැම තැනම බුදුන් වහන්සේ දේශනා කරන්නෙ මහණෙනි ස්කන්ධයේ උදය වැය දැකීමයි කළ යුත්තේ. එහෙනම් මේ හට ගන්න වේගය තුළ

ආයතනය හට ගන්න වේගෙ ඒ ආයතන නිසා මනායතනය හට ගන්නෙත් ඒ වේගය නිසාමයි මේක තාමත් ඔබට තියෙන්නෙ ඔබ දන්නැති වුණාට. හැබැයි මෙතන ඇතුළෙ මහා ගැඹුරු විග්‍රහයන් ටිකක් තියෙනවා. මේ මොහොතෙ ඒක දකින්න ගියාම චුතූපපාත ඥානයට එන්නෙ. මෙතන දෙයක් නැති බව දකින්න ගියාමයි තේරෙන්නෙ අර ටික ඇතුළෙ තව තියෙනවා කතා කරන්න කියලා. එහෙනම් කොහොමද මේක ආවෙ? එහෙනම් කොහොමද මෙහෙම වුණේ? ඔක්කොම පැහැදිලි කරන්නම්.

මුළු කතාවම ආර්යයන් වහන්සේ මේ දේශනා ප්‍රාතිහාර්ය තුළ දේශනා කරනවා. ඔය දිව්‍යලෝක කතා කොහොමද හැදෙන්නෙ. කොහොමද තිස්එක් ලෝක ධාතුව හැදෙන්නෙ? කොහොමද කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය හැදෙන්නෙ? තිස් එක් ලෝක ධාතුවක් තියෙන්නේ කොහොමද? 'සලායතන ලෝකෝ ලෝකං වදේති' 'පලෝක ධම්මං ලෝකං වදේති' ඇස බිඳෙන සුළු හෙයින් ලෝකයයි කියමි. **බුදුන් වහන්සේ කොහොමත් ලෝකය එළියෙන් පනවල නෑ. ඒක හේතුව මොකක්ද? මේක ඔබේ සිතමයි. විඤ්ඤාණ මායාවක අත් දකින එකක් කිසිදවසක එළියෙන් හමුවෙන්නෙ නෑ. ඔබ ඔය විඤ්ඤාණ ටික අයින් කරන්න. ඇස, කණ, දිව, නාසය කියන විඤ්ඤාණ ටික අයින් කරන්න. දැන් ඔබ කියන්න පේන දෙයක්. දැන් ඔබ කියන්න ඔබට දැනෙන දෙයක්.** ඇස් පෙන්නෑ. කණ ඇහෙන්නෙ නෑ. දැන් ඔබ බිහිරියි අන්ධයි. ඔබට උණුසුම සීතල දැනෙන් නෑ. ගඳ මොකුත් නෑ දැන්. හරිනෙ. රස දැනෙන්නෙ නෑ පිළිකාවක් හැදුනම ඇස අන්ධ නම් පේන් නෑ. කණ් බෙරේ හිල් වෙලා නම් ඇහෙන් නෑ. හංකඩේ හිරිවැටිල නම් දැනෙන් නෑ. සෙන්සස් නෑ. දැන් කියන්න ඔබට අත්දකින දේ අන්න එදාට පිළිගන්නවා ඔබ බාහිර අත්දකිනවා කියල. ඔබේ ඔය ආයතනවලින් එහා දෙයක් අත් දකින දවසට අපි කියන්නම් ඔබ බාහිර අත් දැක්කා කියලා.

ඔබට කිසිම බාහිර අත්දැකීමක් නෑ. ඒක අපි ඔප්පු කරන්නම්. ඔබේ ආයතන ටික ඔක්කොම ගලවලා දාන්න පැත්තකින්. මේක සතෙකුට තේරෙන් නැති වුණාට මේක මනුෂ්‍යයාට තේරෙනවා කිවුවෙ ඒකයි. ආයතන ටික සේරම ගලවලා පැත්තකින් කියන්න. කියන්න ඔබට පේන දෙයක් එළියෙ කොහෙහරි. ඔබ අත්දකිනව නම් කියන්න ආයතනවල

අත්දැකීමෙන් එහා දෙයක්. නැත්නම් ඔබට සිද්ධ වෙනවා කට වහගන්න. මේක ඇත්ත කතාව. ඇයි අපි ඇත්තට බය. ඇයි අපි නිවන බිල්ලෙක් කර ගෙන ඉන්නෙ. මේ නිවන මේ මොහොතෙ තියෙනවා. මේ ඇත්ත කතාවට අපි එන්න ඕනි. අපි ගොඩක් තර්ක කරයි. වාද කරයි. වැඩක් නෑ වාද, වැඩක් නෑ තර්ක. ඔබ කියයි ඔබට ගොඩක් දේවල් ඇවිත් තියෙනවා. ඔය සේරම තියෙන්නෙ පුරුදු ගොඩක් නිසා. ඒකත් වේගෙ නිසයි සකස් වෙන්නෙ. **පුංචි තැනේ ඉඳන් ගලපන්න කවකටු පෙට්ටියට ආශා කරනවා. පැන්සල් පෙට්ටියට ආශා කරනවා. කෑම පෙට්ටියට ආශා කරනවා. වතුර බෝතලයට ආශා කරනවා. පාට පාට ඒවා තමයි මුලින් එන්නෙ නේද? අර බැඳෙන්නෙ. බන්ධන බලයට කොටු වෙන්නෙ. යාරූපෙ නන්දියට එන්නෙ 'තධූපාදං භවො' දෙයක් කියලා හදා ගන්නෙ.**

ඊට පස්සෙ මොකද වෙන්නෙ. ටිකක් ලොකු වෙන කොට අන්න ඊට පස්සෙ පහේ ශිෂ්‍යත්වයට එනවා. ඊට පස්සෙ ඒවා ටික ටික වෙනස් වෙනවා. අර ඇලුම් කරන ඒවා වෙනවා. බැට් බෝල්වලට යනවා. බෝනික්කන්ට යනවා. ඊට පස්සේ O/L වලට යනවා A/L වලට එනවා. තව තව වෙනස් වෙනවා. නව යොවුන් වියට එනවා. හෝමෝන වෙනස් වෙනවා. ඊට පස්සෙ තවත් ආශා කරන ඒවා වෙනස් වෙනවා. දැන් වතුර බෝතලේට ආශාවෙන් ඉන්නවද A/L කරන ළමයා නෑ. එයාට තව ඒවා තියෙනවා. මේවා සේරම එතන එතන එතන සංඥාවක් විතරයි. වතුර බෝතලේට ආශා වුණු සංඥාව මොකක් ද? බෝනික්කට ආශා වුණු සංඥාව මොකක්ද? ඇයි ඔබ අද ඒක ගණන් ගන් නැත්තෙ. ඔබ බැට් බෝලෙට ආශා වුණ සංඥාව මොකක්ද? ඇයි ඔබ ඒවා දැන ගණන් ගන් නැත්තෙ? එහෙනම් ඒ සංඥාව ඒ සංඥාවෙන්ම ඉවරයි. ඇසට එන්නේ සංඥාවක් විතරයි. ඇසට කිරණයක් එනකොට දෙයක් වගේ දැනෙන එකත් සංඥාවක්. හැබැයි එනකොට ඒක සංඥාවක්. දෙයක් වගේ දැනෙන කොටත් සංඥාවක්. එතකොට කියන්නෙ කිරණ සංඥාව. ඊට පස්සෙ ස්කන්ධ විග්‍රහයෙ එනකොට ඊට පස්සේ ආයතන විග්‍රහයට එනකොට ඒ සංඥාව පුටුව කියන සංඥාව. ශබ්දය වර්ණ එකතු වුණ සංඥාව. අන්න ඒ සංඥාවයි මෙතන 'තදංග පස්ස පච්චයා' කිවුවෙ. ඒ කිවුවෙ 'පටිගසම්පස්සයට' 'අධිවචන සම්පස්සයක්' කිවුවෙ එතනයි

නාම රූප විග්‍රහය ඔබට හමුවෙන තැන. හැබැයි මේ නාම රූප විග්‍රහය ගැඹුරු තැනකින් පෙන්නත හැකි ආයතනවලත් තියෙනවා.

ඒ කියන්නෙ ඇස කියන ආයතනය බලන කොට ඇස කියන එක නෙවෙයි වේගෙට සකස් වෙන තැනක් තියෙනවා. අර රුප්පන ස්වභාවය රූපය, දැනෙන ස්වභාවය නාම, අර නිරූපණය තමයි නාම රූප විඤ්ඤාණ ඕකම එනවා. ඇස කණ ශබ්ද වර්ණ කියල එකතු වෙලා එන කොට පුටුව මේසෙ කියල එනවා. දැන් පුටුව මේසෙ කියල එන කොට අන්න ඒකම එනවා නාම, රූප, නාමරූප කියන්නෙ අමුතු කතාවක් නෙවෙයි. එන්නෙ රුප්පන ස්වභාවය ඒක 'පටිඝසම්පස්සය', ඒක 'අධිවචන සම්පස්සය' නාමය. දැනෙන ස්වභාවය. ඒකට තමයි විඥ්ඥාණයේ දැන ගැනීම ඔබ ඕනි විදිහකින් අපේ ඉස්සරහට ගේන්න. ඕනිම දහම් පර්යායකින් ගේන්න. ආර්යයන් වහන්සේ ලෑස්තියි පොළොවෙ පය ගහලා මේ මහ පොළොවෙ පිහිටපු ධර්මයක් දේශනා කරන්න. ඔබට වෙන දේ කියන්න ලෑස්තියි. ඔබ හැදුණ හැටි කියන්න ලෑස්තියි. ඔබ මැරෙන් නැති බව කියන්න ලෑස්තියි. ඒ හැදුණු මායාව පෙන්වල දෙන්න ලෑස්තියි. ඔබට මරණයක් නැති බව පෙන්වල දෙන්න ලෑස්තියි. මේ මායාව, මායාවක් පමණයි කියල පෙන්නලා දෙන්න ලෑස්තියි. බුදුන් වහන්සේ දේශනා කරපු ධර්මය පෙන්නන්නම්. ඔබට මෙතනින් එහාට යන්න බෑ. අපි කතා කරන්නෙ ප්‍රඥාව ගැනයි. අපි කතා කරන්නෙ ඒ විදසුන් දර්ශනය ගැනයි. ඒ විදසුන් අපිට තර්ක විතර්ක නෑ වාද නෑ මොකුත් ඕනි නෑ අපි කියන්නෙ ඔබ සමානයි මේ දේ අවබෝධ කළොත්. මින් එහාට යන්න බෑ කාටවත් කියලා. මෙතනින් සියල්ල සුණු විසුණු වෙනවා. ආත්මය සුණු විසුණු වෙනවා. පුද්ගල භාවය සුණුවිසුණු වෙනවා. දෙයක් කියල ගන්න ඒවා සුණු විසුණු වෙනවා. විශාල අභ්‍යන්තර පරිවර්තනයක් මේ තුළ සිද්ධ වෙනවා මේක සත්‍යයක්. මේක පරම සත්‍යක් මේක විශ්වාස කරන්න එපා. මේක වෙන දවසට විතරයි ඔබ භාර ගන්න ඕනි. අපි පෙන්වල දෙනවා විතරයි. කළ්‍යාණ මිත්‍රයා පණිවිඩය කියනවා විතරයි. මේ ආත්මය හැදෙන හැටි කියලා. මේ ආත්මයක් නැති බවයි කියන්නෙ. ආත්මය හැදෙන හැටි පෙන්නල දෙනවා කියන්නෙ මැජික් කරන හැටි පෙන්නලා දෙනවා. ඔබට විඤ්ඤාණ මැජික් එක හැදෙන හැටි පෙන්නල දෙනවා. එවිට ඔබට විඤ්ඤාණ මායාව සුණු විසුණු වෙනවා. ආයේ

විඤ්ඤාණ මායාවට රංගන දාන්න බෑ. "ප්‍රඥ්ඥා භාවේ තබ්බන් - විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං" කිවුවෙ අන්න ඒ නිසයි. ඒ මහා ප්‍රඥාව ඔබට අවදි වෙනවා ඔබ මේක දකිනවා. එහෙනම් ඔබට විඤ්ඤාණ මායාවට සෙල්ලම් දාන්න දෙන්න බෑ ආය. ඔබ දෙන්නත් එපා ඒක කරන්න. ඊට පස්සෙ ඔබට මොකද වෙන්නෙ?

අපි පුංචි දරුවගේ කතාවට නැවතත් ගිහිල්ලා බලමු මොකද වුණේ කියලා. මේක අභිසංකරණයකට ලක්වෙනවා. ඒ කියන්නෙ නැවත නැවත එන එකම තමයි සංඥා අභිසංකරණයම තමයි මේකෙ තියෙන්නෙ. ඔය සංකාරා කියල කියන්නෙත් සකස් වෙන **"සංකාර සංඛාරත්තාය සංඛතං අභිසංඛරෝති"** කියන තැනයි මේ. සංචේතනා සුත්‍රවලට එන්නෙ, බුදුන් වහන්සේ පැහැදිලි කරලා තියෙන එකක් මේ කියන්නෙ. ආර්යයන් වහන්සේ වෙනම ම කියනවා. හැබැයි බුදුන් වහන්සේ පැහැදිලි කරල තියෙන ඒවා ගොඩක් වටිනවා. ඒවා කියනවා. ඒකෙ තියෙන සියුම් තැන් තවත් හොඳින් මතු කරල දෙන්න ඕනි නිසා ආර්යයන් වහන්සේ ඒක විදිහටම කියනවා මේක ආර්යයන් වහන්සේ කියන එකක් කියලා. ඒවා ඔක්කොම හොඳට ගලපලා බලනකොට අඩුපාඩු නැතුවම හොඳට ලිහිලම යාවි. එතකොට මේ සංඥා අභිසංකරණයකට ලක් වෙනවා. මොකක් ද මේ සංඥාව අර ඇහැට වැටෙන ආලෝක කිරණය පවා සංඥාවක් ඒකත් අභිසංකරණයකට ලක්වෙලා තියෙන්නෙ. ඒක අමතක කරලා ඔබට ධර්මය ගන්න බෑ කියලයි මේ කියන්නෙ. ඒකට 'ධම්මට්ඨිති ඥානය' අවශ්‍යයි ඒක ගලපගන්න අවශ්‍යයි. මැජික්වලට නොරැවටෙන්න නම් මේ ටික අවශ්‍යයයි.

එහෙනම් ඒ කිරණය පවා අභිසංකරණයකට ලක් වෙනවා. එතනත් සංඥාවක් තියෙනවා. එතනත් නාම රූප කතාවක් තියෙනවා. එතනත් චක්ඛු විඤ්ඤාණයක් තියෙනවා. හැබැයි එතන ආව සෝත විඤ්ඤාණයත් එහෙමයි. හැම විදිහටම ආයතන විඤ්ඤාණ පහම දකින්න. හැබැයි එතකොට ඔබ දකින්න ඒවත් එකට එකතු වෙන නාම රූප තව කතාවක් තියෙනවා. ඒ නාම රූප කියන්නෙ මෙතන සිද්ධ වෙන සිද්ධිය විතරයි. අතනත් නාම රූප තමයි. මෙතනත් නාම රූප තමයි. මොකද්ද මෙතන කියන නාම රූපෙ. තව වටයක් කැරකෙනවා. **"වට්ටම්**

**වට්ටති" කියන තැනට එනවා දෙවන වටය කැරකිලා අපිට දෙයක් පේනව නෙවෙයි අපි හිතනවා. ඇහැට එන්නේ කිරණයක් අපි දකින්නෙ පොතක්. පොත කියන්නෙ ශබ්දයක් ශබ්දය කොහොමද දකින්නෙ. ශබ්දයක්! මේ පේන්නෙ ශබ්දයක්. ඔව් ශබ්දයක්.** මෙන්න මේක ගලපාගන්න බැරුව කිසිම කෙනෙක් බණ කියන්න යන්න එපා. මේ ආත්මය හැදෙන හැටි. එහෙනම් ඔබ අනාත්ම ධර්මය දේශනා කරන්න ඕනි. දේශනා කරන්න අදක්ෂ නම් බැරි නම් අපි කුමක් කියමු ද? ඇස් ඇත්තෝම දකිත්වා. ධර්මය නම් ධර්මයයි. ධර්මය තුළ ඔබට වෙන කිසිවක් හමුවෙන්නෙ නෑ. ධර්මය නම් දෙයක් නැති බවයි. ආත්මයක් නැති බවයි. එහෙනම් මෙතන දකින්න මේ අභිසංකරණය කියන කතාව.

දැන් මොකද වෙලා තියෙන්නෙ. දැන් නාම රූප කතාව වට්ටම් වට්ටති. ඊගාව තැනට එනවා. ඒ කියන්නෙ දැන් එන්නෙ 'පටිඝසම්පස්සයට' 'අධිවචන සම්පස්සයක්' කියන්නෙ **ඒආකාර ඒලිංග ඒනිමිත ඒඋද්දේශ ඇති කල්හි අධිවචන සම්පස්සයක් කිවුවෙ මෙතන එන්නෙ පටිඝසම්පස්සයක් කියන්නෙ පටිඝ කියන්නෙ ගැටෙන එකමයි. ඒක වචනෙත් තියෙනවා. අධි වචන කියන කොට ඒක දැනෙන එකක් එන්නෙ. චිත්ත ස්වභාවයක්.** එහෙනම් එන්නෙ මේසෙ, පුටුව, ඇඳ, අම්මා, තාත්තා, දෙයක්, ධම්ම සකස් වෙන්නෙ. එතකොට ධම්ම කොහොමද සකස් වෙන්නෙ? පටිඝසම්පස්සයෙන්. පටිඝසම්පස්සය කියන්නෙ වර්ණ, ශ්බද, ගන්ධ, රස, පහස ආයතන ටික මේ වේගෙ නිසා එකට දැනෙන එක. ස්පර්ශ වෙලා දැනෙන එක. සම්පටිච්චන්ත වෙන එක. සම්පටිච්චන්න වුණේ නැතිනම් පටිච්චසමුප්පාද කතාව මෙතෙන්ට එන් නෑ. අවිද්‍යාව කියන්නෙ දෙයක් කියල දැනෙන එක. එහෙම එකක් නෑ කොහෙවත්. පුටුවක් කොහෙවත් තියෙනවද? පුටුවක් කියන්නෙ ශබ්ද වර්ණ. කොහෙවත් නෑ. ඒ කියන්නෙ අවිද්‍යාව. ඒක එහෙනම් අවිද්‍යා පච්චයා සංඛාර. ඒක වේගෙට සකස් වෙන එක. සංඛාර පච්චයා විඤ්ඤාණ. ඒක දැනෙන එක පුටුව දෙයක් වගේ දැනෙන එක. පුටුව ශබ්ද වර්ණ එකතුවන වේගෙට සකස් වුණු එක. අවිද්‍යා පච්චයා සංකාර, සංකාර පච්චයා විඤ්ඤාණ, විඤ්ඤාණ පච්චයා නාම රූප කිවුවෙ මේ එන්නෙ මොකක්ද? පටිඝ සම්පස්සයක්. ඒ දැනෙන එක වෙනම එකක්. **අන්න නාමීය රූපයක්. ඒ කියන්නේ පුටුව කියල දෙයක්. නාමීය රූපයක්.**

**නාමීය රූපයක් වෙන් කරන්න බෑ කාටවත්**. ඇයි ඒවා එක්ක ශබ්ද වර්ණ එකට එකතු වෙලා දැනෙන ගතියටයි කිවුවෙ.

'නාම රූප පච්චයා විඤ්ඤාණ' දෙයක් වගේ දැනෙන එකමයි ඒකමයි ස්පර්ශය 'තදංග ඵස්ස පච්චයා' ඒකමයි සංඛාර පච්චයා විඤ්ඤාණ පච්චයා නාම රූප පච්චයා සලායතන. ආයතන කෘත්‍ය. දෙයක් කියල ගත්තා පුටුව. ආයතන කෘත්‍ය පුටුව. සලායතන පච්චයා ඵස්ස. ඒකමයි ස්පර්ශය දෙයක් වගේ ගත්ත එක. ඒකමයි නන්දිය, අලෙන ගතිය ඒකමයි උපාදානය. අන්න තණ්හාව. 'ඵස්ස පච්චයා තන්හා' 'තන්හා පච්චයා උපාදාන' 'උපාදාන පච්චයා භවෝ' දෙයක් වගේ දැනෙන එකමයි. එහෙනම් ඒකමයි පුටුව කියන ජාතිය ජරා මරණ පුටුව කැඩිලා බිඳිලා යන එක ඔක්කොම තියෙන්නෙ හැදුණොත් විතරයි, විනාශ වෙන්නෙ. ඉපදුණොත් විතරයි මැරෙන්නෙ. පුටුව හැදෙන හැටි දැක්කොත් පුටුවක් නැති බව අවබෝධයි. එහෙනම් පුටුව වෙනද විදිහටම පේනවා. හැබැයි කණ්ණාඩියේ දෙයක් නෑ වගේ අවබෝධයක් තියෙනවා. එහෙම දෙයක් නැති බව මේ ධර්මය අවබෝධ නම්, පටිච්චසමුප්පාද ධර්මය කියන්නෙ පේළියට ලියන වාක්‍යයක් නෙවෙයි. එකක් උඩ එකක් උඩ ලියන එකම කතාවක්. අවිද්‍යාව උඩ ලියන්න සංඛාරා. සංඛාර උඩ ලියන්න විඤ්ඤාණ, විඤ්ඤාණ උඩ ලියන්න නාම රූප, ඔබ පේළියට ලියපු නිසා ඔබට මේ දහම ඔබ හිතන රටාවට අවබෝධ කරන්න බෑ. මේ දහම අවබෝධ කරන්න පුළුවන් ඔක්කොම එකයි කියල ගත්ත දවසට මේකෙ දෙකක් නෑ. එකයි තියෙන්නෙ. ගොඩක් නෑ එකයි තියෙන්නෙ. " **ඒකායන මග්ගෝ අයං භික්ඛවෙ"** එකම මගයි තියෙන්නෙ. එකම දහමයි තියෙන්නෙ එකම ධර්මයයි තියෙන්නෙ. මේ සේරම දෙයක් නැති බවයි.

පටිච්චසමුප්පාද ධර්මයත් මේ ක්ෂණයේ සකස් වෙන එකත් කිවුවෙ මේක අවබෝධඥානයෙන් මේ යුගයේ දැවැන්ත විප්ලවයක් කරල තියෙනව සියලුම භික්ෂූන් වහන්සේලාටම මේ දේශනා මාලාව හෙවණැල්ලක් වෙලා තියෙනවා. මෙතෙක් බිහිවුණු සියලු පොත්පත් සියල්ල අභිභවා යමින් බුද්ධෝත්පාද දේශනා එළියට එනවා. ප්‍රායෝගික අත්දැකීම් ලෝකෙට එළි කරන මහා ධර්මයක් දේශනා වෙනවා. ඔබ අපේ ශ්‍රාවකයෝ. මොකද මේ දේ අපිට කවුරුත් කියන් නැතුව ලෝකෙට

එළි කරන කොට ඔබ අපේ ශ්‍රාවකයෝ. ඔබ කෙසේ කිවුවත් ඔබේ හිත ඇතුළෙන් අහල බලන්න බුද්ධෝත්පාද දේශනාවල ශ්‍රවකයෙක් නෙවෙයි ද කියලා. ප්‍රායෝගිකව අත් දැකල ලෝකෙට දෙන මේ දායාදය ඔබේ දායාදයක් බවට පත් වෙනවා ඒ ස්වභාදහම ස්වභාදහමමයි. අපි ධර්මය ඔබට දීලා තියෙනවා. ඔබ ඒ ධර්මය ගත්තම ඇති. ඒ ධර්මය තුළ ඔබ සැනසෙනවා නම් ඒ උතුම් සැනසීම ඒ ස්වභාදහමට අවදි වූ අපිට ලැබෙන ලොකුම දායාදය එයයි. ඔබේ සැනසීම කොයිතරම් ද ඔබට දැනෙනවා ඇති ඒ දැනෙන සැනසීම මේ තුළින් ඔබට හමුවෙනවා. අපි මේ තුළින් තවත් දිගුවක් බලමු. දැන් හැදුණේ මොකක්ද? ආයතන හැදුණා. ආයතන පටිලාභය සිද්ධ වුණා. ආයතනය කිවුවෙ පොත මේසේ බිත්තිය 'ධම්ම' අන්න **නහිදං අත්ත කතං බිම්බං නහිදං පර කතං අඝං** මේ ප්‍රතිහම්බය තමන් හැදුවෙත් නෑ වෙන කෙනෙක් හැදුවෙත් නෑ.

එහෙනම් ආත්ම ප්‍රතිබිම්භය ගැනයි කතා කරන්නේ. **හේතුං පටිච්ච සම්භූතා - හේතු භංගා නිරුජ්ජති** මේක දකින එකයි හේතු භංගයි කියන්නෙ. භංග ඥානය කියන්නෙ දකින එකයි. **අපි කිවුවා 'උදය ඥානය' හැදෙන හැටි දැක්කා. 'වය ඥානය' එහෙම වුණොත් නැති වෙන එක දැනෙනවා. අන්න ඒකමයි 'භංග ඥානය' කියන්නෙ. ඒකයි 'භයතුපට්ඨාන ඥානය' තමන්ට තමන් නැති වෙන ස්වභාවය මෙතන ඥානෙට හසු වෙනවා.** ඥානෙ කියන්නෙ සිහිය කියන එක. දර්ශන ඥානය තුළ දෙයක් නැති බව දැනෙන සිහිය ඥානය කියන එක ආර්යයන් වහන්සේගේ ඇට මස් ලේ වලින් ම දිය කරල ගත්ත එකක්. මේ ඥායස්ස අධිගමාය කියන එක ලෝකෙට දිපු තවත් එක දායාදයක්. මේක මහා පුදුමාකාර මාණික්‍යයක්. මේක මුතු ඇට වගේ. මල් වැස්සක් වහිනවා වගේ. මේ යුගයේ කාන්තාරයට සිහිල් දිය බිඳක් වගේ. අන්න ආර්යය භූමියට පරිසරය හැදෙන්නෙ මෙන්න මේ සත්‍ය අවදිවීම තුළයි. එහෙනම් මේක හසුවෙන්නෙ සිහියට. දර්ශන ඥානයෙන් දෙයක් වගේ දැනෙන එකට සිහිය කියන්න බෑ. එහෙනම් අශ්‍රුතවත් පෘතග්ජන භූමියෙත් ඕනිම කෙනෙක් ළඟ සිහියක් තියෙනවා. හැබැයි මේක දෙයක් නැති බව දැනෙන එකයි. මේක සිහියක්. ඔව් ඒක ඇත්ත. මේක ඥාන සම්ප්‍රයුක්ත කුසලයයි. එහෙනම් දර්ශන ඥානයෙන් මතුවන ඒ සම්මා ඥානයයි. සම්මා ඥාන කියන්නෙ සම්මා දිට්ඨිය ඔස්සෙ මතුවන ඥානයයි. දෙයක්

තියෙන තැන විඤ්ඤාණ මායාව ඇතුළත සම්මා දිට්ඨියක් තියෙන්න පුළුවන් ද? නිකං හිතන්න, බාහිර දකින්නෙ විඤ්ඤාණ මායාවක්නෙ. ඕකෙ ඇත්තක් තියෙනවද බාහිර ඇත්ත කරගෙන ඉන්න එක සම්මා දිට්ඨියක් ද?

**"විනෙය්‍ය ලෝකේ අභිජ්ජා දෝමනස්සානං"** කියන කොට ලෝකෙ ඇත්ත කරගෙන සතර සතිපට්ඨානයක වඩන්න බෑ. ලෝකය ඇත්තක් නොවන බව දකින්නයි ඔබ සතර සතිපට්ඨානය වඩන්නෙ. සතර සතිපට්ඨානය කියන්නෙ කෘත්‍ය ඥානය. මෙන්න මේ අවබෝධය තියෙන දර්ශන ඥානයෙන් එන්න ඕනි කෘත්‍ය ඥානයට සත්‍ය ඥානයෙන් එන්න ඕනි. එහෙනම් මේක ඉස්සර වෙලා දැන ගන්න ඕනි. මොකක්ද මෙතන වෙන්නෙ කියලා. එතකොටම අරමුණ එතකොටම ඒ අරමුණේ ඇලෙන්නෙ නෑ ගැටෙන්නෙ නෑ. අන්න අරමුණෙන් මිදීම අත්දකිනවා. ඒ අත්දැකීමමයි කෘත්‍ය ඥානය කියන්නෙ. අපි කියනවා ආර්ය අෂ්ටාංගික මාර්ගය. සම්මා දිට්ඨිය ඇති අයටයි සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සතිය කියන්නෙ දෙයක් නැති බව දැනෙන එන එන අරමුණේ දෙයක් නැති බව දැනෙන සතියයි සම්මා සතිය. එහෙනම් ඒ තුළ උපදින සමාධිය සම්මා සමාධිය. ඒ අනිමිත්ත සමාධියයි. ඒ අනිමිත්ත ශූන්‍යත අප්‍රණීත චේතෝ විමුක්තියයි. ඒ අනිමිත්ත සමාධියයි විදර්ශනා සමාධිය. මේක නුවණින් මෙනෙහි කිරීම තුළ ලබන සමාධියක්. කිසි දවසක අත්දෙක තියාගෙන මේක ගන්න බෑ. **"දුර්ලභං මනුස්සත්තං දුර්ලභං සද්ධර්මශ්‍රවණං, දුර්ලභං ක්‍ෂණ සම්පත්තිං"** කිවුවෙ ඒකයි. දුර්ලභං භාවනා කියල කොහෙවත් නැත්තෙත් ඔය නිසයි. හැබැයි මේක දකින එක විදර්ශනා භාවනාව තමයි. ඔව් ඇත්තයි. දෙයක් නැති බව විදසුන් නුවණට හසුවන සමාධියක්. ඒක විදර්ශනා සමාධියක්. ඒක විද්‍යුත් නුවණටයි මතුවෙන්නෙ. ඒක අන්න ඔබ අත්දකින්න දේශනා ප්‍රාතිහාර්යයක් තුළයි සිද්ධ වෙන්නෙ.

ඔබ නිවන් දකින්න ඕනි නම් බුද්ධෝත්පාද දේශනා 2000 අහන්න. ඒකාන්තයෙන් නිවන් දකිනවා. ඔබට ඒ තරම් වීර්යයක් ධෛර්යයක් තියෙනවා නම් ඔබට ඒ තරම් නුවණින් විමසන්න හැකියාවක් තියෙනව නම් අඩුම තරමින් සුගති පරායනයි. ඔබ කිසිදා දුගතියකට වැටෙන්නෑ.

ඔබ මේ දේශනා ටික අහගෙන ගෙදර කටයුතු කරන්න. ඔබ සියලු දුකින් මිදෙනවා. කිසිදා දුගතියකට වැටෙන්නෙ නෑ. නියත සම්බෝධි පරායනයි. බුද්ධොත්පාද දේශනා ඔබට සාක්කි දරාවි. විශාල පිරිසක් මේ වෙනකොට ඒ ප්‍රත්‍යක්‍ෂතාවට පත් වෙමින් සිටිනවා. **අද අදම ඔබත් ක්‍රියාත්මක වන්න ඒ සත්‍යයට අවදි වන්න. මේ ඔබට පවසපු තැන අභිසංකරණය කියන තැන බලන්න ඔබ දැන් ඉන්න හැටි, ඔබ අඳින හැටි, ඔබ කොණ්ඩෙ පීරන හැටි, ඔබ ඇවිදින හැටි, ඔබ කතා කරන හැටි. ඔය හැම එකම අභිසංකරණයක් තියෙන්නෙ**. අර තොට්ල්ලෙ හිටපු දරුවටත් තිබුණෙ අභිසංකරණය. සංඥා අභිසංකරණයක්ය මහණෙනි ජීවත් වෙනවා කියන්නෙ. ඔන්න ඕකයි එහෙනම් ඔබ කතා කරන හැටි, ඔබ කන හැටි, ඔබ අඳින හැටි, මේ මගේ හැටි. මම කිව්වොත් කිවුවා, මම වෙන දෙයක් කරන්නෑ. ඇයි මම හදාගෙන. මම ඝනට ඉන්නවා. කවුද මට කියන්නෙ අර ශබ්දයයි වර්ණයි, කණ්ණාඩියෙන් දැකපු වරණයට අර නිමල් හා නිමලාවතී හරි කියල දා ගත්ත ශබ්දෙ. ඒ ශබ්දෙයි වර්ණෙයි ඔබ හැම තිස්සෙම බලන්න ඒක නැවත නැවත මෙනෙහි වෙනකොට ඒක දෙයක් වෙලා. දැන් ඔබ ආත්ම දෘෂ්ටියක ඉන්නවා. ඒ කියන්නෙ සිතුවිල්ලෙන් මම ඉන්නවා කියල. ඔබ බැසගෙන ඉන්නවා. ඔබට අන්නාසි කියන්නෙ සිතුවිල්ලක් නෙවෙයිද? ඔබට පිච්ච මල කියන්නෙ සිතුවිල්ලක් නෙවෙයිද? ඔබට කපුටා කියන්නෙ සිතිවිල්ලක් නෙවෙයිද? ඔබට බිත්තිය කියන්නෙ සිතුවිල්ලක් නෙවෙයිද?

ඔබට පුළුවන්ද අන්නාසි කන්න. ශබ්ද වර්ණ කන්න පුළුවන්ද? ඔබට කවදාවත් අන්නාසි කන්න බෑ. මේ දැනෙන දැනීම් ටික මේ දැනෙන රසට මේ දැනෙන සුවඳට මේ දැනෙන ශබ්දෙට වර්ණයට ගන්ධයට රසට උණුසුම සීතල තද ගතියට අපි ශබ්ද දාගෙන තියෙනවා නේද මේ බලන්න හොඳින් ශබ්දයි, වර්ණයි, නාමයි, රූපයි දාගෙන නේද මේ ගැට ගහගෙන නේද? ඒවා සංඥා විදිහට තියෙනව නේද? පුටුවත් සංඥාවක්. දැන් පුටුව සංඥාව වෙනයි. ආලෝක හැඩතලයක් විදිහට ඇහැට එනකොට කිරණෙ ඒක සංඥාවක්. ඒකත් වෙනයි. සංඥාවක් තියෙන තැන විඤ්ඤාණයක් තියෙන්නෙ. සංඥාවක් නැති විඤ්ඤාණයක් නෑ. හැබැයි පුටුව කියල ගන්නකොට ඒකත් සංඥාවක්. ඒ සංඥාවමයි විඤ්ඤාණය. සංඥාවක් නැති විඤ්ඤාණයක් නෑ. ඒකමයි දැන ගැනීම.

මේ වචන ගොඩක් විතරයි. මේ දැනෙන ස්වභාවය. සංඥාව පුටුව. දැන් ඔබට දැනෙන්නෙ මොකක්ද? දැන් ඔබ ඇසුරු කරන්නෙ මොකක්ද? සංඥ්ඥාව කියන්නේ මොකක්ද චිත්තයක්. අන්න මනෝ සංඛාරයක් දෙයක් තියෙනවා. මොකද්ද ඒ. පුටුව, මේසෙ, ඇඳ, අම්මා, තාත්තා, ඉර, හඳ, ගහ, කොළ. එහෙනම් ඔබ ඉන්නවා.

ආත්ම දෘෂ්ටියක් තියෙනවා කියන්නෙ, ඔබට සේරම දේවල් තියෙනවා කියන එකයි. ඇයි ඒවා තියෙන්නෙ කාටද? මට. ඒවා දැනෙන්නෙ කාටද? මට. මම කියන්නෙ? දැන් සංඥාවට හිමිකාරයක් ඕනි. සංඥාවම ඇතුළෙ නිරූපණය ඇතුළෙ බල ගැන්විල එන දෙයක් වගේ දැනෙන ගතියටයි ආත්මය කිවුවෙ. බිත්තිය තියෙනවා නම් බිත්තිය දකින මාත් ඉන්නවා. හැබැයි මෙතන බිත්තිය එනකොටම ශබ්ද වර්ණ එනවා. අපි එමු දැන් ප්‍රායෝගික පැත්තට. දැන් ඔන්න අපට පේනවා, ඇහෙනවා, දැනෙනවා, පේන්නැති වෙලා නෑනෙ අන්ධ වෙලා නෙවෙයිනෙ, බිත්තිය කියලා දන්නැද්ද? දන්නවනෙ රහතන් වහන්සේ මන්ද බුද්ධික වෙලා නෑ. රහතන් වහන්සෙ අන්ධ වෙලා නෑ. රහතන් වහන්සේ බිහිරි වෙලා නෑ. හැබැයි රහත්න වහන්සේට මේ අවබෝධය තියෙනවා. අවබෝධය තියෙන කොට මොකද වෙන්නෙ? කණ්ණාඩියේ දෙයක් නෑ කියල අවබෝධයිනෙ. හැබැයි කණ්ණාඩියෙන් ඔක්කොම පේනවනෙ. ඇත්ත ලෝකෙත් දැන් ඔක්කොම පේනවානෙ. හැබැයි කණ්ණාඩියේ දෙයක් නෑනෙ. ඇත්ත ලෝකයේ දෙයක් නෑනෙ. කවදද ඔබට මේක තේරෙන්නෙ. ඔබ නිවන් නොදැක්කොත් තමයි පුදුමෙ.

**දැන් ඔබ වටපිට බලන්න. දැන් ඔබ නිවන් දකින් නැද්ද? ඔබට ඇහෙන දේ, ඔබට පේන දේ ඔබට දැනෙන දේ හැම තැනම නිවන තියෙනවා. ඔබේ ඔය සිතිවිලිත් සෙන්සර් එකක් විතරයි.** ඔය ඇහෙන ශබ්දය ඔය පේන වර්ණ හැඩතල ඕවා සාමාන්‍ය දැනීම සාමාන්‍ය විදිහට තමයි. මේ පුටුව, මේ ඇඳ, මේ අම්මා තාත්තා, මේ අන්නාසි රස මේක ලුණු රහ, මේක දිවුල් රහ ඔක්කොම තියෙනවා. සාමාන්‍ය විදිහම තමයි. මේ පිච්ච මලේ සුවඳ. දැන් මේ සේරම ගැන හොඳ අවබෝදයක් තියෙනවා. දැන් දන්නවා මේ ඔක්කොම ශබ්ද වර්ණ දාගෙන තියෙන්නෙ කියලා. මෙතන අපේ දෘෂ්ටියයි කුඩු වෙලා යන්නෙ.

සක්කාය දෘෂ්ටියයි. අපි හදාගත්ත ශබ්ද වර්ණවලින් අපි ජීවත් වෙන ලෝකයක් තියෙනවා. අන්න ඒ ලෝකෙ බිඳ වැටෙනවා. විනෙය්‍යය ලෝකේ ඒ ලෝකෙ තියෙන්නෙ අන්නාසි, පිච්ච මල් කපුටො බිත්ති මොනවද ශබ්ද වර්ණවලින් හදාගෙන තියෙන්නෙ. ඒක තමයි මේ ලෝකෙ. ඒක කොහෙද තියෙන්නෙ? කොහෙවත් නෑ. ඔබ ජීවත් වෙන්නෙ අන්න ඒ ලෝකෙ ඇතුළෙ සිත ඇතුළේ. **"චිත්තේන නීයති ලෝකේ"** සිත කොහෙද තියෙන්නෙ. සිත කියල දෙයක් නෑ. මේකෙම ක්‍රියේෂන් එකේ නිරූපනයක් තමයි ඔය දැනෙන එක ලෝකයක් තියෙනවා කියලා ඒක ස්පාක් එකක් **එක ස්පාක් එකක් අර කිරණෙ. ඇහැට ආපු කිරණෙ. දෙවෙනි ස්පාක් එක තමයි පොත බිත්තිය ඒක ඇවිල්ල ස්කන්ධය. මේ ඇවිල්ලා ආයතනය. "ස්කන්ධානානං පාතිභාවො ආයතනානං පටිලාභෝ අයං උච්චති ජාති" ඊළඟ ස්පාක් එක මොකක්ද? ආත්මෙ දෙයක් වගේ දැනෙන මම ඉන්නවා "ඒතං මම - ඒසො හමස්මි - අ මේසෝ අත්තා" ඒක තියෙනව නම් මමත් ඉන්නවා. 'ඒතං මම' 'ඒක නැත්තං මමත් නෑ' 'නේතං මම - නමේසෝ අත්තා'** මේ සත්‍ය දකින කෙනා නිවන් දකිනවා.

හැබැයි මේකෙ ඉස්සරෝම අභිසංකරණය දකින්න මම හැදෙන හැටි දකින්න. දැන් ඊට පස්සෙ මමත් ඉන්නවා. ඒ ඔක්කොම දකින්නෙ මම. අන්න දැන් ආත්ම සංඥාව වෙනයි. මේ ආත්ම දෘෂ්ටිය වෙනයි. අර අන්නාසි, මේස, පුටු, ඇඳන් කියන සිතිවිල්ල වගේම දැන් තව සිතිවිල්ලක් තියෙනවා ආත්ම සිතිවිල්ලක්. දැන් ඔක්කොම තියෙන කෙනෙකුත් ඉන්නවා. මේ සේරම කුඩු වෙන්න තියෙනවා. මේ සේරම කුඩු වෙන්නෙ අර සත්‍ය දකින තැන අර කිරණය දකින තැන. අර රුප්පනය දකින තැනයි. ඔබ නිවන් දකින රූපය පර්ජානාති කිවුවෙ අර රුප්පනය දකින තැනයි. ඔබ නිවන් දකින්නෙ රුප්පනය දකින දවසටයි ඔබ නිවන් දකින්නෙ ස්කන්ධය දැකලයි. ඔබ නිවන් දකින්නෙ ස්කන්ධයේ උදය වැය දැකලයි. ආර්යයන් වහන්සේට ඕන ඔබ දුකින් මිදෙන එක දකින්න විතරයි. ඔබ දුකින් මිදේවි. ඔබ සැනසීමට පත් වේවි. ආර්යයන් වහන්සේ බණ කීවෙ දුකෙන් මිදෙන්න මිසක් වෙන දේකට නෙවෙයි. ඔබට දුකෙන් මිදෙන්න නම් ඔබ ඒ සත්‍යය දැන ගන්න ඕනි. හැබැයි මේ සම්මුතිය තුළ කටයුතු කරන කොට ඕකෙ ඊළඟ පැත්ත බලන්න.

දැන් මේක ගලන හැටිමයි පෙන්නන්නෙ. ඔබ දැන් අභිසංකරණයකට ලක් වෙලා. ඔබ ඇවිදින හැටි ඔබ කොණ්ඩෙ පීරන හැටි, දැන් වැඩ ගොඩයි. කෙනෙක් හැදිලනෙ. මම වචනයක් කිවුවොත් වෙනස් කරන්නෙ නෑ. දැන් ඔබ හරි ශ්‍රේෂ්ඨයි. ඔබ හරි උතුම්. ඔබ ඔබව පුදුමාකාර විදිහට ඔබව තද කරගෙන ඊගෝ එක වැඩි කරගෙන ඝන කරගෙන ආත්ම දෘෂ්ටිය ඝනටම තියෙනවා. ඔබ මොකද කරන්නෙ? ඔබ ඉන්න බව තදින් ගැටගහ ගත්තොත් ඔබ කොහොම නිවන් දකින්නද? ඔක්කොම බිමට දාන්න. සේරම බිමට දාන්න. නිවන් දකින්න නම් ඔබ මේ සේරම බිමට දාන්න. අභිසංකරණයට කොටු වෙන්න එපා අත්හරින්න. සේරම අත් හරින්න. මේ ධර්මය අති උතුම් ධර්මයක්. මේ ධර්මයට ඔබ එන්න. ඒ නිස්සරණට මගට ඔබ එන්න. අතහරින තැනට එන්න. සිතෙන් මිදෙන මග නේද? සිතෙන් හදාගත්ත ලෝකෙන් මිදෙන මග. එහෙම වුණොත් ඔබ දුකෙන් මිදෙනවා. ලෝකෙන් මිදෙන තැන. **"විනෙය්‍ය ලෝකේ - අභිඣ්‍යා දෝමනස්සානං"** ඔබ දුකෙන් මිදෙනවා. එහෙනම් ඔබේ ගින්න නිවෙනවා. ඔබ නිවන් දකිනවා. එහෙනම් ඔක්කොම ඔබ අත හරින්න. මමයා තදින් අල්ල ගන්න එපා. මගේ විදිහ තදින් අල්ල ගන්න එපා. එහෙනම් ඔබ නිස්සරණයට එනවා. 'සිතින් මිදෙන මග', 'දුකින් මිදෙන මග' 'නිවන් දකින මග' එයයි නිස්සරණ මග එතනට එන්න. කවුරුන් හරි මොනව හරි වචනයක් හරි කිව්වොත් හරි ඒ සියල්ලම අත් හරින්න.

**ඔබ මේ මොහොතේ නිවන් අත්දකිනවා. ඔබ මොකක්ද කළ යුත්තේ? අපි ඔබෙන් අහනවා. ඔබ නිවන් දකින්න මොනවද කරන්න ඕනි. ඔබ මේ සේරම දන්නවා කියලා අපි හිතමු. ඔබ මේ සේරම අහගත්තනෙ. දැන් ඊළඟට ඔබ මොකක්ද කරන්න ඕනි. දැන් එදිනෙදා ඔබ බලන්න ඔබව ලොකු කරගෙන තියෙන තැන් ටික. ඔබ තදට වැදිල තියෙන තැන් ටික. මේ මගේ සැටි, මේ මම මෙහෙමයි කියලා. අන්න එතනයි එබ ලිහන්න ඕනි. ඔබ හැම තැනම ඔබ තදින් වැදුණ තැන් ටික ලිහාගන්න. ඔබ එතැන බැස ගත්තා. 'අජ්ජෝසාය තිට්ඨති' අන්න ඒක දකින්න.** බැස ගත්ත තැන යාරූපෙ නන්දි අන්න ඒක දකින්න 'තදුපාදානං භවෝ' කියන තැන ඒ උපාදාන බන්ධන බලයෙන් ඔබ ලිහෙන්න. ඒ උපාදාන වෙලා තියෙන ඔබගේ උපදි ගොඩ අතහැරල දාන්න. 'සබ්භූපති පටිනිස්සග්ග කියන තැනට එන්න. 'විරාගෝ නිරෝධෝ නිබ්බානෝ' ඔබ එතැනට එන්න.

ඔබට මේ ධර්මය ඕනි. ඔබ මේ ධර්මය තුළ සැනසෙන්න. මේ සසර ඕඝයේ නිමාව දකින්න. ඔබට මේ යුගයේ මේ දහම ඇහෙනවා කියන්නෙ පුදුම භාග්‍යවන්තයි. නැත්නම් ඔබට මේ දහම ඇහෙන්නෙ නෑ. ඔබ මේ දහම ගන්න. ලෝකෙට මේ දහම දෙන්න. ඔබට පුළුවන් නිවන් දකින්න.

අපි ඔබට විවිධාකාර පැතිකඩයන් ඔස්සේ විවිධාකාර ස්වරූපයෙන් මේ ධර්මය දේශනා කරනවා. තවත් දෘෂ්ටි ගොඩක් තියෙනවා ලිහන්න. ඔබට දිව්‍ය ලෝකයක් කොහෙන් ද ආවේ. ඔබ හොයල බලන්න. ඔබ කොහෙන්ද ඔය පතනා බෝධියක් හොයාගෙන ඉන්නෙ. ඒක කොහෙ හරි තියෙනවද? ඒක කොහෙවත් නෑ. හැබැයි ඔබ දෘෂ්ටිවල ඉන්නව කියන්නෙ ඔබට කම්පනයක් තියෙනවා. ඒ කම්පනවල සිද්ධවෙන දේවල් ගොඩක් තියෙනවා. ඔබේ මේ ඇස හැදුනොත් කම්පනයෙන්මයි. කණ හැදුනොත් කම්පනයෙන්මයි. ඔබ හැදුණොත් කම්පනයෙන්මයි. ඔබගේ සසර ඕඝෙත් කම්පනයක්මයි. ඔබ ඒක තාම දන්නෙ නෑ. ඒ අභිඥෙඥා දේශනා නැවත අහන්න. ඔබේ ඒ ස්වභාවය ඔබටම දැනෙයි. හැබැයි මෙච්චර දේවල් දේශනා කරන මේ ආර්යයන් වහන්සේගේත් සෑහෙන කාලයක් සම්මුතිය තුළ කටයුතු කරපු පුරුදු තියෙනවා. ආර්යයන් වහන්සේ සමහර වෙලාවට හයියෙන් කතා කරනකොට සමහර වචන කියවෙනවා නේද? ඒ ආර්යයන් වහන්සේට පුරුදු තියෙනවා. කතා කරල පුරුදු වුණු නිතර නිතර කතා කරල පුරුදු වචන නිතර නිතර එන එකක් තියෙනවා. ඒ එන එක ආර්යයන් වහන්සේට අභ්‍යන්තර අවබෝධය නැති කරල නෑ. ඒක හුදෙක් වචන ටිකක් පුරුදු ටිකක් විතරයි. හැබැයි ඒ තුළ ආර්යයන් වහන්සේ කරන දේවල් තියෙනවා නේද? ඒ උනාට ආර්යයන් වහන්සේගෙ අවබෝධය නැති වෙනවද? අවබෝධය නැති වෙන්නෙ නෑ. අවබෝධය තියෙනවා.

අම්මා සෙල්ලම් ගෙයක් හදන්න ආවොත් දරුවත් එක්ක. සෙල්ලම්ගේ හැදුව කියලා අම්මගෙ අවබෝධය නැති වෙනවද? අවබෝධ නැති වෙන්නෙ නෑ බුදුන් වහන්සේ පෝට්ල භික්ෂුවට තුච්ච පෝට්ල කියල හත් වතාවක් කියලා. ජේතවනාරාමෙන් එළියට දානවනෙ. දැන් ඕක දිහා බලාගෙන ඉඳලා කවුරු හරි එහෙම බුදුන් වහන්සේ ගැන අපැහැදෙන්න පුළුවන් අර දෙව්දත් වගේ. මේ බුදුන් වහන්සේ කොච්චර වැරදි ද? තුච්ච

පෝට්ටිල කියල කතා කරන්න හොඳද? පෝට්ටිල භික්ෂුව ජේතවනාරාමෙන් එළියට දැම්මනෙ. කොච්චර වැරදි ද බුදුන් වහන්සේ. කවුරු හරි මේ වගේ කෝණෙකින් මේ වගේ සංඥාවක් ගත්තොත් මොකද කරන්නෙ. එයා බුදුන් වහන්සේ කියන ධර්මය ඊට පස්සෙ ගනීද? එයාගේ නිවන් මග එතකොට වැහෙන්නැද්ද? ඔයා මේ ධර්මය සැක කරන් නැද්ද? මේක ඇත්තටම පුද්ගල කතාවක් නෙවෙයි. අපි ගැනැ අපැහැදීමක් ඇති වුනොත් අපි කරන දේශනා ගන්නෙ නෑ නේද කවුරුත්. ඒක අපරාධයක් නේද? අද බොහෝ අයට ඇයි මේ බුද්ධෝත්පාද කියන්නෙ? මේ බුද්ධ ස්වභාවයටයි අවදි වෙන්නේ. මේ ස්වභාවය තුළ ආත්ම ස්වභාවයක් නෑ. මේ ආත්ම දෘෂ්ටිය බිඳ වැටුණ තැන අනිමිත්ත ශුන්‍යත අප්‍රණීත බුද්ධ ස්වභාවයයි.

අපි කිව්වා.'**නත්ථිමේ සරණං අඤ්ඤං - ධම්මෝමේ සරණං වරං නත්ථිමේ සරණං අඤ්ඤං - බුද්ධෝමේ සරණං වරං**' එහෙනම් මේ ධර්මය දකින කෙනාට දෙයක් නෑ. දෙයක් නැති තැන අන්න එතනයි බුද්ධ ස්වභාවය. එතන ආත්ම සංඥාවක් නෑ. ආත්ම දෘෂ්ටිය නෑ. අපි කියනවා "**බුද්ධං සරණං ගච්චාමි**" එහෙනම් ඒ බුද්ධ ස්වභාවය සරණ යන්නෙ. "**සෝ ධම්මං පස්සති - සෝ මං පස්සති**" ධර්මය දකින්නා බුදුන් දකින්නෙ. එහෙනම් ඔබ ධර්මය දකින්න. දෙයක් නැති බව දකින්න. එහෙනම් මේ ටික ඔක්කොම අවබෝධ වුණොත් විතරයි ඔබට දෙයක් නැති වෙන්නෙ. බිත්තිය නැති වෙනවා නෙවෙයි. අන්නාසි නැති වෙනවා නෙවෙයි. වෙනදා විදිහටම බිත්තියක් තියෙනවා, අන්නාසිත් තියෙනව කණ්ණාඩියේ වගේ. දෙයක් වගේ දැනෙන වටිනාකමයි නැති වෙන්නෙ. එහෙනම් '**නත්ථි මේ සරණං අඤ්ඤං - සංඝෝ මේ සරණං වරං**' එන එන අරමුණෝ දැකලා මිදෙන එකයි. 'සංඝං සරණං ගච්චාමි.' යමෙක් ඒ ප්‍රතිපදාවෙ කටයුතු කරයි නම් ඒ එන එන අරමුණෝ දැක දැක මිදෙනවා නම් ඔහු සංඝ වෙනවා අන්න එතනයි සංඝ හැදෙන්නෙ. අන්න එතකොට සංඝරත්නය කියල කියනවා පුද්ගල භාවයෙන් නම් කිරීමක් එතකොට සිද්ධ වෙනවා. සංඝරත්නය කියන්නෙ මේ 'සමුදය - අත්තග මය' සමුදය කියන්නෙ දෙයක් තියෙනවා, දෙයක් නැති බව දකින තැන අන්න 'අත්තගමංච' කියන තැන, ආදීනව නිස්සරණ කියන අත හැරෙන තැනට එනවා. එතන විඳවන්න පිනවන්න දෙයක් නැති බව ආදීනව

දකිනවා. අන්න එතන සංඝයා ඉන්නවා. සංඝයා කියන්නෙ ඒ මග යන කෙනාටයි. අන්න සංඝං සරණං ගච්ඡාමි. එහෙනම් තෙරුවන් සරණ තියෙන තැනයි තියෙන්නෙ. එහෙනම් මෙතන **'ධම්මං සරණං ගච්ඡාමි' 'නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං' 'නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං' 'නත්ථි මේ සරණං අඤ්ඤං සංඝෝ මේ සරණං වරං'** තෙරුවන් සරණ හැර කිසි සරණ ඔබ කිසිවෙකුට කවදාවත් හමුවෙන්නෙ නෑ වෙන සරණක් නෑ.

අද නමෝ බුද්ධාය. මේ බුද්ධ ධර්මය හිංදු ආගමට මේ අය ගෙනියන්න කරන ක්‍රමයක්. නමෝ.. බුද්ධාය. පුදුමාකාර මායාවක ඔබ අතරමං වෙලා ඉන්නවා. ඔබට නොපෙනෙන ආකාරයකට අභිසංකරණයක් ඔබට සකස් කරලා මේක පුදුම විදිහට ඔබව ගන්න යනවා වෙනින් ආගම්වලට. එහෙනම් අපි සැබෑම ආර්ය භූමිය අඳුනා ගනිමින් **'අරියානං දස්සාවි - අරිය ධම්මේසු කෝවිදෝ - අරිය ධම්මෝ විනයෝ'** කියන විදිහට ඒ තෙරුවන් සරණ යන්න ඕනි. නමෝ... කියන ඕම්කාරය තුළ හින්දු ආගමට නෙවෙයි අපි යන්න ඕනි නමෝ බුද්ධාය නරක නෑ. නමුත් ඔබ පරිස්සම් වෙන්න. ඔබට අපි ඇස් අරින්නට ඕනි නිසා යමක් කිව්වා පමණි. ඒ තුළ යම් පණිවිඩයක් තියෙනවා. ඒක ඔබ දරාගන්න. නමුත් අපිට හමුවන මෙලොව ඇති උතුම්ම රුවන් තුන තෙරුවන්මයි. රුවන් වගේ බුදුන් වහන්සේ පෙන්නුවෙ ඔය තෙරුවන්. ශ්‍රැතවත් ආර්යය ශ්‍රාවකයෙක් පමණයි තෙරුවන් සරණ යන්නෙ. ඔබත් මේ ධර්මය අසයි නම් ඔබත් ඒ කල්‍යාණ මිත්‍රයාගේ පණිවිඩය අහන්න. ඒ කියන්නේ **'දුර්ලභං මනුස්සත්තං - දුර්ලභං සද්ධර්ම ශ්‍රවණං'** කියන එක ඔබ ගාව තියෙනවා. එහෙනම් ශ්‍රැතමය ඥානය ඔබට ඇතිවෙනවා. ඔබ තෙරුවන් සරණ යනවා. එහෙම නේද? එහෙනම් තෙරුවන් සරණ යන සැබෑම ආර්ය ශ්‍රාවකයෙක් බවට පත් වෙනවා.

ඒ වගේම ආත්මයක් නැති අනාත්ම නිවන් මගක් බුදුන් වහන්සේ දේශනා කරනවා. ආත්ම දෘෂ්ටියෙන් ඔබ මිදෙනවා. ඒ අනාත්ම ධර්මය ඔබ අවබෝධ කරනවා. ඒ අවබෝධය තුළ ඔබ ආර්ය භූමිය අඳුනාගන්නවා. **"අරියානං දස්සාවි - අරිය ධම්මේසු කෝවිදෝ අරිය ධම්මෝ විනයෝ"**

ඒ තුළ ඔබ "**සත්පුරුෂානං දස්සාවි - සත්පුරුෂ ධම්මේසු කෝවිදෝ සත්පුරුෂ ධම්මෝ විනයෝ කියන තැන ආර්ය විනයට එනවා. ආර්ය විනය නම් මෙලොව කිසිම දෙයක් නොමැති බවයි. මේ තමන්ගෙම සිතමයි. සිත කියල දෙයකුත් නෑ. අන්න ආත්ම දෘෂ්ටියෙන් මිදුන තැන ඔබ නියත සම්බෝධි පරායනයි. ඒකාන්තයෙන්ම ඔබ සුගති පරායනයි.** කිසිදා දුගතියකට වැටෙන්නෙ නෑ. ඔබට මෙය වැටහේ නම් ඉතාම භාග්‍යයක්. ආර්යයන් වහන්සේට හැමෝම සහයෝගය දෙන්න. ආර්යයන් වහන්සේ පුද්ගල භාවයෙන් ගන්න එපා. ආර්යයන් වහන්සේ සත්‍ය ධර්මය ලෝකෙට දායාද කරන්න කටයුතු කරනවා. ආර්යයන් වහන්සේ කරුණාවෙන් ලෝකයට ම කරන ඉල්ලීමයි මේ සත්‍ය ධර්මය ලෝකෙටම දායාද කරන්න. හොඳමයි හැමෝටම තෙරුවන් සරණයි!

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ආරණ්‍ය සේනාසන කටයුතු වෙනුවෙන් දායක වමට දැන් ඔබටත් අවස්ථාව උදා වී ඇත.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 100800597511

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

කුසට අහරක් හිතට සරණක් යන තේමාව යටතේ අසරණයින්ට පිහිට වීම උදෙසා මෙම සත්කාරය දියත් කර ඇත. ඒ වෙනුවෙන් ඔබටත් දායක විය හැක.

මෙත්මල් අරණ සමාජ සේවා පදනම

ගිණුම් අංක : 100800598542

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

**බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.**

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend, volume 1
11. The true dhamma has awakend, volume 2
12. The true dhamma has awakend, volume 3
13. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
14. ආර්ය කමටහන්
15. ලොවම දෙදරයි
16. සූත්‍ර දේශනා 01
17. සූත්‍ර දේශනා 02
18. සූත්‍ර දේශනා 03
19. මේ ගෞතම බුද්ධ සාසනයේ නැවත පිබිදීමයි
20. බුද්ධ ඥාණය අචින්ත්‍යයි
21. නොපෙනෙන සත්‍යය